2022 ජූලි • 244 කලාපය

# රණවිරුවා



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.

# යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානය නව සෙවණකට

කොස්ගම, සාලාව පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය නව සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, එහි නවතමයෙන් ඉදිකරන ලද පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය ඉකුත් ජූලි 23 වන දින පැවති අභිමානවත් උත්සවයකදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් විවෘත කෙරිණ.



ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ගෞරවණීය ඇරයුමෙන් එම අවස්ථාවට එක්වූ යුද්ධ හමුදාධිපති වෙත හමුදා සම්ප්‍රදායානුකූල ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස් හා වර්ණ ධජයන්ගෙන් සැදුම්ලත් අභිමානවත් සරඹ පෙළපාලියකින් බුහුමන් පුදනු ලැබීය.



අනතුරුව, මහා සංඝරත්නයේ "සෙත් පිරිත්" සජ්ඣායනා සහ අනෙකුත් ආගමික පූජකවරුන්ගේ ආශිර්වාද මධ්‍යයේ සුබ මොහොතින් නව පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය විවෘත කරන ලදී. එහිදී, යුද්ධ හමුදාධිපති කඳවුරු පරිශ්‍රයේ නිරීක්ෂණ චාරිකාවකටද එක්වෙමින් නවීන පහසුකම්වලින් සමන්විත එම ගොඩනැගිලි සංකීර්ණයේ සියලුම ස්ථාන පිළිබඳ සොයාබැලීය. එසේම, එම ව්‍යාපෘතිය කඩිනමින් නිමකිරීම සම්බන්ධයෙන් එහි සේනාවිධායක සහ සියලු නිලයන් වෙත යුද්ධ හමුදාධිපති සිය ප්‍රසංශාවද පුදකළේය.



යුද්ධ හමුදා හටකාර්ය සම්පාදන අණසක මූලස්ථාන පරිශ්‍රයේ පවත්වාගෙන යමින් තිබූ යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය, යුද්ධ හමුදාවේ "ඉදිරි උපාය මාර්ග සැලැස්ම 2020 - 2025" ට සමගාමීව රුපියල් මිලියන 75 ක් පමණ මුදලක් වැය කර මෙම නව පරිශ්‍රයේ නවතමයෙන් ඉදිකර මෙලෙස විවෘත කරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු සේවා බලකාය සහ අනෙකුත් සියලුම යුද්ධ හමුදාවේ ආධාරක රෙජිමේන්තුවල හටපිරිස් මෙහි ඉදිකිරීම් සඳහා දායක වූහ. තවද, උසස් වාස්තු විද්‍යාත්මක සැලසුමකින් යුතුව සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිවිල් උපදේශකයින් සහ ප්‍රවීණයන් සමඟ සාකච්ඡා කොට මෙම අංග සම්පූර්ණ පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය ඉදිකරන ලදී. මෙම උත්සව අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ද එක්වූහ.





# නවීකරණය කරනු ලැබූ කායවර්ධන මධ්‍යස්ථානය විවෘත කෙරේ

යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේ ස්ථාපිතකර තිබූ නවීකරණය කරන ලද කායවර්ධන මධ්‍යස්ථානය යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි 01 වන  දින යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ භාවිතය සඳහා විවෘත කරන ලදී.



මෙම කායවර්ධන මධ්‍යස්ථානය තුළ නිලධාරීන්ගේ ශරීර සෞඛ්‍ය යහපත් ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරන නවීන ක්‍රීඩා උපකරණවලින් (Training Benches, Dumbell Sets, Treadmills, Barbell Sets, Ellipticals, Rowing machines) සමන්විත වන අතර, ඒවායින් නිවැරදි ලෙස ව්‍යායාම කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය උපදෙස් මනා පුහුණුව ලත් යුද්ධ හමුදා ශාරීරික පුහුණු උපදේශකයින් විසින් ලබාදෙනු ලබයි. නවීකරණය කරන ලද මෙම කායවර්ධන මධ්‍යස්ථානය නවීන ප්‍රමිතීන්ට අනුව නිර්මාණය කර ඇත.



මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ඇතුළු නිලධාරීන් පිරිසක්ද එක්වූහ.

# යුද්ධ හමුදාධිපති ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සංචාරයක

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගිය ජූලි 02 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයෙහි ස්ථාපිත ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සංචාරයක නිරත විය. එහිදී, එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත 14 වන සහ 61 වන සේනාංකයන්හි සහ අනෙකුත් යුද්ධ හමුදා අංග ආයතනයන්හි රාජකාරියෙහි නියුතු දහසකට අධික හටපිරිසක් ද අමතන ලදී.

මෙම දේශනයේදී යුද්ධ හමුදාධිපති විසින්, යුද්ධ හමුදාවේ ඉදිරි දැක්ම පිළිබඳ පැහැදිලි කරන ලද අතර, වර්තමානයේ රටේ පවතින අර්බුධකාරී තත්ත්වයන් සහ නොසන්සුන්කාරී සමාජ වාතාවරණය පිළිබඳවත් කරුණු ඉදිරිපත් කරන ලදී. එහිදී, යුද්ධ හමුදාවේ කාර්යභාරය, රටෙහි වත්මන් ආරක්‍ෂක කටයුතු, පොලිසිය සහ අනෙකුත් ආරක්‍ෂක අංශ සමඟ සබඳතා පවත්වා ගැනීම ආදී කාලීන වූ කරුණු මෙන්ම සිවිල් සහ හමුදා සහයෝගීතාව, තීරණ ගැනීම, ප්‍රායෝගික ප්‍රවේශයන් සහ ඊට අදාළ විසඳුම් ලබාගැනීම පිළිබඳවද අවධානය යොමු කරන ලදී. මෙම අවස්ථාව සඳහා 14 සහ 61 වන සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ ස්ථාපිත බලසේනාවන්හි බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීන් සහ සියලුම රෙජිමේන්තු මධ්‍යස්ථානයන් නියෝජනය කරමින් හටපිරිස් සහභාගී වූහ.












# වත්මන් තත්වයට මුහුණදීමේදී යුද්ධ හමුදාවේ වගකීම අවධාරණය කෙරේ






යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු සියලුම හටපිරිස්වලට මෙරට තුළ පවතින වත්මන් ගැටලුකාරී තත්ත්වයට මුහුණදීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සහ මහජන සම්බන්ධතා ශක්තිමත් කිරීම වෙනුවෙන් මේ මොහොතේ ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීමේ දේශනයක් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් ඉකුත් ජූලි 01 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකරන ලදී.

මෙම දේශනයේදී යුද්ධ හමුදාපතිතුමන් විසින් කරුණු පැහැදිලි කරමින් යුද්ධ හමුදාවේ කාර්යභාරය, රටෙහි වත්මන් ආරක්ෂක කටයුතු, පොලිසිය සහ අනෙකුත් ආරක්ෂක අංශ සමග සබඳතා පවත්වා ගැනීම, සිවිල්-හමුදා සහයෝගීතාව, තීරණ ගැනීම, ප්‍රායෝගික ප්‍රවේශයන් සහ ඊට අදාල විසඳුම් ලබාගැනීම පිළිබඳව අවධානය යොමු කරන ලදී. තවද රටෙහි පවතින අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත්ව සිටින සිවිල් වැසියන්ට සහය වීම, ඔවුන් සමග සුහදව කටයුතු කරන ආකාරය, මහජනතාවගේ හැඟීම් පිළිබඳ අවබෝධාත්මකව කටයුතු කිරීම, යුද්ධ හමුදාවේ ගෞරවය සහ විනය පවත්වා ගැනීම මෙන්ම සෑම තරාතිරමකම රාජ්‍යතාන්ත්‍රික සබඳතාවයන් සුහදශීලී ලෙස පවත්වාගෙන යාම යනාදී කරුණු පිළිබඳව යුද්ධ හමුදා සාමාජිකයන් දැනුවත් කරන ලදී. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, මාණ්ඩලික නිලධාරීන්, යුද්ධ හමුදා මූලස්ථානයේ අධ්‍යක්ෂක මණ්ඩලවල අධ්‍යක්ෂවරුන්, නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# යුද්ධ හමුදාධිපති 53 සහ 58 වන සේනාංක හටපිරිස් අමතයි






යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් යුද්ධ හමුදා මූලස්ථානයේදී ඉකුත් ජූලි 06 වන දින 1 වන බලකා මූලස්ථානය යටතේ ස්ථාපිත 53 සහ 58 වන සේනාංක යටතේ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් පිරිසක් ඇමතුවේය. මෙම දේශනයේදී, යුද්ධ හමුදාධිපති විසින් රටෙහි වත්මන් තත්ත්වය සහ පැමිණිය හැකි අභියෝගවලට යුද්ධ හමුදා හටපිරිස් ලෙස ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය පිළිබඳ පැහැදිලි කළේය. මෙම අවස්ථාව සඳහා 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ද එක්ව සිටියහ.

# ඇසළ පෙරහැර ආලෝකමත් කිරීමට "කොප්පරා" පූජාව මෙවරත්









ඉපැරණි සම්ප්‍රදායන් අනුව මහනුවර ශ්‍රී දළදා මාලිගාව මගින් වාර්ෂිකව පවත්වන ඇසළ පෙරහැර මංගල්‍යයේදී එම පෙරහැර වීදි සංචාරය කරන මාර්ග ආලෝකමත් කිරීම සඳහා ශ්‍රී දළදා මාලිගාව වෙත යුද්ධ හමුදාව විසින් අඛණ්ඩව 9 වන වරටත් කොප්පරා පොත් 15 ක් පූජා කරනු ලැබීය.

කුරුණෑගල, බෝයගනේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා විජයබාහු පාබල රෙජිමේන්තුවේ හටපිරිස් විසින් පුරාණ ආගමික චාරිත්‍රවලට සම්ප්‍රදායන්ට අනුකූලව සෑම වසරක් පාසාම ඇසළ පෙරහැර වෙනුවෙන් එලෙස කොප්පරා පූජා කරනු ලබති. ඒ අනුව සම්පූර්ණ දළදා පෙරහැරේ ආලෝකමත් කිරීම සඳහා පෙරහැරේ පන්දම් රැගෙන යන්නන්ට නොකඩවා කොප්පරා සම්පාදනය කරන ලදී.

අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සහ විජයබාහු පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් නිශාන්ත මානගේ විසින් කරන ලද ආරාධනයකට අනුව එම අවස්ථාවට සපැමිණි යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ සහභාගීත්වයෙන් ආගමික වතාවත් සහ සම්ප්‍රදායික තේවා චාරිත්‍රවලින් අනතුරුව, එම කොප්පරා බහාලුමක් ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේතුමන් වෙත සංකේතාත්මකව පිරිනැමීය.

# ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක යුද්ධ හමුදාධිපති හමුවේ



ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් අමල් කරුණාසේකර (විශ්‍රාමික) ඉකුත් ජූලි 01 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයක නිරත වෙමින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත සිය සුබපැතුම් එක්කරන ලදී. ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ රාජ්‍ය සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ උපාය මාර්ගික චින්තනය ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛතම අරමුණින් යුතුව මෑතකදී ස්ථාපිත කරන ලද එම විද්‍යාලයේ ප්‍රගතිය සහ එමගින් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය නිලධාරීන්ට පරිපූර්ණ දැනුමක් ලබාදෙන ආකාරය පිළිබඳව සේනාවිධායක විසින් යුද්ධ හමුදාධිපති දැනුවත් කළේය.

එහිදී, විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව සිය ප්‍රසංශාව පලකළ යුද්ධ හමුදාධිපති ජාතික ආරක්ෂක විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් ලබාදිය හැකි සෑම සහයෝගයක්ම ලබාදෙන බවද පැවසීය. එහිදී, සුහද හමුව අවසානයේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක වෙත යුද්ධ හමුදාධිපති විසින් සමරු තිළිණයක් ද ප්‍රදානය කරන ලදී.

# සුහද හමුවීම්වල මතක සටහන්



ශ්‍රී ලංකාවේ සිටින පකිස්ථාන ඉස්ලාමීය ජනරජයේ මහ කොමසාරිස් අතිගරු මේජර් ජෙනරාල් උමාර් ෆාරූක් බුර්කි, හිලාල්-අයි-ඉම්ටියාස් (Umar Farooq Burki, Hilal-i-Imtiaz) (විශ්‍රාමික) ඉකුත් ජූලි 07 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය.

මෙම සුහද හමුවේදී, දෙරට අතර වසර ගණනාවක් පුරාවට පවතින ද්විපාර්ශ්වික සබඳතා, දෙරටෙහි සන්නද්ධ හමුදාවන් ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් මෙන්ම ද්විපාර්ශ්වික වැදගත්කමකින් යුත් තවත් කරුණු රැසක් සාකච්ඡාවට බඳුන් විය. මෙම සුහද හමුව සමාප්තියේ දෙදෙනා අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදුකෙරිණි.

---

කොළඹ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් ඉයන් කායි (Captain Ian Cai) පසුගිය ජූලි 04 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයක නිරත වෙමින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවී සුහද සාකච්ඡාවක නිරත විය.

මෙම හමුවේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ ඕස්ට්‍රේලියානු සන්නද්ධ හමුදා සාමාජිකයින් අතර පවතින ආරක්ෂක සහයෝගීතාවයට අදාළ පොදු කරුණු පිළිබඳව සාකච්ඡා කෙරිණ. යුද්ධ හමුදාධිපති, ඕස්ට්‍රේලියානු හමුදාවෙන් ලබාදෙන සහයෝගය සහ හමුදා පුහුණු ක්ෂේත්‍රය සඳහා ලබාදෙන සහයෝගිතාවය වෙනුවෙන් කපිතාන් ඉයන් කායි (Captain Ian Cai) වෙත එහිදී සිය ස්තුතිය පුද කළේය. මෙම සුහද හමුව අවසානයේ දෙරට අතර පවතින සුහදතාවය සංකේතවත් කරමින් දෙදෙනා අතර විශේෂ සමරු තිළිණ හුවමාරුවක්ද සිදුකෙරිණ.



---



කොළඹ පිහිටි ශ්‍රී ලංකාවේ ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක ලෙස රාජකාරී භාරගත් එක්සත් ජනපද යුද්ධ හමුදාවේ ලුතිනන් කර්නල් ඇන්තනි සී. නෙල්සන් (Anthony C. Nelson) ඉකුත් ජූලි 27 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය.

ඔවුන් අතර වූ මෙම සුහද හමුවේදී, දෙරටෙහි සන්නද්ධ හමුදාවන් අතර පවතින සුහදත්වය, සහයෝගීතාවය හා අවබෝධය පිළිබඳ සිහිපත් කරන ලදී. එමෙන්ම, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා එක්සත් ජනපද සන්නද්ධ හමුදාවන් වෙතින් සිදුකරනු ලබන පුහුණු වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කිරීමේ හැකියාව මෙන්ම අනෙකුත් හුවමාරු වැඩසටහන් ඇතුළු කරුණු කිහිපයක් පිළිබඳව ද මෙහිදී සාකච්ඡාවට බඳුන්විය. මෙම හමුව සමාප්තියේ දෙදෙනා අතර සමරු තිළිණ හුවමාරුවක්ද සිදුවිය.



# "Seva Vanitha Budget Centre" විවෘත කෙරේ




මැනිංටවුන්හි හමුදා විවාහක නිවාස සංකීර්ණයේ ඉදිකර තිබූ සුබසාධක වෙළඳසැල හා බේකරිය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල නව සුබසාධක වෙළඳ සංකීර්ණයක් ලෙස නවීකරණය කොට "Seva Vanitha Budget Centre" නමින් පසුගිය ජූලි 28 වන දින විවෘත කෙරිණ.

යුද්ධ හමුදා නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සුබසාධනය ඉහළ නැංවීමේ අරමුණින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ගේ අධීක්ෂණයෙන් යුතුව ඉංජිනේරු සේවා හටපිරිස්වල ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ මෙම වෙළඳ සංකීරණය විවෘත කිරීමේ අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සමගින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ද එක්වූහ.



මෙම "Seva Vanitha Budget Centre" සුබසාධක වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා රුපියල් 28,922,494.35 ක යුද්ධ හමුදා ප්‍රතිපාදන වැයකොට ඇත. එහි නවීන පන්නයේ සුපිරි වෙළඳසැලක්, නවීන අංගෝපාංගවලින් සමන්විත බේකරියක්, අවන්හලක්, පලතුරු බීම අලෙවිසැලක්, නවීන පන්නයේ කාන්තා කොණ්ඩා සැකසුම්/රූපලාවන්‍යාගාරයක්, පිරිමි කරණවෑම්හලක්, කාන්තා/පිරිමි මැහුම්හලක් හා විවාහක නිවාස සංකීර්ණයේ පහසුකම් ලබන නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ප්‍රිය සම්භාෂණ සහ සුහද හමු වෙනුවෙන් ඉදිකරන ලද උත්සව ශාලාවකින්ද සමන්විත වේ.



එම විවෘත කිරීමේ අවස්ථාවට එක්වූ යුද්ධ හමුදාධිපති එහිදී සුබසාධක වෙළඳසැල් සංකීර්ණයේ ඉදිකිරීම් සිදුකරන ලද ඉංජිනේරු සේවා හටපිරිස්හි සේවය අගයමින් ඔවුන් සමග සුහද කතාබහකද නිරත විය.

# කෙළිබිම දිනන විරු දිරි හරඹ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා ක්‍රීඩා උළෙල, 23 වන අන්තර් රෙජිමේන්තු යුද්ධ හමුදා පැරා මලල ක්‍රීඩා ශූරතාවලිය සහ අන්තර් රෙජිමේන්තු ආධුනික ක්‍රීඩා උළෙල දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී ඉකුත් ජූලි 27 වන දින උත්සවාකාරයෙන් ආරම්භ විය. යුද්ධ හමුදා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් සිය ගණනකගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන මෙම ක්‍රීඩා උළෙලේ සමාරම්භක උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.

මෙම උත්සව අවස්ථාව සඳහා එක් වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක, යුද්ධ හමුදා මලල ක්‍රීඩා කමිටුවේ සභාපති, යුද්ධ හමුදා පැරා මලල ක්‍රීඩා කමිටුවේ සභාපති සහ "ස්කයි ඩයිවින්" කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ "සෙනෙහස" අධ්‍යාපනික හා තොරතුරු මධ්‍යස්ථානයේ සේනාවිධායක, යුද්ධ හමුදා පැරා මලල ක්‍රීඩා කමිටුවේ උප සභාපති සහ යුද්ධ හමුදා අත්පන්දු කමිටුවේ සභාපති බ්‍රිගේඩියර් එම්ඒආර් ගුණසේකර ආර්එස්පී සමඟින් එක් වූ ආබාධිත යුද්ධ හමුදා සාමාජිකයින් කිහිපදෙනකු විසින් උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා උණුසුම් අයුරින් පිළිගැනීමට එක්වූහ. තරගාවලින් තුනම නියෝජනය කරමින්, යුද්ධ හමුදා පැරා මලල ක්‍රීඩා කමිටුවේ උප සභාපති සහ යුද්ධ හමුදා අත්පන්දු කමිටුවේ සභාපති බ්‍රිගේඩියර් එම්ඒආර් ගුණසේකර ආර්එස්පී විසින් එහිදී පිළිගැනීමේ කථාව සිදුකරන ලදී.

මෙම ක්‍රීඩා තරගාවලි දෙස් විදෙස් කෙළිබිම දිදුලන ක්‍රීඩා තරු බිහිකරන තෝතැන්නක් බඳුය. ඒ හරහා එදා මෙදා තුර රටට දායාද කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිනාදී ඇති පදක්කම් සංඛ්‍යාව අතිමහත්ය. රණකාමී යුද්ධ හමුදාවේ ජව බල සපිරි ක්‍රීඩාශීලීත්වය විදහා දැක්වෙන වසරේ දැවැන්තම ක්‍රීඩා සැණකෙළිය වන්නේ ද මෙයයි.










# මව් විදුහලෙන් බුහුමන් ලැබූ වගයි

ශාන්ත ඇලෝසියස් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් දශක තුනකට අධික කාලයක් සිය හමුදා දිවිය පුරාවට මාතෘභූමිය ආරක්ෂා කිරීම වෙනුවෙන් සිදුකළ අප්‍රමාණ කැපකිරීම වෙනුවෙන් උපහාර පුදකිරීමේ උත්සවයක් ඉකුත් ජූලි 01 වන දින පැවැත්විණි. මෙම උත්සවය ගාල්ල ශාන්ත ඇලෝසියස් විද්‍යාලයේ ආදිශිෂ්‍ය සංගමය, එම විද්‍යාලයේ කොළඹ ආදිශිෂ්‍ය සංගමයේ ශාඛාව, විදුහල්පති, හිටපු විදුහල්පති සහ ගුරුභවතුන් විසින් සංවිධානය කරනු ලැබූහ.



# ඓතිහාසික පරිශ්‍රයේ අභිමන් සෙවණට දොරටු විවර කෙරේ






කොස්ගම පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ මූලස්ථාන ගොඩනැගිල්ලෙහි නව පිවිසුම් දොරටුව ඉකුත් ජූලි 21 වන දින උදෑසන පැවති චාම් උත්සවයකදී විවෘත කෙරිණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ආරාධනාවට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.

මෙම උත්සව අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා හට්කාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී, ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු නිලධාරී මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ නිලධාරීන් පිරිසක් ද එක්වූහ. ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ භටපිරිස් සහ 10 වන ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස් විසින් තම තාක්ෂණික දැනුම භාවිතා කරමින් මෙම ප්‍රෞඪත්වය හා විචිත්‍රත්වය විදහා දැක්වෙන නව පිවිසුම් දොරටුව ඉදිකර ඇත.

# යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ ඉදිකළ නව මුරහල විවෘත කෙරේ



දඹුලුහල්මිල්ලෑව ප්‍රදේශයේ පිහිටි යාන්ත්‍රික පාබල රෙජිමේන්තු මූලස්ථානයේ ප්‍රධාන දොරටුව අභියස අභිනවයෙන් ඉදිකරනු ලැබූ නව මුරහල ඉකුත් ජූලි 30 වන දින යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති සහ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් විවෘත කෙරිණි. එම රෙජිමේන්තුවේ භටපිරිස්හි ඉංජිනේරු දැනුම සහ තාක්ෂණික හැකියාවන් භාවිතා කරමින් ඉදිකර ඇති මෙම නව මුරහල සඳහා එම රෙජිමේන්තු අරමුදලින් වැය දරා ඇත.

# නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී යුධෝපකරණ කර්මාන්ත ශාලාවේ සංචාරයක



යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සිය ධුරයේ රාජකාරි භාරගැනීමෙන් පසු ඉකුත් ජූලි 06 වන දින දොඹගොඩ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ කර්මාන්ත ශාලාවේ ප්‍රථම නිල සංචාරයේ නිරත විය. එහිදී, එම කර්මාන්ත ශාලාව තුළ සිදුකරනු ලබන ටයර් නැවත පිරවීමේ කටයුතු සහ අනෙකුත් කාර්මික කටයුතු පිළිබඳ ඔහුගේ නිරීක්ෂණයට බඳුන් විය. තවද, එහි සේවය කරනු ලබන භටපිරිස් වෙත සිය ප්‍රශංසාව එක්කළ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී එම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතුවල ප්‍රමිතීන් ඉහළ නැංවීමේ අවශ්‍යතාවය පිළිබඳවද එහිදී අවධාරණය කළේය. මෙම අවස්ථාවට යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඉන්ද්‍රජිත් විතානාච්චි සමඟ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් අජිත් මුණසිංහ ද එක්වූහ.

# පාපැදි සහ වියළි සලාක පරිත්‍යාගයක්





පාසල් ළමුන් සඳහා රුපියල් 500,000.00 ක වටිනාකමකින් යුත් පාපැදි 22 ක් සහ අඩු ආදායම්ලාභී පවුල් 50 ක් සඳහා රුපියල් 5000.000 බැගින් වටිනාකමකින් යුත් වියළි සලාක මළු පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 26 වන දින චාවකච්චේරි සංස්කෘතික මධ්‍යස්ථානයේදී පැවැත්විණ. 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ සම්බන්ධීකරණයෙන් 523 වන පාබල බලසේනාවේ සංවිධාන ශක්තියෙන් මෙම කටයුත්ත සිදුවිය.

මෙම සත්කාරය සඳහා පූර්ණ මූල්‍ය දායකත්වය කැනඩාවේ පදිංචි රජීකරන් සන්මුගරත්නම් මහතා විසින් ලබාදෙන ලදී. මෙම අවස්ථාවට 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේවීඑස්ජ් ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සමගින් රාජ්‍ය නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# යාපනය ආඥාපති නිරීක්ෂණ සංචාරයක





ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පසුගිය ජූලි 8, 9 සහ 11 යන දිනයන්හිදී 51, 52 සහ 55 යන පාබල සේනාංකයන්හි සංචාරය කරන ලදී. එහිදී, එම බලප්‍රදේශයට අයත් සියලුම සේනාංක, බලසේනා, ඒකක හා පුහුණු පාසල්වල රාජකාරී නියුතු භටපිරිස් අමතමින් බලප්‍රදේශය තුළ ආරක්ෂාව තරකිරීම, වර්තමානයේ හමුදා සෙබලකුගේ රාජකාරී ස්වභාවය, යුද්ධ හමුදා විනය හා පුද්ගලික ජීවිතය සමබරව පවත්වාගෙන යාම ආදී කරුණු පිළිබඳ දැනුවත් කරන ලදී. මෙම සංචාරයට සමගාමීව බලසේනා, ඒකක හා බලඇණි පුහුණු පාසල් නිරීක්ෂණයටද ආඥාපති එක්විය. එම අවස්ථාව සඳහා සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීවරු ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.

# වන්නි ආඥාපති සේනාංක සංචාරයක





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පසුගිය ජුනි 30 සහ ජුලි 01, 02 යන දිනයන්හිදී 21, 54, 56 වන පාබල සේනාංකවල සංචාරයක නිරත විය.

ආඥාපති විසින් එහිදී එම සේනාංක යටතේ රාජකාරි කරනු ලබන නිලධාරීන් හා සෙසුනිලයින් අමතන ලද අතර රටේ පවතින වත්මන් තත්වය, යුද්ධ හමුදා සාමාජිකයින්ගේ වගකීම, විනය ආරක්ෂා කිරීම, යුද්ධ හමුදාවේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා වගකීමෙන් යුතුව කටයුතු කිරීම, යුද්ධ හමුදා ජීවිතය සහ පුද්ගලික ජීවිතය සමතුලිතව පවත්වාගෙන යාම, දැනට ක්‍රියාත්මක කෘෂිකර්ම වැඩසටහන් සාර්ථක කරගැනීම ආදී කරුණු පිළිබඳ අවධාරණය කළේය.



අනතුරුව මඩු දේවස්ථානය, වෙඩිතලතිව්, ඉලුප්පෙයික්කඩවායි සහ වන්කාලායිහි ද සංචාරය කළ හෙතෙම එහි ආරක්ෂක විධිවිධාන නිරීක්ෂණය කළේය. මෙම අවස්ථාව සඳහා 21, 54 සහ 56 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීවරු මෙන්ම තවත් නිලධාරීන් සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# පූජා සත්කාරයන්ට උරදෙමින්

රට තුළ පවතින ඉන්ධන හිඟතාවය වෙනුවෙන් පුනැව ඉන්ධන පිරවුම්හලෙහි දින ගණන් ඉන්ධන ලබාගැනීම සඳහා පෝලිම්වල රැඳී සිටින සිවිල් වැසියන් සඳහා දිවා ආහාර පාර්සල් 500 ක් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජුලි 07 වන දින වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයෙහි නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරිණි. වන්නි ආරක්ෂක සේනා ආඥාපති ගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ මෙම මාහැඟි සත්කාරය සිදුකෙරිණි.





16 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහ 17(සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ සහභාගීත්වයෙන් කනගරායන්කුලම් ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි සලාක සහ පිසූ ආහාර පාර්සල් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජුලි 09 වන දින පැවැත්විණ. 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මගපෙන්වීම මත 561 වන පාබල බලසේනා බලසේනාධිපති බ්‍රිගේඩියර් ජීපීපී කුලතිලක ගේ අධීක්ෂණය යටතේ පවුල් 30 ක් සඳහා රුපියල් 8000.00 ක් වටිනා වියළි සලාක පාර්සල් සහ දිවා ආහාර පාර්සල් බෙදාදුන් අතර, ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය 561 වන පාබල බලසේනාවේ හටපිරිස් විසින් ලබාදෙනු ලැබූහ.

# දිළිඳු පවුල් වෙත නව නිවාස පරිත්‍යාගයක්





කන්තලේ ප්‍රදේශයේ නිවාස නොමැති පුද්ගලයින් සඳහා යුද්ධ හමුදාව විසින් ඉදිකරන ලද නිවාස දෙකක් පසුගිය ජූනි 08 වන දින ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් භාරදෙන ලදී.

සුහදතාවය සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රජා ව්‍යාපෘති ලෙස 5 (සේවා) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් බීපීසී වන්නිආරච්චි ආර්එස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ එම ඒකක භටපිරිස් විසින් නිමකරන ලද එහි පළමු නිවස ජී. තක්ෂිලා සුභාෂිණි මහත්මියටද දෙවන නිවස ඩබ්ලිව්. එම්. නිලූකා ප්‍රියංගනී මහත්මියටද භාරදෙන ලදී. නිවාස ඉදිකිරීම් සඳහා මූල්‍ය දායකත්වය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ලබා දී තිබූ අතර, ප්‍රතිලාභීන් වෙත ගෘහ උපකරණ තොගයක්ද 5 (සේවා) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ භටපිරිස් විසින් ප්‍රදානය කරනු ලැබූහ.

මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා ආඥාපති (නැගෙනහිර), 22 පාබල සේනාංකයේ සේනාංකාධිපති, 222 වන බලසේනාවේ බලසේනාධිපති, එම බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී, 5(සේවා) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවෙහි අණදෙන නිලධාරී සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කළමනාකාරතුමා ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# සංචාරයක මතක සටහන්





ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ එම තනතුරේ රාජකාරි භාරගැනීමෙන් අනතුරුව ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) සහ ඒ යටතේ ඇති 3 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව, 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, 3 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය සහ යුද්ධ හමුදා රෝහල (මින්නේරිය) හි සංචාරයක් සිදුකරනු ලැබීය. මෙහිදී එම ඒකකවල නිලධාරීන් සහ සෙසුනිලයින් ඇමතූ ආඥාපති ජාතික ආරක්ෂාව ඉටුකිරීමේදී භටපිරිස්වලට මුහුණ පෑමට සිදුවන අභියෝග සහ එහිදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව සිහිපත් කරන ලදී.



# පාසල් උපකරණ බෙදාදීමක්





532 වන බලසේනාවේ මූලිකත්වයෙන් දෙහිඅත්තකණ්ඩිය මාවතගම මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන අඩු ආදායම්ලාභී පවුල්වල සිසු සිසුවියන් 315 දෙනකු වෙත පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූනි 16 වන දින ක්‍රියාත්මක කරන ලදී. 532 වන බලසේනාවේ බලසේනාධිපතිගේ ඉල්ලීමකට අනුව "යුතුකම" පුණ්‍යායතනය ඇතුළු තවත් දානපතියන් කිහිපදෙනකු ගේ අනුග්‍රහකත්වයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ මෙම වැඩසටහන යටතේ සෑම සිසු සිසුවියකුටම රුපියල් 1,500.00 ක වටිනාකමකින් යුත් කට්වල බෙදාදෙන ලදී. "යුතුකම" පුණ්‍යායතනය ඇතුළු අනෙකුත් දානපතියන් විසින් මෙම පරිත්‍යාග වැඩසටහන සඳහා රුපියල් 472,500.00 ක මුදලක් වැය කරන ලදී.

මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී සහභාගී විය. 532 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, සිසු සිසුවියන් මෙන්ම දෙහිඅත්තකණ්ඩිය මාවතගම මහා විද්‍යාලයේ විදුහල්පති සහ ගුරු භවතුන් ඇතුළු පිරිසක් ද මෙම අවස්ථාවට එක්වූහ.

# යුද්ධ හමුදා හරිත කෘෂිකර්ම හා ආහාර සුරක්ෂිතා වැඩසටහන



ශ්‍රී ලංකා හරිත වගා සංග්‍රාමය යටතේ යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් පරිදි 1 වන බලකායේ බලකාධිපති ගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම බලකායේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් ගේ සහභාගීත්වයෙන් මුංඇට වගා කිරීමේ ව්‍යාපෘතියක් ඉකුත් ජූලි 06 වන දින එම බලකා මූලස්ථානයේදී ආරම්භ කරන ලදී.

මෙහිදී, මූලික වශයෙන් අක්කර 8 ක භූමි ප්‍රදේශයක් ආවරණය වන පරිදි අමු මිරිස්, බටු, බණ්ඩක්කා, කෙසෙල් සහ වට්ටක්කා වැනි බෝග වර්ග වගාකර ඇති අතර, 1 වන බලකාය විසින් දැනටමත් වගාකර ඇති අක්කර 23 ක අඹ වගාවට අමතරව වෙනත් ප්‍රභේද එකතු කරමින් ඉදිරියේදී තවත් අක්කර 20 ක් ව්‍යාප්ත කිරීමට කටයුතු සිදුකර ඇත. ඒ අනුව යුද්ධ හමුදා සාමාජිකයින් හට සහ සිවිල් ප්‍රජාවට සාධාරණ මිලකට එළවළු සහ පළතුරු ලබාදෙමින් රජයේ වගා යාන්ත්‍රණයට සහායක් වීම මෙම වගා ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය. මෙම අවස්ථාවට 1 වන බලකායේ බලාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී ඇතුළු එම බලකායේ නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.



# දිළිඳු පවුල් වෙත සහන සලසමින්





රටේ පවතින ආර්ථික අර්බුධකාරී වාතාවරණය හමුවේ 59 වන පාබල සේනාංක බලප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වෙත දිවා, රාත්‍රී බත් දන්සැලක් සහ ගැබිණි මව්වරුන් 10 දෙනකු සඳහා බෙසම්, ළමා මදුරු දැල් සහ ළදරු රෙදි කුඩ ආදී අවශ්‍යතා බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූනි 14 වන දින මුලතිව් මහජන ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. කොළඹ රාජකීය විද්‍යාලීය ආදී ශිෂ්‍ය මිතුරු කැළ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය ආදී විද්‍යාර්ථි මිතුරු කැළ සහ මිනිසත්කම අගයන සකල ශ්‍රී ලංකාවාසී/ලෝකවාසී මිතුරු කැළ විසින් මෙම සමාජ සත්කාරය සඳහා මූල්‍ය දායකත්වය ලබාදෙන ලදී. ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූ එම අවස්ථාවට 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබංඩාර යූඑස්පී ඇතුළු පිරිසක්ද එක්වූහ.

# බැඩ්මින්ටන් පුහුණු සැසියක්




57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ අදහසකට අනුව කිලිනොච්චි ප්‍රදේශයේ ඉගෙනුම ලබන පාසල් ළමුන්ගේ ක්‍රීඩා කෞශල්‍යය වර්ධනය කිරීමේ අරමුණින් වූ බැඩ්මින්ටන් පුහුණු සැසියක් ඉකුත් ජූනි 28 වන දින කිලිනොච්චිය ක්‍රීඩා සංකීර්ණයේදී පවත්වන ලදී. මෙම අවස්ථාව ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ සහභාගී විය. මේ සඳහා කිලිනොච්චි කලාප අධ්‍යාපන කොට්ඨාසයට අයත් පාසල් 06 ක් නියෝජනය වන පරිදි ළමුන් 77 ක් සහ ගුරු භවතුන් 15 දෙනකු සහභාගී වූ අතර, මෙම පුහුණු සැසියේ පුහුණුකරුවන් ලෙස ක්‍රිෂාන්ත ගොඩහේවා මහතා සහ දෙවන ලූතිනන් ගොඩහේවා කටයුතු කරනු ලැබූහ. තවද, මේ සඳහා සහභාගී වූ සිසු සිසුවියන් වෙත සහතිකපත්‍ර ප්‍රදානයක්ද 571 වන පාබල බලසේනාවේ බලසේනාධිපති අතින් සිදුකෙරිණ. මෙම අවස්ථාවට 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, 571, 572 සහ 573 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# ආරක්ෂක සම්බන්ධීකරණ සම්මන්ත්‍රණයක්



ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මෙන්ම බස්නාහිර පළාතේ සහ පුත්තලම දිස්ත්‍රික්කයේ සමස්ත මෙහෙයුම් ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් බස්නාහිර පළාතේ ආරක්ෂාවට අදාළ වැදගත් කරුණු කිහිපයක් සාකච්ඡා කිරීම සඳහා ඉකුත් ජූනි 22 වැනි දින ආරක්ෂක සහ මෙහෙයුම් සම්බන්ධීකරණ සමුළුවක් බටහිර ආරක්ෂක සේනා මූලස්ථානයේදී පැවැත්විණි. ශ්‍රී ලංකා පොලිසිය, විශේෂ කාර්ය බලකාය සහ ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ රාජකාරී නියුතු බලසේනාධිපතිවරු සහ අණදෙන නිලධාරීන් මෙම සමුළුව සඳහා සහභාගී වූහ.

මෙම සමුළුවේදී, ආරක්ෂක සේනා (බටහිර) වගකීම් ප්‍රදේශය යටතේ සීමා මායිම් සහ හටපිරිස් යෙදවීම, වර්තමාන බුද්ධි තත්ත්වය, හදිසි අවස්ථා සඳහා හමුදාව සහ පොලිසිය යෙදවීම, ඇඳිරි නීතිය සහ අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම වැනි වැදගත් කරුණු රැසක් පිළිබඳව සාකච්ඡා කෙරිණ.

# මාහැඟි පරිත්‍යාගයක්



හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සේවය කරන ශ්‍රී ලාංකිකයින් විසින් පරිත්‍යාග කළ වෛද්‍යාධාර තොගයක් ඉකුත් ජූලි 12 වන දින හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය අධ්‍යක්ෂක වෛද්‍ය සුරංග බස්නායක මහතා වෙත භාරදීම 12 වන පාබල සේනාංකයේදී සිදුකරන ලදී. එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් හා මඟපෙන්වීමෙන් මෙම මාහැඟි කටයුත්ත සිදුකෙරිණි.

# සංචාරයක මතක සටහන්



52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේපීඑස්ඒ ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් ජූනි 23 වන දින 523 වන පාබල බලසේනාව යටතේ ඇති 12 වන ගැමුණු හේවා බළඇණිය සහ 7 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ සංචාරයක නිරතවිය. එහිදී සේනාංකාධිපති විසින් එම හටපිරිස් අමතමින් ඔවුන්ගේ ක්‍රියාන්විත හා පාලන අවශ්‍යතා පිළිබඳ සොයාබැලීය.

# ජන දිවියට අස්වැසිල්ලක් ලබාදෙමින්

ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශය යටතේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් වියළි සලාක මළු 200 ක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූනි 12 වන දින බඩල්කුඹුර සංස්කෘතික මධ්‍යස්ථානයේදී පැවැත්විණ. මෙම වැඩසටහන සඳහා අවැසි පහසුකම් 7 වන ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් ලබාදුන් අතර, මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. ආඥාපති ගේ මඟපෙන්වීම මත ඇමෙරිකා එක්සත් ජනපදයේ පදිංචි කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන අනුක් මහතාගේ පූර්ණ අනුග්‍රාහකත්වය එම සත්කාරය සඳහා හිමිවිය.







ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ මඟපෙන්වීම යටතේ ඇන්කර් ෆොන්ටෙරා සමාගමේ කළමනාකාර අධ්‍යක්‍ෂ නිමල් ගමගේ මහතාගේ අනුග්‍රාහකත්වය මත එම මූලස්ථානය යටතේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා කිරිපිටි පැකට් ලබාදීමේ වැඩසටහනක් ඉකුත් 28 වන දින බඩල්කුඹුර නිශ්ශංක ජාතික පාසලේදී පැවැත්විණ.

7 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ සම්බන්ධීකරණයෙන් පැවති මෙම වැඩසටහනට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී වූ අතර, බඩල්කුඹුර පොලිස් ස්ථානාධිපති, බඩල්කුඹුර සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේ වෛද්‍යතුමන් ඇතුළු පිරිසක් ද මෙම අවස්ථාවට එක්වූහ.

# වෘත්තීය සුදුසුකම් සහතිකය පිරිනැමීම පිළිබඳ සාකච්ඡාවක්



යුද්ධ හමුදාවේ රාජකාරී කරන වෘත්තීය සෙබළුන්ගේ සේවා කාලය සහ නිපුණත්වය සැලකිල්ලට ගනිමින් ඔවුන් හට ඉදිරියේදී යුද්ධ හමුදාවේ දායකත්වයෙන් ජාතික වෘත්තීය නිපුණතා මට්ටම මත සහතික පත් ලබාදීමට අවශ්‍ය කටයුතු සූදානම් කිරීම හතාස අණසක මූලස්ථානය වෙතින් සිදුකෙරෙමින් පවතී. ඒ අනුව එහි මූලික පියවරක් ලෙස එම මූලස්ථාන ආඥාපති සහ සේවා රෙජිමේන්තු මධ්‍යස්ථානයන්ට අයත් වෘත්තීය පුහුණු පාසල්හි සේනාවිධායකවරුන්ගේ සහභාගීත්වයෙන් විශේෂ සාකච්ඡාවක් ඉකුත් ජූනි 22 වන දින විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සාකච්ඡා ශාලාවේදී පැවැත්විණ. මේ සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ සභාපති තරංග නලින් ගම්ලත් මහතා ඇතුළු එම අධිකාරියේ තවත් නිලධාරීන් පිරිසක් එක්වූහ.

# දූ දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක්






573 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් මලයාලපුරම් ග්‍රාමසේවා වසමේ පිහිටා ඇති තිල්ලුවාර් ප්‍රාථමික විද්‍යාලයේ අධ්‍යාපනය හදාරනු ලබන සිසු දරුවන් 37 දෙනකු සඳහා පාසල් උපකරණ කට්ටල බෙදාදීම සහ මාන්කුලම් ශම්මුඛරත්නම් ප්‍රාථමික විද්‍යාලය සහ තිරුවල්ලුවර් ප්‍රාථමික විද්‍යාලය වෙත ජල පිරිපහදු යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම ඉකුත් ජූලි 16 වන දින තිරුවල්ලුවර් ප්‍රාථමික විද්‍යාලයේදී සිදුකෙරිණ. මෙම වැඩසටහන සඳහා රුපියල් 200000.00 ක අනුග්‍රාහකත්වය රොහාන්, රොෂාන් මධුරංග සහ අකිල ප්‍රභාත් යන මහත්වරු විසින් ලබාදෙන ලදී. තවද, මෙම අවස්ථාවට 571 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේජීසීඑම්එච් ගම්ලත් ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් පිරිසක් ද සහභාගී වූහ.

# ගර්භණී මාතාවන් වෙනුවෙන් අමතක නොවන තිළිණයක්

1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් රවීන්ද්‍ර මීගමආරච්චි ගේ අදහසකට අනුව එම බලකායට අයත් නිලධාරිණියන්, සෙබළියන් සහ යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ගැබිණි භාර්යාවන් 137 දෙනකු වෙනුවෙන් පෝෂණදායී, ගුණාත්මක සහ ප්‍රණීත ආහාර වේලක් ලබාදීමට ක්‍රියා කෙරිණ. ඉකුත් ජූලි 15 වන දින සිදුකළ එකී සත්කාරයේදී එම ගර්භණී කාන්තාවන් හට ළදරුවන්ගේ බඩු බාහිරාදිය රැගෙන යා හැකි කූඩ 137 ක් ද පරිත්‍යාග කරන ලදී. මෙම කූඩ සඳහා අනුග්‍රහය අණදෙන නිලධාරී විසින් පුද්ගලිකව දරූ අතර, මෙම ඒකක සියලු නිලයින්ගේම සුරතින් ආහාර පිසීම සිදුකර එම ආහාරවල සුරක්ෂිතභාවය සහ සෞඛ්‍යාරක්ෂිත බව වෛද්‍ය බලකායේ අධීක්ෂණයෙන් සිදුවීමද මෙහි විශේෂත්වයකි. මෙම වැඩසටහ සඳහා පොදුසේවා බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් සසංක පෙරේරා ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

"ඔබ අප පවුලේ සාමාජිකාවක් වීම අප ලද
මහත් භාග්‍යයක් කොට සලකන අතර, අප පවුලේ
අළුත්ම බලාපොරොත්තුව මෙලොව එළිය දකින
තුරු අප නොඉවසිල්ලෙන් බලා සිටින්නෙමු..
ඔබට නිරෝගී දරු උපතක් වේවා"

1 වන පොදු සේවා බලකා අණදෙන නිලධාරී
ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින්







# ප්‍රසම්පාදනය, තොග පාලනය හා අනෙකුත් මූල්‍ය කටයුතු පිළිබඳ වැඩමුළුවක්







යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයකට අනුව අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ ගේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන ගේ අධීක්ෂණය යටතේ එම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යුද්ධ හමුදාවේ රාජ්‍ය මූල්‍ය කටයුතු මෙහෙයවනු ලබන ජ්‍යේෂ්ඨ නිලධාරීන්, සෙසුනිලයින් ගේ ප්‍රසම්පාදනය, තොග පාලනය හා අනෙකුත් මූල්‍ය කටයුතු පිළිබඳ දැනුම වර්ධනය කිරීම උදෙසා වූ වැඩමුළුවක් ඉකුත් ජූනි 22 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යේෂ්ඨ උපදේශකයකු වන විශ්‍රාමික අනුර ලොකුගමගේ සහ ජාතික විගණන කාර්යාලයේ නියෝජ්‍ය විගණකාධිපති විශ්‍රාමික එන්ආර්ඒඑම් ධර්මසිරි යන මහත්වරු ඊට සම්පත් දායකත්වය සැපයූහ. එම වැඩමුළුව සඳහා අධ්‍යක්ෂක මණ්ඩල, ආරක්ෂක සේනා මූලස්ථාන, පාබල සේනාංක, පාබල බලසේනා සහ රෙජිමේන්තු යටතේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් තුන් දහසකට ආසන්න පිරිසක් සහභාගී වූහ.

# විශ්‍රාම පූර්ව වැඩමුළුවක්





වසර 30 ක් පුරාවට පැවති කුරිරු ත්‍රස්තවාදය පරාජයට පත්කර රටට නිරසාර සාමය උදාකරලීම සඳහා කැපවූ යුද්ධ හමුදාවේ වීරෝධාර සෙබළ සෙබළියන් තම සේවා කාලය අවසන්ව විශ්‍රාම යාමෙන් පසු යුද්ධ හමුදාවේ ගෞරවය රැකෙන පරිදි උචිත වෘත්තියක නියැලී සිවිල් ජීවිතය සාර්ථක කරගැනීම සඳහා අත්වැලක් ලබාදීම කළාඹිය පිහිටි යුද්ධ හමුදා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ අරමුණ වේ. ඒ අනුව 2023 සහ 2024 වර්ෂ තුළ විශ්‍රාම යාමට නියමිත සෙබළ සෙබළියන් 600කට අධික සංඛ්‍යාවක් වෙනුවෙන් වසරකට අධියර දෙකක් යටතේ විශ්‍රාම පූර්ව වැඩමුළු දෙකක් මෙම පුහුණු මධ්‍යස්ථානය වෙතින් පවත්වනු ලබන අතර, එහි ප්‍රථම විශ්‍රාම පූර්ව වැඩමුළුව සෙබළ සෙබළියන් 209 දෙනකුගේ සහභාගීත්වයෙන් ඉකුත් ජූනි මස 20 වන දින සිට 2022 ජූනි මස 25 වන දින දක්වා පවත්වන ලදී. එම වැඩමුළුව සඳහා සෑම රෙජිමේන්තුවක්ම නියෝජනය වන පරිදි සෙසුනිලයින් සහභාගී වූ අතර, එහි ආරම්භක දේශනය එම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඒඑම්එස් ප්‍රේමවංශ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් පවත්වන ලදී.




# යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 38 වන සංවත්සරය



පසුගිය ජූලි 12 වන දිනට යෙදුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 38 වන සංවත්සරය සනිටුහන් කිරීම නිමිත්තෙන් එම ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ අදහසකට අනුව සත්කාර රැසක් සිදුකෙරිණ. ඒ අනුව තෝරාගත් රණවිරුවන් හා සිවිල් සේවක මහතුන්ගේ අවශ්‍යතාවයන් ඉටුකිරීම සහ ඔවුන්ගේ ජීවිතයට ශක්තියක් මෙන්ම එම පවුල්වල ලබැඳියන්ගේ ජීවිත සාර්ථක කිරීම උදෙසා යුද්ධ හමුදා සාමාජිකයින්ගේ අර්ධ නිවාස සම්පූර්ණකර දීම, නාන කාමර කට්වල, වෛද්‍යාධාර සහ මූල්‍ය පරිත්‍යාග සිදුකිරීම මෙන්ම සිවිල් සේවක මහතුන් හට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් පාර්සල් බෙදාදීම එම සත්කාර විය.



මෙම මූල්‍ය පරිත්‍යාග ලබාදීමේ වැඩසටහන සඳහා සියලුම රෙජිමේන්තු ආවරණය වන පරිදි රණවිරුවන් 18 දෙනකු සහ සිවිල් සේවකයින් දෙදෙනකු සුදුසුකම් ලැබූ අතර, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් පාර්සල් ලබාගැනීම සඳහා යුද්ධ හමුදා ශාඛා, අධ්‍යක්ෂ මණ්ඩල සහ ආයතන නියෝජනය කරමින් සිවිල් සේවකයින් 25 දෙනකු තෝරාගන්නා ලදී. තවද, හදිසි අනතුරකින් මියගිය ඉංජිනේරු සේවා බලකායට අයත් ඉංජිනේරු සෙබළ ප්‍රේමදාස එම්කේජී රණවිරුවාගේ අඩක් නිමකර තිබූ නිවසේ ඉතිරි වැඩ කොටස නිමකර ගැනීම සඳහා ආරක්ෂක ලේකම් (විශ්‍රාමික) ජෙනරාල් කමල් ගුණරත්න ගේ මඟපෙන්වීම යටතේ "අපි වෙනුවෙන් අපි" අරමුදලින් රුපියල් 1000,000.00 ක් සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ අර්ධ නිවාස ව්‍යාපෘතියෙන් රුපියල් 350,000.00 ක මුදලක් එම මියගිය රණවිරුවාගේ බිරිඳ වෙත පිරිනමන ලදී.




මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ උප සභාපතිනි ශිරෝමාලා කොඩිතුවක්කු මහත්මිය ද සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක් ද සහභාගී වූහ.

# සංවත්සර දිනය නිමිත්තෙන් පින්බර කටයුත්තක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 38 වන සංවත්සරය වෙනුවෙන් එම සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ අදහසකට අනුව යුද්ධ හමුදා බෞද්ධ බලමණ්ඩලය සමග සම්බන්ධතාවයෙන් සීල සමාදාන වැඩසටහනක් සහ මෙහෙණින් වහන්සේලා 12 නමක් වෙනුවෙන් දහවල දානමය පිංකමක් ඉකුත් ජූලි 13 වන දින පනාගොඩ පිහිටි බෝධිරාජාරාමය විහාරස්ථානයේදී පැවැත්විණ.



මෙම දානමය පිංකමට වැඩමකළ පාදුක්ක මාතිකමාතා මෙහෙණි ආරාමයේ වැඩවාසය කරන මෙහෙණින් වහන්සේලාගේ ප්‍රයෝජනය උදෙසා ගරු සභාපතිනිය ගේ උපදෙස් මත රුපියල් 40,000.00 ක වටිනාකමකින් යුත් රයිස් කුකර් 01 (ලීටර් 05 ක්) හා විදුලි කේතලයක් (ලීටර් 03) ඇතුළුව රුපියල් 22,000.00 ක වටිනාකමකින් යුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පාර්සලයක් ගරු සභාපතිනිය ගේ සුරතින් පූජා කරන ලදී. තවද, මෙම සීල සමාදාන වැඩසටහන සහ දානමය පිංකම අවසානයේ සිල් සමාදන්ව සිටි සියලුම අයවලුන් වෙනුවෙන් ප්‍රනීත සව් දන්සැලක් ද පැවැත්විණ.

# විරු බිරිඳකට මාහැඟි පරිත්‍යාගයක්

ක්‍රියාන්විත රාජකාරියේදී මියගිය, අතුරුදන්, ආබාධිත සහ සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ මෙන්ම යුද්ධ හමුදාවේ රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහත්ම මහත්මීන් ගේ සුබසාධන කටයුතු උදෙසා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් විවිධ ආධාර උපකාර කරනු ලබයි. ඒ අනුව 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවට අයත් සෙ/කිහු107780 කෝප්‍රල් ප්‍රනාන්දු ඩබ්ලිව්එච්ඩබ්ලිව් ගේ අසනීප තත්වයෙන් පෙළෙන බිරිඳගේ වෛද්‍ය පහසුකම් ලබාගැනීම වෙනුවෙන් රුපියල් 100,000.00 ක මුදලක් පරිත්‍යාග කිරීම යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ගේ සුරතින් ඉකුත් ජූලි 12 වන දින සිදුකෙරිණ.



තවද, තත් කොනොනි ගේ අසනීප තත්වයෙන් පෙළෙන බිරිඳගේ සුවදුක් බැලීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය පානළුව, වටරැක පිහිටි එමම කොනොනි ගේ නිවස වෙත පැමිණි අතර, එහිදී රෙදි සෝදන යන්ත්‍රයක්, උණු වතුර බෝතල්, මදුරුදැල් ඇතුළු උපකරණ රැසක් සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් පාර්සලයක්ද පිරිනමන ලදී.



# නිරීක්ෂණ චාරිකාවක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සිය තනතුරේ රාජකාරි භාරගැනීමෙන් පසු ඉකුත් ජූලි 03 වන දින එම සේවා වනිතා ඒකකය යටතේ පාලනය වන පාන්ගොල්ලෙහි පිහිටි කඩදාසි ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූවාය. එහි නිෂ්පාදනය කරනු ලබන කඩදාසිවල ගුණාත්මකභාවය හා නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව පිළිබඳ එම ව්‍යාපෘතියභාර නිලධාරී අණදෙන විසින් එහිදී සභාපතිනිය වෙත පැහැදිලි කළ අතර, එතුමිය විසින් ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සඳහා අවැසි ඉදිරි උපදෙස් ලබාදෙන ලදී.

# රණවිරු යෝගට් ව්‍යාපෘතීන්හි අභිවෘද්ධියට මුලපිරුමක්






යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ පූර්ණ අධීක්ෂණය යටතේ දැනට ක්‍රියාත්මක වන රණවිරු යෝගට් ව්‍යාපෘති සහ නවතමයෙන් ආරම්භ කිරීමට නියමිත රණවිරු යෝගට් ව්‍යාපෘතීන්හි අභිවෘද්ධිය උදෙසා රුපියල් 3,545,709.12 ක වටිනාකමකින් යුත් නවීන උපකරණ බෙදාදීමේ සහ මුදල් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 28 වන දින යුද්ධ හමුදා සේවා වනිතා "සන්ෆ්ලවර් විලේජ්" කඳවුරු පරිශ්‍රයේදී පැවැත්විණ.



මෙහිදී, යෝගට් ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා මිලදීගෙන ඇති භාණ්ඩ සහ උපකරණ 3, 4, 5 සහ 8 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා වෙත සංකේතාත්මකව භාරදීම මෙහිදී සිදුකෙරිණ. තවද, මෙම පරිත්‍යාග බෙදාදීමට අමතරව 4 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය යටතේ හිඟුරක්ගොඩ ප්‍රදේශයේ නවතමයෙන් ස්ථාපිත කිරීමට නියමිත යෝගට් ව්‍යාපෘතියේ නිෂ්පාදනාගාර ගොඩනැගිල්ලේ වැඩකටයුතු නිමකර ගැනීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකක අරමුදලින් 1,567,240.00 ක මුදලක් සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය වෙත පිරිනැමීමද මෙහිදී සිදුවිය. මෙම අවස්ථාවට සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වාසනා වනිගසේකර මහත්මිය, යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# ජීවිතය දිනුමට දිරිය ළමුන්ට අත්වැලක්









යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සහ ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළු සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ අදහසකට අනුව යුද්ධ හමුදාධිපති ගේ මගපෙන්වීම පරිදි කුරුණෑගල උනුම්ය ප්‍රදේශයේ පිහිටි ස්පුට්නික් බාලිකා ළමා නිවාසයේ නේවාසික දැරියන් වෙත අධ්‍යාපනික සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 03 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ කර්නල් (සම්බන්ධීකරණ) කර්නල් එන් මහවිතාන කේඑස්පී, ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් කීර්තිනාථ ආර්එස්පී පීඑස්සී සහ නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක, ඇතුළු සාමාජිකාවන් පිරිසක් ද සහභාගී වූහ.

# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව



ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ 15 වන සභාපතිනිය වශයෙන් මල්ලිකා විජේසුන්දර මහත්මිය ඉකුත් ජූලි 02 වන දිනට යෙදුණු සුබ මොහොතින් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී නව තනතුරේ වැඩ භාරගන්නා ලදී. මෙම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක් ද සහභාගී වූහ.

# සංඥා බලකා සේවා වනිතා ශාඛාව





ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනි ශෂිකා හේරත් මහත්මිය ඉකුත් ජූනි 12 වැනි දින එම බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී වැඩ භාරගන්නා ලදී. ඉන් අනතුරුව, එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් 40 දෙනකුගේ සහභාගීත්වයෙන් 2022 ජූනි මාසය සඳහා වන මාසික රැස්වීමද පවත්වනු ලැබූහ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සංඥා බලකායේ ප්‍රධාන සංඥා නිලධාරි සහ සේනාවිධායක ඇතුළු නිලධාරීන් පිරිසක් ද සහභාගී වූහ.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව





සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඕමිලා ජයවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 25 වන දින එම සේවා වනිතා ශාඛාවේ කමිටු රැස්වීම පැවැත්විණ. ඉන් අනතුරුව එහි සාමාජිකාවෝ අඹේපුස්ස බෝතලේ පිහිටි විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හට රැකවරණය සලසන "අපේ ළමයි" නිවාසයෙහි සංචාරයක ද නිරත වූහ. එහිදී, එම ළමා නිවාසයෙහි දරුවන් 66 දෙනකු හට ඔවුන්ගේ එදිනෙදා පරිහරණය සඳහා අවශ්‍ය සනීපාරක්‍ෂක ද්‍රව්‍ය, වියළි සලාක, කොට්ට මෙට්ට, පොත්පත් ඇතුළු ද්‍රව්‍ය පරිත්‍යාගයක්ද සිදුකරන ලදී. තවද, ඔවුන්ගේ විනෝදාස්වාදය සඳහා එදින කැලිප්සෝ සංගීත කණ්ඩායමක් මගින් සංගීත රසාස්වාදය සැලසීමටද කටයුතු කරන ලදී.

# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව





යුද්ධයෙන් මියගිය සහ රණඝිතයට පත් රණවිරුවන් හට සෙත්පතා ඉකුත් ජූනි 26 වන දින අම්බලන්ගොඩ, පොල්වත්ත පිහිටි වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත උදේ, දහවල් සහ රාත්‍රී දානය ලබාදීමට සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව කටයුතු කරන ලදී. මෙම අවස්ථාවට එම සේවා වනිතාවේ සාමාජිකාවන්, නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය යටතේ පාලනය වන පල්ලෙකැලේ විරුකැකුළු පෙරපාසලෙහි දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳව සොයාබැලීම සඳහා ඉකුත් ජූනි 16 වන දින එහි නිරීක්‍ෂණ සංචාරයක නියැලීමට එම පෙර පාසලේ අධීක්‍ෂණ කටයුතු භාර ජ්‍යේෂ්ඨ සාමාජිකා ආශා අතාවුද මහත්මිය සහ 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑස්කේ සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී කටයුතු කරනු ලැබූහ.

# විශේෂ බලකා සේවා වනිතා ශාඛාව





විශේෂ බලකා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 2022 වර්ෂයට අදාල මහ සභා රැස්වීම එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නයනී සෙනරත් යාපා මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 26 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එහිදී, නව විධායක කමිටු සාමාජිකාවන් පත්කර ගත් අතර, සභාපතිනිය විසින් විශේෂ බලකායේ මියගිය, රණඝිතයට පත් හා සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ මෙන්ම සිවිල් සේවක මහතුන්ගේ පවුල්වල සුබසාධනය හා එම දූවා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් පිළිබඳව වැඩිදුරටත් එහිදී සාකච්ඡා කරන ලදී.

# කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව





උතුරු කොළඹ ශික්‍ෂණ රෝහලේ මේ දිනවල පවතින උග්‍ර රුධිර හිඟතාවයක් හේතුවෙන් එම රෝහලේ ඉල්ලීමකට අනුව කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කරනු ලැබූ ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 26 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙම අවස්ථාවට 1 වන බලකායේ බලකාධිපති මෙන්ම කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥාණරත්න එන්ඩීසී පීඑස්සී සහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් බීඑම්එස්කේකේ ධර්මවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ද සහභාගී වූහ. එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරී නියුතු නිලධාරීන්, සෙසුනිලයින්, සිවිල් සේවක මහතුන් මෙන්ම එහි සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ඇතුළු 116 දෙනකු එහිදී ලේ පරිත්‍යාග කරනු ලැබූහ.

# ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාව




ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ගේ උපදෙස් මත ඉංජිනේරු සේවා මධ්‍යම වැඩපළ සහ 12(සේවි) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සහයෝගයෙන් එම රෙජිමේන්තුවට අයත් ඉසෙ වීරසිංහ ඩබ්ලිව්එම්පී යන සෙනිගේ සින්ඩ්‍රෝම් රෝගයෙන් පෙළෙන දරුවා සහ ලා/කෝ රුවන් කුමාර එම්එච් යන කොනොනි ගේ බරපතල රෝගයකින් පෙළෙන දරුවා වෙත ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා මූල්‍යාධාර සහ පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පසුගියදා සිදුකෙරිණ.

# සේවා බලකා සේවා වනිතා ශාඛාව




සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ගේ උපදෙස් පරිදි වාර්ෂික මහසභා රැස්වීම, ගැබිණි මව්වරුන් සඳහා දිවා ආහාර වේලක් ලබාදීම හා ත්‍යාග කට්ටල ලබාදීමේ වැඩසටහනක් මෙන්ම මෙහෙණින් වහන්සේලා දසනමක් වෙනුවෙන් සංඝගත දක්ෂිණාවක් පිළිගැන්වීමේ උත්සවයක් ඉකුත් ජූනි 04 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව




විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා රෙජිමේන්තුව යටතේ රාජකාරී නියුතු විවිධ හේතුන් මත මියගිය, රණඝිනයට පත් සහ රාජකාරී නියුතු රණවිරුවන් මෙන්ම ඔවුන්ගේ පවුලේ ඥාතීන් හට සෙත්පතා එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ බෝධි පූජා පිංකමක් ඉකුත් ජූනි 07 වන දින විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපළ-කටුබැද්ද හිදී පැවැත්විණ. මෙම බෝධි පූජා පිංකමට අමතරව එම බලකායෙහි සෙසුනිල සහ සිවිල් සේවක මහතුන් අතුරින් තෝරාගත් 25 දෙනකුගේ පවුල් සඳහා වියළි සලාක ලබාදීමත්, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ කාලතුවක්කු බළඇණියේ රාජකාරී නියුතු සෙ/එම්100679 ලා/කෝ නවරත්න බීජීසී යන කොනොනි ගේ මාස 04 ක් වයසැති නිවුන් දරුවන් වෙත මාස 06 ක් සඳහා අවැසි ළමා කිරිපිටි පැකට් පරිත්‍යාග කිරීමක්ද එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මිය ගේ සුරතින් සිදුකෙරිණ. එම අවස්ථාවට විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ බලකාධිපති සමග සේවා වනිතා සාමාජිකාවන් පිරිසක් සහභාගී වූහ.

# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව





පසුගිය පොසොන් පොහොය නිමිත්තෙන් යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව වෙතින් ගැලණිගම පිහිටි ධර්මක්‍රම ළමා නිවාසයෙහි නේවාසිකව සිටින පිරිමි ළමුන් 28 දෙනකුගේ සුවදුක් සොයාබලා අවශ්‍යතා පරිත්‍යාග කරන ලදී. තවද, එම ළමා නිවාසය අසල පහන් කූඩුවලින් සැරසීමේ වැඩසටහනක්ද යුධොපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ගේ සහභාගීත්වයෙන් ඉකුත් ජූනි 13 වන දින සිදුකරනු ලැබූ අතර, එය ළමා නිවාසයේ සියලුම දරුවන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ඉමහත් ප්‍රසාදයට ලක්විය.

# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව





වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව විසින් පසුගිය වෙසක් පොහොය නිමිත්තෙන් පොල්පිටිමූකලානේ පඤ්ඤාසිරි ස්වාමීන් වහන්සේ විසින් සුමදුර ධර්ම දේශනාවක් හා දන්සැලක් පසුගියදා යුද්ධ හමුදා රෝහල් පරිශ්‍රයේදී පැවැත්විණ. මේ සඳහා වෛද්‍ය බලකායේ බලකාධිපති බ්‍රිගේඩියර් පීජ්සී ප්‍රනාන්දු යූඑස්පී, එම බලකා සේවා වනිතා ශාඛාවේ සභපතිනි විශේෂඥ වෛද්‍ය ඒ නිල්මිණී ප්‍රනාන්දු මහත්මිය හා වෛද්‍ය බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ටීඑම් හෙට්ටිආරච්චි ආර්එස්පී ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් 800 ක් පමණ පිරිසක් සහභාගී වූහ.

# පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව





ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව සහ ජාතික රුධිර පාරවිලයන සේවය එක්ව සංවිධානය කරන ලද ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 06 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ අනුග්‍රහයෙන් පවත්වන ලද මෙම වැඩසටහන සඳහා 100 කට වැඩි පිරිසක් රුධිරය පරිත්‍යාග කිරීමෙන් දායකත්වය ලබාදෙන ලදී. පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉනෝකා ඉලංගකෝන් මහත්මිය ඇතුළු ජ්‍යේෂ්ඨ සාමාජිකාවන් රැසක් මෙම වැඩසටහන සඳහා සහභාගී වූ අතර, ජාතික රුධිර පාරවිලයන සේවයේ වෛද්‍ය කාර්ය මණ්ඩලයද මෙහි සාර්ථකත්වය සඳහා තම දායකත්වය ලබාදුන්හ.

# පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාව





පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එරංගා හේවාවසම් මහත්මියගේ සහ එම බලකාධිපති ගේ අදහසකට අනුව පසුගිය පොසොන් පොහොය නිමිති කරගෙන පනාගොඩ පිහිටි යුද්ධ හමුදා බෝධිරාජාරාමය ඉදිරිපිට කඩල දන්සැලක් සහ මල් දන්සැලක් පවත්වන ලදී. මෙම අවස්ථාවට පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක් සහභාගී වූහ.

# කෘෂිකර්ම හා පශු සම්පත් සේවා වනිතා ශාඛාව





කෘෂිකර්ම හා පශු සම්පත් සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මියගේ අදහසකට අනුව පසුගිය පොසොන් පොහොය නිමිති කරගනිමින් එම සේවා වනිතා සාමාජිකාවෝ මග්ගොන පිහිටි ශාන්ත වින්සන්ට් ළමා නිවාසයෙහි නේවාසිකව සිටින දරුවන්ගේ සුවදුක් විමසා බැලීම සඳහා සංචාරයක නිරත වූහ. එහිදී, ඔවුනට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ වටිනා පැළ බෙදාදීමටද කටයුතු කෙරිණ. යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීමෙන් එම සත්කාරය සංවිධානය කෙරුණි.

# ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛාව



වත්මන් යුද්ධ හමුදාධිපති මෙන්ම ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ අදහසකට අනුව යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාව මගින් ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදිකෙරෙන නවත් නිවසක් සඳහා ඉකුත් ජූනි 16 වන දින මුල්ගල තැබිණ. 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් මියගිය සෙ/10කිහු01135 සැරයන් කුමාරදාස ඩබ්ලිව්එම් ගේ ළඟම ඥාතියා වෙනුවෙන් මෙම අංගසම්පූර්ණ නිවස ඉදිකෙරෙන අතර, එම මුල්ගල තැබීම ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් මංගල නවරත්න ගේ සුරතින් සිදුකෙරිණ.



# ඔඩ්ඩුසුඩාන් සටනට පණ දුන්

# විරුවකුගේ වතගොත...



**නි/64314 ලුතිනන් කර්නල් ජේ්වල් ජයසිංහ**
**පීඩබ්ලිව්ව් ඩබ්ලිව්ඩබ්ලිව්ව් ආර්ඩබ්ලිව්පී**
විශේෂ බලකා රෙජිමේන්තුව

සීතාවක පුරය කියූ සැණින් අප මතකය ඉතිහාසය කරා දිවයයි. අප රට ආක්‍රමණය කළ ප්‍රථම බටහිර ජාතිකයන් වූ පෘතුග්‍රීසීන් හට මහත් අභියෝගයක් එල්ල කළ පළමුවැනි රාජසිංහ හෙවත් සීතාවක රාජසිංහයන්ගේ නිජබිම සීතාවකයි. එවන් ඓතිහාසික මෙහෙවරකට උරදුන් රාජ කුමරකු ගේ සටන්කාමීත්වයට නෑකම් කියන තවත් පුත් රුවනක් මෑත කාලයේ සීතාවකින් බිහිවිය.

ඒ දරු සිගිත්තා වූ කලී 1976 අප්‍රේල් මස 29 වන දා සීතාවක දික්වැල්ලේ බඹරගල ග්‍රාමයේ ජේ් ජයසිංහ හා ඩීජී සුමනාවතී යුවළට දාව උපන් කුලුඳුල් දරුවා වන ලලිත් ජයසිංහයන්ය. පවුලට තවත් සොහොයුරෙක් සහ සොහොයුරියක් එක්වන විට පවුලේ වැඩිමලා වශයෙන් නිරායාසයෙන්ම ඔහු නායකයකු බවට පත්විය.

1982 වර්ෂයේදී අවිස්සාවේල්ල ජනපති මැදි මහ විද්‍යාලයට ඇතුලුවන්නට ලලිත්ට වරම් හිමිවිය. වසරින් වසර ගතවන විට අධ්‍යාපනයේ මෙන් ක්‍රීඩා හා කලා ආදී ක්ෂේත්‍රවල විශේෂ දක්ෂතා දක්වන්නට ඔහු සමත්විය. ශිෂ්‍ය වාර්තා පොතේ ඉහළ ලකුණු ලබමින්, බාහිර ක්‍රියාකාරකම්වලදී සෙසු සිසුන් අභිබවමින් පෙරමුණ ගත් ලලිත් ජයසිංහ සිසුවා නිතරගයෙන් පන්ති නායකත්වයෙන්ද, ශිෂ්‍ය නායක තනතුරින්ද, පිදුම් ලැබීය. ක්‍රීඩා පිටියේදී ලලිත්ගේ ප්‍රියතම ක්‍රීඩා ඉසව් වූයේ රගර් හා ක්‍රිකට්ය. එසේම මැරතන් ධාවනයටද ඔහු දක්ෂතාවයක් දක්විය. කලාප හා පළාත් මට්ටමේ මැරතන් ධාවන ශූරයකු වශයෙන් ඔහු ප්‍රසිද්ධියට පත්විණි. කලා කටයුතුවලදී ඔහු පාසලට නැතිවම බැරි ශිෂ්‍යයෙක් විය. රචනා, ගායනා, කථික හා නාට්‍ය වැනි සෑම කලා අංශයකම දස්කම් දක්වා ජයග්‍රහණ ලැබීමට ලලිත් සමත් විය.

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් විශිෂ්ට ලෙස සමත් වූ ලලිත් උසස් පෙළ සඳහා ඇතුළත් වූයේ කොළඹ ලුම්බිණි විද්‍යාලයට. ලලිත් මෙන්ම දක්ෂයෙක් වූ ඔහුගේ සොහොයුරා ඒ වනවිට කොළඹ තර්ස්ටන් විද්‍යාලේත් සොයුරිය විශාඛා බාලිකාවේත් කැපී පෙනෙන සිසු සිසුවියන් බවට පත්ව සිටීම ඔහුට අමතර සවියක් හා දිරියක් විය. ගමේ පාසලේ පෙන්වූ කුසලතා කොළඹදීද දක්වමින් කෙටි කාලයකින්ම ලලිත් ලුම්බිණියේ ජනප්‍රිය සිසුවකු බවට පත්විය. සාමාන්‍ය පෙළ විභාගයේදී හිමිකරගත් උසස් ප්‍රතිඵල තවදුරටත් තහවුරු කරමින් උසස් පෙළින්ද ඉහළම සාමාර්ථයක් දිනා ගැනීමට ඔහු සමත් විය. කුඩා කල සිටම තම සිතැඟි දෙමාපියන් සමඟ සාකච්ඡා කිරීමේ සම්ප්‍රදායක් ඔහුගේ පවුලේ පැවතුණි. ඒ අනුව යුද්ධ හමුදාවට බැඳී රට රැකගැනීමේ මෙහෙවරට දායකවීමේ කැමැත්ත ඔහු මුලින්ම ආදරණීය මෑණියන්ට හා පියාණන්ට දැනුම් දුන්නේය.

අධ්‍යාපනය ඇතුළු විවිධ දක්ෂතාවලින් පිරිපුන් තම වැඩිමහල්

පුත්‍රයා උසස් අධ්‍යාපන කටයුතු කිරීම පිළිබඳ වැඩි කැමැත්තක් දැක්වූ දෙමව්පියෝ එක එල්ලේම තම වැඩිමහල් පුත්‍රයාගේ ඉල්ලීමට මනාප නොවූහ. තමා වැනි හැකියාවන්ගේ යුත් ලක් පුතුන්ගේ සහය මෙවන් අවස්ථාවක මව්බිමට ලබා නොදුන්නොත් එය යුගයේ වගකීම් පැහැරහැරීමක් යැයි ලලිත් වැඩිහිටියන්ට දිගින් දිගටම කරුණු පහදාදුන් හෙයින් අවසානයේ ලලිත් ජයගත්තේය.

ලලිත් සිය ප්‍රථම පුහුණු පාඨමාලාව සඳහා දියතලාවේ පිහිටි යුද්ධ හමුදා විද්‍යාපීඨයට පිවිසුණේ 1997 ජනවාරි මස 21 වනදාය. එම පාඨමාලාව අතරතුරදී අතළොස්සකට පමණක් හිමිවන විදේශීය කෙඩෙට් නිලධාරි පාඨමාලාව හැදෑරීම සඳහා ඔහුට බංගලාදේශයේ ආරක්ෂක විද්‍යාපීඨයට ඇතුළුවීමට වරම් ලැබිණි. 1997 මැයි මස 20 වන දා ලලිත් තම මව්බිමෙන් නික්ම ගියේ සිය දයාබර මැනියන් ඇතුළු පවුලේ සාමාජිකයන්ගේ දුක හා සතුට දෙකම මුසු වූ කඳුළු මතිනි.

විදෙස් පුහුණුවෙන් පසු යළි දියතලාවට පැමිණි ලලිත් ඇතුළු කණ්ඩායමේ විසිරයාමේ පෙළපාලිය 1998 ජූනි මස 06 වන දින අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. රට සුරැකීමේ සටනට එක්වීමට නියමිතව සිටින තම රණවිරු පුතු දැකීමට දෙමාපියන් ඇතුළු ඥාතීන් රැසක් පැමිණෙනු දුටු ලලිත්ගේ සිත ප්‍රබෝධයෙන් පිරී ගියේය. තම දෙමාපිය ඥාතීන්ද ඇතුළු උත්සව භූමියේ රැස්ව සිටි සිය ගණනක් වූ සුබ පතන්නන්ගේ ආශිර්වාදය මැද ලලිත් ජයසිංහ දෙවන ලුතිනන් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක විසින් අධිකාරියට පත්කරන ලද්දේය.

අධිකාරියට පත්වීමෙන් ඉක්බිති තමන්ට කැමති හමුදා ඒකකයක් තෝරාගැනීමේ අවස්ථාව ලලිත් ඇතුළු කණ්ඩායමට හිමිවිය. දෙවරක් නොසිතූ ලලිත් පාබල ඒකකයකට එක්වීමට තිබූ කැමැත්ත මත ගැමුණු හේවා රෙජිමේන්තුව තෝරාගත් අතර, එතැනින් ගැමුණු හේවා බලකා මාතාවගේ එඩිතර පුතණුවකු ලෙස 6 වන ගැමුණු හේවා බළඇණිය වෙත අනුයුක්ත කෙරිණ. යුද්ධ හමුදා විද්‍යාපීඨය තුළින්ම කරනු ලබන තෝරා ගැනීමකදී ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී අතළොස්සක් සඳහා පමණක් හිමිවන ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකායට බැඳීමේ අවස්ථාව හිමිකර ගැනීමට ඔහු වාසනාවන්ත විය. යුද ශිල්පයේ අගතැන්පත් වූවන් ලෙස සැලකෙන ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකාය වෙත ඔහු තෝරාගත් අතර, 24 වන මූලික විශේෂ බලකා පාඨමාලාව හැදෑරීම සඳහා ඉනික්බිතව ඔහු පිටත්විය.

විශේෂ බලකා පුහුණු පාඨමාලාව ඔහු එතෙක් මෙතෙක් හැදෑරූ අති දුෂ්කර මෙන්ම අභියෝගාත්මක අභ්‍යාසය විය. එහෙත් හමුදා සේවය සිය දිවියේ උදාරතම අරමුණ ලෙස සැලකූ මෙම රණකාමී තරුණයා ඉතා ඉවසිලිමත්ව හා එඩිතරව සියලු දුෂ්කරතාවන්ට මුහුණ දුන්නේය. තවත් නිලධාරීන් 11 ක් හා සෙසු නිලයින් 1,000 ක්ද ලලිත් සමග මෙම පුහුණුවට සහභාගී වූහ. හය මසක දුෂ්කර කාලපරිච්ඡේදයකින් පසු ඉතා විශිෂ්ට ප්‍රතිඵල නෙළාගන්නට ලලිත් ජයසිංහ සමත් විය. 1999 අප්‍රේල් මස 19 දා එම පාඨමාලාව සාර්ථකව නිමකර දෙවන විශේෂ බලකායට අනුයුක්ත වූ ඔහු "එම්" බළඝණයේ ක්‍රියාන්විත රාජකාරි සඳහා එක්විය. විශේෂ බලකා සෙබළකු වශයෙන් ලලිත් පෙන්නුම් කළ නිර්මාණ ශක්තියත් උපායශීලිත්වයත් හේතුවෙන්ම විශේෂ බලකායේ දිගුදුර විමර්ශන 06 වන පාඨමාලාවට ඔහු තෝරා ගැනුණි. ඒ සඳහා පැවති පරීක්ෂණයෙන් ඉහළින්ම සමත් වූ ඔහු සෙසුනිලයන් 40 ක් සමග මාදුරුඔය විශේෂ බලකා පුහුණු පාසලට ඇතුළත් විය. 2000 වසරේ ජූලි මස 10 සිට නොවැම්බර් 16 දක්වා පැවති එම පාඨමාලාවෙන්ද ඉහළ සාමාර්ථයක් ලලිත්ට හිමිවිය. ඒ වන විටත් ලුතිනන් නිලය දක්වා උසස් වී සිටි ඔහුට දෙවන විශේෂ බලකායේ දිගුදුර කුඩා කණ්ඩායම් ක්‍රියාන්විත සඳහා සහභාගිවීමට අවස්ථාව උදාවිණි.

කොටි ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් අඩපණ කිරීමට දිගුදුර ක්‍රියාන්විත කණ්ඩායමෙන් ඉටුවූයේ අපමණ මෙහෙවරකි. ත්‍රස්තවාදීන්ගේ භූමිය තුළට රහසේ රිංගා ඔවුන් විමර්ශනය කර එල්ල කරන ලද ප්‍රහාරයන්ගෙන් ත්‍රස්තවාදීහු සලිත වී ගියහ. ත්‍රස්තවාදී නායකයන් වාහනවලින් ගමන් කිරීම අවම කළේය. එවැනි ක්‍රියාන්විතවලින් තම යුද ශිල්පීය ඥාණය දියුණු කරගත් ලුතිනන් ලලිත් ජයසිංහ යුද්ධ හමුදාව විසින් මෙහෙය වූ අග්නිඛීල, කිණිහිර ආදී දැවැන්ත ක්‍රියාන්විතයන්ට සහභාගීවීමෙන් යුද ශිල්පයෙහි නව තවත් පරිණතභාවයට පත්විය. 1999 වසරේ ත්‍රස්තවාදීන් විසින් දියත් කරන ලද "නොනවතින රැල්ල" නම් ප්‍රහාර සමූහය ආරක්ෂක අංශ වෙත දැඩි බලපෑමක් එල්ල කළේය.

හමුදා සාමාජිකයන්ගේ චිත්ත ධෛර්යය වර්ධනය කිරීම සඳහා ගතයුතු සියලු පියවර ගැනීමට ක්‍රියා කළද යුද්ධ හමුදා මෙහෙයුම් මගින් ත්‍රස්තවාදීන් විනාශ කිරීම තරම් චිත්ත ධෛර්ය වර්ධනය කිරීමක් අනෙක් ක්‍රියා මාර්ගයන්ගෙන් අපේක්ෂා කළ නොහැක. කොටින්ගේ මෙම ක්‍රියාකාරකම් අධ්‍යයනය කර උපක්‍රමශීලි ලෙස ඔවුන් අතර මතභේදයක් ඇති කිරීම මගින් යුද්ධ හමුදාවට ධෛර්යයක් ලබාදීමේ සැලැස්මක් සකසනු ලැබුවේ මෙම පසුබිම තුළදීය.

දිගුදුර ක්‍රියාන්විතයන් දියත්කර මෙම අභියෝගය ජයගැනීමේ වගකීම භාරගත් ලුතිනන් ජයසිංහ ප්‍රමුඛ කුඩා ඛණ්ඩය, අභියෝගාත්මක ක්‍රියාන්විත සමූහයකට ලකලෑස්ති විය. ඔවුහු කල්මඩු ප්‍රදේශයෙන් මෙහෙයුම ඇරඹූහ. ඔවුන්ට හඹායාමට තිබූ ඉලක්කය කිලෝමීටර් 60 ක දුරකින් පිහිටි ත්‍රස්තවාදී නායකයකුගේ ගමන් මගකි. එය කොටි ත්‍රස්තවාදීන්ගේ හදවත ලෙස සැලකූ කිලිනොච්චියට ආසන්න අක්කරායන්කුලම් ග්‍රාමයයි. දිගුදුර විමර්ශන බොහොමයක් "වන් වේ ටිකට්" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වීමට බොහෝ හමුදා සාමාජිකයෝ හුරුවී සිටියහ. එම ක්‍රියාන්විත එතරම් අවදානම් සහගත නිසාවෙනි.

ලුතිනන් ජයසිංහ ප්‍රමුඛ රණවිරුවන්ගේ ඉලක්කය වූයේ මුහුදු කොටි බලකායේ දෙවැනියා ලෙස නම් දරා සිටි තංගෙමරන්ය. ලැබුණු බුද්ධි තොරතුරු අනුව ප්‍රහාරය එල්ල කිරීමට සුදුසු තැනක ස්ථානගත වූ අප රණවිරුවෝ සූක්ෂම ලෙස ක්ලේමෝර් බෝම්බ අටවා සූදානම්ව සිටියෝය. සැලසුම අති සාර්ථක විය. තංගෙමරන්ද සමග වාහනය පුපුරා ගියේ පළාත දෙවනත් කරමින්ය. ප්‍රහාරය සැලවූ විගස එය අභ්‍යන්තර කුමන්ත්‍රණයක් විය යුතු යැයි ප්‍රභාකරන් ප්‍රකාශ කළ බවද ඔත්තු සේවා ආරංචි මාර්ග තුළින් පසුව දැනගන්නට ලැබිණි. සිය මෙහෙවර ඉටුකළ ලුතිනන් ජයසිංහ ඇතුළු පිරිස අති දුෂ්කර දින 18 ක් ඝන වනාන්තරයේ ගතකිරීමෙන් පසු නිරුපද්‍රිතව සිය කඳවුර කරා ළඟාවූහ.

ලුතිනන් ජයසිංහගේ ඊළඟ එල්ටීටීඊ ඉලක්කය වූයේ කොටි ගුවන් බලකායේ ප්‍රධානියා ලෙස බුද්ධි අංශ වෙතින් හෙළිදරව් කරගෙන සිටි වෛකසලිංගම් සෝනලිංගම් හෙවත් කර්නල් ශංකර් නැමැත්තාය. මොහුව ඉලක්ක කරගත් දින 20 ක ක්‍රියාන්විතයක් ලුතිනන් ජයසිංහගේ නායකත්වයෙන් සැලසුම් කෙරිණි. වැලිඔය ඈතාවැටුණු වැව ඉදිරි ආරක්ෂක වළල්ලෙන් හත්දෙනකුගෙන් යුත් කණ්ඩායම ගමන් ඇරඹූහ. ඉතා අනාරක්ෂිත වනරොදයක් ඔස්සේ කිලෝමීටර් 50 කට ආසන්න දුෂ්කර ගමනකින් පසු පුදුකුඩිඉරිප්පු මාර්ගය කරා

ඔවුහු සමීප වූහ. මෙය ත්‍රස්තවාදී නායකයන් භාවිතා කරන මාර්ගය බව තහවුරු කරගත් ලුතිනන් ජයසිංහ ක්ෂණික ප්‍රහාරයකට අවශ්‍ය සැලසුම් සූදානම් කළේය. ප්‍රහාරයකට සියල්ල සූදානම්ය, එහෙත් තමාගේ ඉලක්කය තාම පැමිණියේ නැත. බුද්ධි තොරතුරුවලට අනුව හියක වේගයෙන් ඉදිරියට ඇදෙන ජීප් රථ ඔවුන්ගේ උකුසු ඇස්වලට ඉලක්කවීමට වැඩි කාලයක් ගතවූයේ නැත. ජීප් රිය නිසි තැනට පිවිසෙත්ම මහත් හඬක් නගමින් ගිනි ජාලාවක් නිකුත් විය. ඇසිල්ලකින් ප්‍රහාරය නිමවිණි. මෙම සුවිශේෂී දිගුදුර ප්‍රහාරයත් සමඟ කොටි ත්‍රස්තවාදීන්ගේ අභ්‍යන්තරය දෙදරුම්කා ගියේය.

තම දකුණු අත බඳු ශංකර්ව අත් වූ ඉරණම ප්‍රභාකරන්ගේ ගත සිත දෙකම හිරිවැට්ටවීමට සමත්විය. යුද්ධ හමුදාවට ඉමහත් කීර්තියක් ගෙනදුන් මෙම මෙහෙයුම පිළිබඳ තොරතුරු යුද්ධය අවසන් වන තෙක්ම රහසක්ව තබාගැනීමට සිදුවූයේ මෙම විරුවන්ගේ ජීවිත මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්හටද ඇතිවිය හැකි ජීවිත අවදානමක් වැළැක්විය යුතු බැවිනි.

එවැනි ක්‍රියාන්විතවල සාර්ථකත්වයත් සමගම දිගුදුර විමර්ශන සඳහාම විශේෂිත වූ විශේෂ බලකා බළඇණියක් ස්ථාපිත කළයුතු යැයි හමුදා නායකත්වය තීරණය කළේය. ඒ අනුව තුන්වන විශේෂ බලකාය ස්ථාපනය කළ අතර කපිතාන් ජයසිංහ නායකත්වය දුන් කුඩා කණ්ඩායම් ක්‍රියාන්විත මගින් ත්‍රස්තවාදීන්හට සැලකිය යුතු හානියක් සිදුවිය.

කල්යත්ම එම බලකායේ "අයි" බලඝණයේ බලඝණාධිපති ලෙස කපිතාන් ජයසිංහ පත්වීම භාරගත්තේය. ඔඩ්ඩුසුඩාන් - මාන්කුලම් මාර්ගයේ රැකසිට පහදීමේ තවත් මෙවැනි මෙහෙයුමක් සාර්ථක කරගැනීමට කපිතාන් ජයසිංහ සමත්විය. ක්‍රියාන්විතය සැලසුම් කළ ස්ථානයට ඔවුන් ළඟාවූයේ කිලෝමීටර් 45 ක පමණ අතිදුෂ්කර වූ මගක් ගෙවමින්ය. ඔඩ්ඩුසුඩාන් හරහා මාන්කුලම් සිට මුලතිව් දක්වා දිවෙන "ඒ 34" මාර්ගයේ ඉතා රහසිගතව සැඟව සිටි ඔවුහු, කොටි නායකයකු ගමන්ගත් ටාටා වර්ගයේ කැබ් රියක් සුනුවිසුණු කර දැමූහ. මේ සියලු ක්‍රියාන්විත දිගුදුර විමර්ශන බණ්ඩයන් සඳහා නවක සෙබළුන් තෝරාගැනීමේදී මනා පිටිවහලක් වූ බව පරම සත්‍යයකි.

කපිතන් ලලිත් ජයසිංහ ගේ සූක්ෂම ඥානය, මිත්‍රශීලීත්වය, ප්‍රසන්න පෙනුම, කථා විලාශය සහ ලබා තිබූ අත්දැකීම් තුළින් වර්ධනය කරගත්තා වූ පරිණතභාවය ඔහු වටා සිටි විශේෂ බලකා සාමාජිකයින් ඔහු කෙරෙහි ඇදබැඳ තබාගැනීමට සමත් විය. ඒ සමගම තමන් සැලසුම් කරන ක්‍රියාන්විතයන් අති සාර්ථක වන බව පිළිගැනීම තරම් විශේෂ බලකා සාමාජිකයෝ ඔහු කෙරෙහි විශ්වාසය තැබූහ. කිසිදිනෙක තමාගේ මිතුරු පාර්ශ්වය තුවාල වුවද ඔවුන් සතුරා අතට පත්වීමට ඉඩ නොතබන බව ඔහුගේ සමගාමීනු තරයේ විශ්වාස කළහ. එවැනි වූ ආත්ම විශ්වාසයකින් යුතුව සිටිනා කපිතාන් ජයසිංහ ඇතුළු බණ්ඩයට තවත් වැදගත් ඉලක්කයක් ලබාගැනීමට නියෝග ලැබුණි. දින 20 ක්‍රියාන්විතයකට සූදානම්ව කපිතාන් ජයසිංහ සිය කණ්ඩායම ද සමගින් මහකච්චිකුඩි ප්‍රදේශයට ගමන්කළ අතර, අපේක්ෂිත ස්ථානය වූ ඔඩ්ඩුසුඩාන් - නැඳුන්කේනි මාර්ගය වෙත ළඟාවීමට දින 04 ක් ගතවිණි.

ක්‍රියාන්විතය ඇරඹී දින 08 ක් ගතවන තුරුත් ඉලක්කය හමුනොවුණි. ඉලක්කය සපුරා නොගෙන ආපසු යාම රණවිරු ජයසිංහගේ ක්‍රමය නොවීය. අවසානයේ 1340 පැය වන විට කළු වීදුරු සහිත ත්‍රස්තවාදීන්ගේ සන්නද්ධ කැබ් රථයක් ඔවුන්ට දර්ශනය විය. ප්‍රහාරය සඳහා අවසන් සංඥාව නිකුත් කෙරුණි. නිමේෂයකින් කැබ් රථය හා එහි ගමන්ගත් ත්‍රස්තවාදීන්ගේ සිරුරු කැබලි ගුවන පුරා විසිර ගියේය.

තම කණ්ඩායමට ආදර්ශවත් නායකත්වයක් ලබාදෙමින් තමන්ට පැවරෙන ඕනෑම අසීරු ඉලක්කයක් ජයගැනීමට මෙම තරුණ විශේෂ බලකා නිලධාරියාට ඉතා සූක්ෂම නුවණක් හා දක්ෂතාවයක් තිබෙන බව මෙම ප්‍රහාරයෙන් ද මනාවට පැහැදිලි විය. නොකඩවා ක්‍රියාත්මක වූ දිගුදුර මෙහෙයුම් හේතුවෙන් සලිත වූ ත්‍රස්තවාදීන් මෙහි නායකත්වය හඳුනාගැනීම සඳහා මහත් පරිශ්‍රමයක් දැරීය. විශේෂ බලකා සාමාජිකයන්ගේ පරිණතභාවය හේතුකොටගෙන කිසිම විශේෂ බලකා සාමාජිකයෙකුගේ විස්තර ත්‍රස්තවාදීන්ගේ අතට පත්වීමට ඉඩ නොලැබිණ. එල්ටීටීඊය නොවැම්බර් මස මහවිරු සතිය සැමරීමට කල්යල් බලමින් සිටියේය. ත්‍රස්තවාදී නායක ප්‍රභාකරන්ගේ උපන් දිනය යෙදී ඇති නොවැම්බර් මස 26 වන දින තම නායකයා වෙනුවෙන් උපන්දින සාද පවත්වා මියගිය ත්‍රස්ත සාමාජිකයින් අනුස්මරණය කිරීමට කටයුතු යෙදිණ. මෙම විරු දිනයේ ත්‍රස්ත නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් විසින් පැවැත්වීමට නියමිත දේශනය පිළිබඳ මුළු රටෙහිම අවධානය යොමුවී තිබුණි.

දිනය 2008 වසරේ නොවැම්බර් 20 වනදාය. ත්‍රස්ත නායක ප්‍රභාකරන්ගේ උපන් දිනය වෙනුවෙන් විරු සතියක් ඒ වනවිටත් එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් ප්‍රකාශයට පත්කර තිබුණේ ඔවුන්ගේ අභිමානය ලොවට කියාපෑමටය. මේ විරු උත්සවයට සහභාගි වීමට පැමිණෙන ත්‍රස්තවාදී නායකයින් කිහිප දෙනකු අප රණවිරුවන්ගේ ඉලක්කය විය. මේජර් ජයසිංහ කල් ඇතුවම සිය සගයින් සමඟ ආරක්ෂක වළල්ල වෙත පියමන්කර හොර රහසේම ඔඩ්ඩුසුඩාන් සතුරු භූමියට ප්‍රවේශ වූයේ සුළඟටත් නොදැනෙන සේය. දිවා කාලයෙහි හැල හොල්මනක් නොමැතිව සිටි මේජර් ජයසිංහ ඇතුළු කණ්ඩය රාත්‍රී කාලයේදී වඩා ක්‍රියාශීලී විය.

දින 12 ක අවැසි සලාක කරනබාගත් ඔවුහු ඉතුරු දින 08 සගවන ලද ආහාරවලින් යැපීමට තීරණය කළහ. එහෙත් තම කරෙහි වූ වෙඩිදුවත, වතුර හා ආහාරවල බර සුළුපටු නොවීය. මෙම කාලවකවානුව තුළ කාලගුණය උතුරට ඉතා දරුණු ලෙස බලපායි. එය ඊසාන දිග මෝසම් සමයයි.

වසරේ වැඩිම වර්ෂාපතනය උතුරට ඇදහැලෙනුයේ මේ කාලය තුළදීය. එහෙත් මේජර් ජයසිංහට නම් මේ කාලයේ සොබාදහම විසින් ලබාදුන් සම්පතකි. ඔවුන්ගේ ගමනාන්තය වූයේ මිතුරු ආරක්ෂක වළල්ලේ සිට කිලෝමීටර් 40 ක් පමණ එපිටින් පිහිටි මාන්කුලම් - ඔඩ්ඩුසුඩාන් මාර්ගයයි. මෙම මාර්ගය ත්‍රස්තවාදීන් භාවිත කළ ප්‍රධාන සැපයුම් මාර්ගයන්ගෙන් එකකි.

මේජර් ජයසිංහ රණවිරුවා ප්‍රමුඛ හය දෙනකුගෙන් සමන්විත විශේෂ බලකායේ දිගුදුර මෙහෙයුම් කණ්ඩායම සිය උකුසු ඇසින් වටපිට නිරීක්ෂණය කරමින් ක්‍රමයෙන් ඉතා සූක්ෂම ලෙස සතුරු ආරක්ෂක වළලුවලින් රිංගා ඉලක්කය වෙත ළඟාවූහ. ඒ සඳහා ඔවුන්ට දින 06 ක් ගතවිය. සතුරු භූමියේ ප්‍රවේශමෙන් ගමන් කරන ආකාරය මනා ලෙස ප්‍රගුණ කරගෙන සිටි ඔවුහු ගසකින් කොළයක් බිමට වැටෙන හඬට පවා ඉතා සංවේදී වූහ. එමෙන්ම, වනයේ සිටින මීමින්නා වැනි වඩාත් සංවේදී සතෙකුට වුවද මේජර් ජයසිංහගේ හඬක් හෝ නිරීක්ෂණය වීමට ඉඩ නොලැබිණ. ක්‍රියාන්විතයන් තුළදී මේ තරම් සූක්ෂමවීම හේතුවෙන් මේජර් ජයසිංහ දියත්කළ සියලු ක්‍රියාන්විතයන් අති සාර්ථක විය. දැඩි අඳුරේ හමා යන සිසිල් සුළඟ මේජර් ජයසිංහ ඇතුලු බණ්ඩයේ විඩාව නිවාලීය. කොටි ත්‍රස්තවාදීන්ගේ උකුසු



**ඉදිරියෙන්ම සටන් කරමින් සිටි මේජර් ජයසිංහගේ දකුණු කකුල ත්‍රස්ත උණ්ඩයකින් පසාරු කරගෙන ගියේය. ඔහු බිම ඇද වැටුණි. එහෙත් ඔහුගේ දෑතින් ගිනි අවිය නොගිලිහිනි. ත්‍රස්තයන් හට පොකුරු උණ්ඩ කිහිපයක් මුදාහල මේජර් ජයසිංහ සමීර හේරත්ට අණ කළේ තමාගේ ආවරණ වෙඩි අතුරින් ඛණ්ඩයත් සමඟ පසුබසින ලෙසය. එහෙත් ලුතිනන් සමීර හේරත් තම සගයින් ආරක්ෂිතව තැබීමට සුදුසු තැනක් සොයා ඔවුන් වසන් කළහ. තමාගේ තුවාලයට වෙලුමක් දමා ගැනීමටවත් කාලයක් නොමැති බව දැනගත් ලලිත් අන් අයගේ ජීවිතවල ආරක්ෂාව උදෙසාම ඔවුන් ආරක්ෂිත ස්ථානයක් කරා පසුබසින තෙක් තමාගේ ඇසට හසුවන සියලු සතුරන් හට ප්‍රහාර එල්ලකර විනාශ කිරීමට සමත්විය. එහෙත් ත්‍රස්තවාදීන්ගේ ගිනියම් වූ උණ්ඩ කිහිපයක් ඔහුගේ හිස හා උදරය සිසාරා ගියේය. ලලිත්ගේ වෙඩි හඬ එතැනින් නැවතුණි.**

ඇස්වලට හා සාමාන්‍ය මිනිසුන්ගේ ඇස්වලට හසුනොවී දින ගණනාවක ගමන අවසානයේ ඔවුහු තම ගමනාන්තය කරා ළගාවූහ. අභියෝගාත්මක කටයුත්ත වන්නේ සතුරාට පහරදීම නොව ප්‍රහාරය අවසානයේ පසුබැසීමයි. ලද අත්දැකීම් අනුව ප්‍රහාරයත් සමගම ත්‍රස්තවාදීන් කඩිගුලක් මෙන් ඇවිස්සෙන බව ඔහු දනියි. සියලු ත්‍රස්තයින් කැළය වනසමින් විශේෂ බලකා සාමාජිකයින් සොයයි. සියලු මාර්ග ආවරණය වන සේ මුර සංචාර කරනු ලබයි.

එපමණක් නොව සාමාන්‍ය සිවිල් ජනයාට නියෝග ලබාදෙමින් දිවා කලයේ පමණක් නොව රාත්‍රී කාලයේද නිදිවර්ජිතව ගතකොට හමුදා සාමාජිකයින්ගේ ගමන් මාර්ග විමර්ශනය කර තොරතුරු ලබාදීමට අණදීම කරනු ලබන බව මේ ඛණ්ඩයට සක්සුදක් සේ පැහැදිලිය. මේ සියල්ල මේජර් ලලිත් ජයසිංහට නම් නුහුරු අත්දැකීම් නොවේ. එමෙන්ම තම නායකත්වය ලබාදුන් අණ අකුරටම පිළිපදින විශේෂ බලකා සාමාජිකයකු වන මේජර් ලලිත් ජයසිංහ පැවරුණු රාජකාරිය ඉටුකර මිස හිස් අතින් ආපසු පියනගන්නෙක් නොවේ. ප්‍රහාරය සඳහා සියල්ල සූදානම් කෙරිණි. අධික වර්ෂාව වාසිසහගත වුවද ඇතිකලාවූ පීඩාව සුළුපටු නොවේ. කාලගුණය යම් ප්‍රමාණයකට මේජර් ලලිත් ජයසිංහව අඩපණ කළේය. ඔහුට උණ රෝගය වැළඳුණි.

ඒ කිසිවක් නිසා නොව දින 06 ක් පුරාවට මහවැස්සේ තමා පැළඳ සිටි බූට් යුවල ඉවත් නොකර ගමන් කිරීම හේතුවෙන් ඔහුගේ පාදයන්හි යටිපතුල් විවිධ ආසාදනයන්ට ලක්ව තිබුණි. එහෙත් ලලිත් නම් මනසින් තවමත් ශක්තිමත්ය.

තමන්ගේ ගතට දැනෙන අපහසුව ඔහු නිකමටවත් තම සගයන්ට පැවසුයේ නැත. එයින්වත් තම සගයින් අධෛර්යයට පත්කිරීමට ඔහුට නොසිතිණ. තම නායකයාගේ යම් අපහසුතාවයක් දුටු සගයින් වෙනදාටත් වඩා උද්යෝග යෙන් කටයුතු කර ක්‍රියාන්විතය සාර්ථක කරගැනීමට යුහුසුළු වූහ. තමාගේ සගයන් තමාව වඩාත් තේරුම්ගෙන ඇති බව ඒත්තුගිය තැන මේජර් ලලිත් ජයසිංහ ගසකට පිට තබා මඳ විවේකයක් ගත්තේය. ඇස්දෙක පියවුණද ඔහුගේ දෙසවන් විවෘතය.

මධ්‍යහන එළඹිණි. යමක් විය හැකිය යන්න මේජර් ලලිත් ජයසිංහට ඉවෙන් මෙන් දැනෙන්නට විය. ඔහුට වැරදුණේ නැත. තමාගේ ඉලක්කය ඈතින් දිස්වණු පෙනුණි. තමාගේ සගයන් ඉලක්කය අත්පත්කර ගැනීමට සියලු කටයුතු සිදුකරන ආකාරය පෙනීමෙන් ඔහුගේ මුවගට සිහින් සිනාවක් එක්විය. තමා සිටින්නේ විශිෂ්ටයන්ගෙත් විශිෂ්ටයන් අතර බව මේජර් ලලිත් ජයසිංහට සිතිණි. ඔවුනට අණදීමට ලැබීම තමා ලැබූ භාග්‍යයක් යැයි මේජර් ලලිත් ජයසිංහට සිතුණි. ඉලක්කගත වාහනය නිමේෂයකින් ක්ලේමෝ ක්ලස්ටරය (පැති බෝම්බ පොකුර) ඉදිරියට පැමිණියේය. මාණ්ඩලික සැරයන් කුමාරසිංහ ඇසිපිය ගැසීමටත් මත්තෙන් දුරස්ථ පාලකය ක්‍රියාත්මක කළේ ත්‍රස්තයින් පැමිණි කැබ් රථය සුණුවිසුණු කරමිනි. බුද්ධි තොරතුරු සනාථ කරමින් විරු සමරුවට ආරක්ෂක ඛණ්ඩ සමඟ පැමිණි ඉහළ පෙළේ කොටි නායකයන් කිහිප දෙනෙකු පරලොව යැවීමට මොවුන් සමත්වූහ. කොටින් කඩිගුලක් මෙන් ඇවිස්සිනි. කොටින් විසින් තමන්ගේ නායකයින් ගමන් ගන්නා මාර්ගය ආරක්ෂා කිරීම සඳහා මාර්ග ස්ථාන මුරයන් යොදවා තිබියදීත් ප්‍රහාරයක් එල්ලවීම පිළිබඳ එකිනෙකාට චෝදනා කරගනු ලැබිය.

අතිරේක ත්‍රස්ත කණ්ඩායම් සෑම පඳුරකටම වෙඩි තබමින් රණවිරුවෝ සෙවූහ. මේජර් ජයසිංහ ඇතුළු ඛණ්ඩය වඩ වඩාත් ක්‍රියාශීලී වී ආරක්ෂිත ස්ථාන කර ගමන් කළහ. එහෙත් මේජර් ජයසිංහ ගේ අසනීපය මත ගමන ප්‍රමාදවිය. වර්ෂාව අධික වීමෙන් ගමනේදී ඇතිවන පා සටහන් මැකීම මහත්වූ දුෂ්කර කාර්යයක් විය. ඒවා මැකීමට වැඩි කාලයක් ගතකළ නොහැක. ත්‍රස්තවාදීන්ගේ වෙඩි හඬ ළංළංව ඇසීමෙන් ඔවුන් වෘක රැළක් මෙන් තමන් වෙතට කඩාවැදීමට සූදානම් වන බව දැණිනි. ගමන ඉක්මන් කළයුතු බව මේජර් ජයසිංහ ගේ ජ්‍යෙෂ්ඨ සගයා වූ ලුතිනන් සමීර හේරත්, පෙරගමන්කරු වූ මාණ්ඩලික සැරයන් කුමාරසිංහට දැන්විය. පය ඉක්මන්විය. එහෙත් පා සලකුණු සියල්ල මැකීමට නොහැකිවිය. ගතවූයේ නිමේෂයකි. ත්‍රස්තවාදීන් 50 කට අධික ප්‍රමාණයක් මේජර් ජයසිංහ ඇතුළු ඛණ්ඩය වටකර ගත්හ. විශේෂ බලකා ක්‍රියාන්විතයන්හි සුළු වැරැද්දකට හෝ ඉඩ නොමැති බව පුහුණුවේ ඉගෙනගත් දෑ යථාර්ථයක් වී ඇති බව මේජර් ජයසිංහ ඇතුළු කණ්ඩායමට වැටහෙන විටත් වෙඩි උණ්ඩ වරුසාවක් ඔවුන් වෙත පතිත වී හමාරය. සටන් කරනු විනා වෙන විකල්පයක් නොමැත. කාලතුවක්කු හෝ ආධාරක වෙඩි බලයක් නොමැත. ආධාරක හටපිරිස් පෙනෙනතෙක් මානයේ



"මගේ මහත්තයා අතිශයින්ම සාමාන්‍ය ජීවිතයක් ගතකරපු කෙනෙක්. එයා රට වෙනුවෙන් මේ තරම් බැරෑරුම් රාජකාරියක නිරතවෙන බව මම දැනගත්තේ ඔහු මියගියාට පස්සේ. එහෙම වීරයෙකුට දයාබර බිරිඳක්වීම නිසා වාවන්න බැරි ශෝකයක් මගේ ජීවිතයට එකතුවෙලා තියෙනවා. ඒ වගේම මෙවැනි වීරයෙකුට බිරිඳක් වීම ගැන ආඩම්බරයකුත් තියෙනවා"

- බිරිඳ -

නොමැත.

අරමුණ ඉටුවන තෙක් තනිව හෝ සටන් කිරීම සපටකර සිටි විශේෂ බලකා විරුවන් හත්දෙනකු ත්‍රස්තවාදීන් පනස්දෙනකු පමණ මුහුණට මුහුණලා මාරාන්තික සටනක නියැලෙන්නට විය. මේජර් ලලිත් ජයසිංහට තම අසනීපය අමතක විය. බණ්ඩයේ සාමාජිකයන්ගේ ජීවිත තමා අතේ රැඳෙන බව දත් මේජර් ලලිත් ජයසිංහයෝ නියම යුද සෙනෙවියකු මෙන් සතුරා හා සටනට පිළිපන්හ. එක් උණ්ඩයකින් එක් සතුරෙක් යන්න පිළිපැදිය යුතුමය. නැතහොත් විනාඩි කිහිපයකින් සටන අත්හැරීමට සිදුවේ. මේජර් ලලිත් ජයසිංහගේ නිර්භීතභාවය හා නායකත්වයේ ආදර්ශමත්භාවය ඔහුව සටනේ ඉදිරියෙන්ම තැබුවේය. ත්‍රස්තවාදීන් පනස් දෙනකුට වඩා සිටියද මේ රණවිරුවන් හත්දෙනා බිම වැට්ටවීමට එල්ටීටීඊයට නොහැකි විය.

විශේෂ බලකා සාමාජිකයින්ගේ යුද පරිණතභාවය හා හැකියාවන් තුළින් සැලකිය යුතු ත්‍රස්තවාදීන් ප්‍රමාණයක් විනාශකර ඔවුන්ගේ ප්‍රාහාරාත්මක ශක්තිය හීන කිරීමට විශේෂ බලකා සාමාජිකයින් හට හැකිවිය. එයින් උපරිම ප්‍රයෝජන ගත් මේජර් ලලිත් ජයසිංහ ඇතුළු රණවිරු කැල කඩිනමින් ආරක්ෂිත ස්ථානයක් කරා සතුරු ප්‍රහාර මධ්‍යයේ ගමන් කළහ. එහෙත් ත්‍රස්තවාදීන්ගේ අතිරේක හටපිරිස්හි ක්‍රියාකාරීත්වය ඊටත් වඩා ප්‍රබලවිය. නැවත දරුණු සටන් ඇතිවිය.

ඉදිරියෙන්ම සටන් කරමින් සිටි මේජර් ලලිත් ජයසිංහගේ දකුණු කකුල ත්‍රස්ත උණ්ඩයකින් පසාරු කරගෙන ගියේය. මේජර් ලලිත් ජයසිංහ බිම ඇද වැටුණි. එහෙත් ඔහුගේ දෑතින් ගිනි අවිය නොගිලිහිනි. ත්‍රස්තයන් හට පොකුරු උණ්ඩ කිහිපයක් මුදාහල ඔහු ලුතිනන් සමීර හේරත්ට අණ කළේ තමාගේ ආවරණ වෙඩි අතුරින් කඩිනමින් බණ්ඩයත් සමග පසුබසින ලෙසය. එහෙත් ලුතිනන් සමීර හේරත්ට එය කළ නොහැක්කක් විය. මේජර් ලලිත් ජයසිංහගේ නියෝගය නියෝගයම විය. මේ බව දත් ලුතිනන් සමීර හේරත් තම සගයින් ආරක්ෂිතව තැබීමට සුදුසු තැනක් සොයා ඔවුන් වසන් කළහ. තමාගේ තුවාලයට වෙළුමක් දමා ගැනීමටවත් කාලයක් නොමැති බව දැනගත් මේජර් ලලිත් ජයසිංහ අන් අයගේ ජීවිතවල ආරක්ෂාව උදෙසාම ඔවුන් ආරක්ෂිත ස්ථානයක් කරා පසුබසින තෙක් තමාගේ ඇසට හසුවන සියලු සතුරන් හට ප්‍රහාර එල්ලකර ඔවුන් විනාශ කිරීමට සමත්විය. එහෙත් ත්‍රස්තවාදීන්ගේ ගිනියම් වූ උණ්ඩ කිහිපයක් ඔහුගේ හිස හා උදරය සිසාරා ගියේය. මේජර් ලලිත් ජයසිංහ ගේ වෙඩි හඬ එතැනින් නැවතුණි. ත්‍රස්තයන් විශේෂ බලකා සාමාජිකයන්ගේ ප්‍රහාරයන්ගෙන් වික්ෂිප්ත වී සිටි අතර, හමුදා බණ්ඩය පැනගියේ යැයි සිතා තමා තුවාලකරුවන් සමග ඔවුන් පසුබැස්සෝය. ලුතිනන් හේරත් ඇතුළු බණ්ඩය අඳුර වැටෙන්ම තම නායකයාගේ සිරුර රැගෙන කිලෝමීටර් කිහිපයක් පසුබැස්සද කිලෝමීටර් හතලිහකට අධික දුරක් රැගෙන ආ නොහැකි බැවින් ඔහුගේ නිසල දේහය සඟවා සාමාජිකයන් දෙනකු පමණක් යුද්ධ හමුදා ඉදිරි ආරක්ෂක වළල්ල වෙත එවීමට කටයුතු කළේය. ඔවුන්ගෙන් ලත් තොරතුරු අනුව මනාව සැලසුම් කරන ලද ක්‍රියාන්විතයක් තුළින් ගුවන් හමුදා හෙලිකොප්ටර් ආධාරයෙන් මේජර් ලලිත් ජයසිංහගේ දේහය මිතුරු භූමිය වෙත රැගෙන ආවේය.

යුද භූමියේ තනිව හෝ තම ජීවිත ආරක්ෂාව නොතකා කරන ලද වික්‍රමාන්විත ක්‍රියා සඳහා පමණක් පුදනු ලබන වීර වික්‍රම විභූෂණය හා රණ වික්‍රම යන නාමවලින් දෙවරක්ම පිදුම් ලද ජාතියේ පිනට පහළ වූ මෙම වීරෝධාර සෙන්පතියාගේ නාමය දිගුදුර විමර්ශන ක්‍රියාන්විත සඳහා නව ජීවයක් ලබාදුන් විශේෂ බලකා රණවිරු නාමාවලියේ ඉහළින්ම සටහන්ව ඇත.

විශේෂ බලකායේ කීර්තිය නව නවන් මූර්තිමත් කළ මෙම අභීත මේජර් ජේඑල් ජයසිංහ සේනපතියාට ස්වකීය ආත්මාරක්ෂාවට සිදුවිය හැකි උපද්‍රව ගැන නොතකා සිය සගයන්ගේ ජීවිත ආරක්ෂාව හා සිය බලකායේ අරමුණු මුදුන්පත් කර ගැනීම උදෙසා තම ජීවිත පරිත්‍යාගයෙන් සිදුකරන ලද මෙම නිර්භීත ක්‍රියාව උදෙසා ඔහුට "පරම වීර විභූෂණ" ප්‍රදානය කරනු ලැබීය. හිරු නැග එන මොහොතේදීත් හිරු බැස යන මොහොතේදීත් සිහිකරනු ලබන රණවිරුවන් අතරට මෙම උතුම් මිනිසාගේ නාමයද සෑම දිනකම ආවර්ජනය කරනු ලබන්නේ ඉමහත් අභිමානයෙනි.

එම උත්තරීතර වූ පරම වීර විභූෂණය 2013 වර්ෂයේ ජූලි මස 15 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා සන්නද්ධ සේනාවන්හි සේනාධිනායක ධූරිත අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අරලියගහ මන්දිරයේදී මෙම අභීත සෙන්පතියාගේ ආදරණීය බිරිඳ වන කොෂල්‍යා රොෂිගෝ මහත්මිය වෙත ප්‍රදානය කළේය. වර්තමානයේ කොෂල්‍යා රොෂිගෝ මැතිනිය කොට්ටාව ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලයේ කළමනාකරණ කාර්යාලයේ සහකාර ගිණුම් කළමනාකාර තනතුරක් හොබවමින් රාජ්‍ය සේවයට දායකත්වයක් දරන්නීය. මීට අමතරව ඇය කොළඹ විශාඛා විද්‍යාලයේ දෙවන වසරේ ඉගෙනුම ලබන ජේජ් සෙහංසි සනායා තම දියණියගේ අධ්‍යාපන කටයුතුවලට සහය දෙමින් එය සාර්ථක කරගැනීමේ අරමුණැතිව අංක 315/01 දිවුලපිටිය, බොරලැස්ගමුව යන නිවසේ පදිංචිව සිටින්නීය.

*යුද්ධ හමුදා මූලස්ථානය මගින් ප්‍රකාශිත "උත්තමාචාරය" ග්‍රන්ථයෙන් උපුටා ගැනීමකි.*



# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ සෘජුකාරක හා අංගාදේශක වෘත්තියෙහි ආරම්භය සහ විකාශය



දශක තුනකට අධික කාලයක් පුරාවට කෲර එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමග පැවති කුරිරු යුද්ධයෙහි අමිහිරි වූත්, අතිබිහිසුණු හා ඉතා භයංකර වූත් ප්‍රතිඵලයක් වූයේ එම යුද්ධයේදී යුධ වැදීමෙන් තුවාල ලැබූ විශාල රණවිරුවන් පිරිසකට අත් හා පාද අහිමි වීමෙන් හා සිදුවූ වෙනත් තුවාල තත්වයන් හේතුවෙන් සදාකාලිකවම රණක්ෂිතයට පත් වීමයි.

මෙසේ රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ තුවාල තත්වයන් සම්පූර්ණයෙන් සුව වූ පසුව ඔවුන් නැවතත් සමාජගත කිරීම සඳහා සිදුකළ යුතු වූ පුනරුත්ථාපන ක්‍රියාවලියේ භාරදූරතම කාර්යභාරයක් වූයේ, අත් හා පාද අහිමි මෙන්ම වෙනත් ආබාධිත තත්වයන්ට පත් වූ රණක්ෂිතයින් සඳහා සෘජුකාරක හා අංගාදේශක උපකරණ නිසි ප්‍රමිතියකින් යුතුව සාදා නිමකර දීමයි.

එහෙත් මෙම කාලවකවානුව වන විට එම පහසුකම් සලසාදීම සඳහා යුද්ධ හමුදාව තුළ සෘජුකාරක හා අංගාදේශක වෘත්තිය අරඹා නොතිබීම හේතුවෙන් අත් හා පාද අහිමි රණක්ෂිතයට පත් රණවිරුවන් තායිවානය, ඊශ්‍රායලය වැනි විදෙස් රටවල් වෙත හා පසුකාලීනව හුණුපිටිය ගංගාරාම කාර්මිකාගාරය වෙත යොමු කොට ඔවුන් හට අවැසිව තිබූ සෘජුකාරක හා අංගාදේශක උපකරණ සාදවා නිම කරවාදීම සිදුකරන ලදි. එනමුදු යුද්ධයෙහි බිහිසුණු බව තවදුරටත් උග්‍ර වෙමින් දිනෙන් දින අත් හා පාද අහිමි මෙන්ම වෙනත් ආබාධිත තත්වයන්ට පත් වන රණවිරුවන්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ යාමත් සමග මෙසේ විදෙස් රටවල් වෙතින් එම උපකරණ සාදවා ගැනීමට යාමේදී විශාල මුදලක් වැය දැරීමට සිදුවීමෙන් යුද්ධ හමුදාවට මහත් අපහසුතාවයකට මුහුණදීමට සිදුවිය.

අනතුරුව ඊට පිළියමක් වශයෙන් 1990 වර්ෂයේ ඔක්තෝබර් මස 10 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් "රණවිරු සෙවණ" රාගම තුළදී ආරම්භ කිරීමට යෙදුණි. එහෙත් ඒ වනවිට එම මධ්‍යස්ථානය සඳහා යෙදවීම පිණිස සෘජුකාරක හා අංගාදේශක වෘත්තිකයින් හා කාර්මික ශිල්පීන් යුද්ධ හමුදාව තුළ නොසිටීම හේතුවෙන් එම වෘත්තිකයින් තායිවානයේ සිට මෙහි ගෙන්වා රණවිරු සෙවණ ක්‍රීඩාගාරය තුළදී රණක්ෂිතයින් මිනුම්ගත කොට එම මිනුම් නැවත තායිවානය වෙත ගෙන ගොස් එම උපකරණ නිපදවා නැවත ශ්‍රී ලංකාවට රැගෙන ඒම සිදුවිය.

එහෙත් දිනෙන් දින ඉහළ ගිය යුධ ගිනි දැල් හමුවේ සීඝ්‍රයෙන් වැඩි වූ තුවාලකරුවන් සංඛ්‍යාවත් සමග යුද්ධ හමුදාව වෙත දැරීමට සිදුවූ අධික පිරිවැයට ස්ථිර පිළියමක් වශයෙන් වර්ෂ 1992 ක් වූ ඔක්තෝබර් මස 10 වන දිනට යෙදුණු සුබ මොහොතින් රණවිරු සෙවණ රාගම හිදී "සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරය" ආරම්භ කෙරිණි.

එසේ ඇරඹුණු මෙම කාර්මිකාගාරයෙහි සේවය සඳහා යෙදවීමට මූලික වශයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙතින් වෘත්තිකයින් 04 දෙනකු ද, පසුව ගංගාරාමය තුළ

ස්ථාපිත කාර්මිකාගාරය වෙතින් වෘත්තිකයින් 05 දෙනකු ද යුද්ධ හමුදාව වෙත ඉඳුරාම බඳවා ගැනීම සිදුකරන ලදී. පසුව රණක්ෂිතයට පත්ව පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළින් සවිමත්ව ඒකකයන් වෙත නැවත ගොස් සිටි සෙනින් 10 දෙනකු සඳහා ද වෘත්තිය පුහුණුව ලබාදී ඍජුකාරක හා අංගාදේශක කාර්මික ශිල්පීන් වශයෙන් මෙම කාර්මිකාගාරය වෙත එක්කොට එහි සේවය තවදුරටත් සවිබල ගන්වන ලදී.



ඍජුකාරක හා අංගාදේශක කටයුතු ආරම්භ කරමින්

ඉන් අනතුරුව එම වෘත්තියෙහි යෙදවීම පිණිස 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙතින්ද සෙනින් 05 දෙනකු දේශීය හා විදේශීය පුහුණුව ලබාදී මෙම කාර්මිකාගාරය වෙත එක් කොට තවදුරටත් එහි සේවාව පුළුල් කිරීමට යෙදුනි. පසුකාලීනව ශ්‍රී ලංකාව තුළදීම මෙම වෘත්තිය සඳහා පුහුණුව ලබාදීම පිණිස ඍජුකාරක හා අංගාදේශක පුහුණු පාසලක්, රක්තවේදය හා පුනරුත්ථාපන රෝහල - රාගම හි ස්ථාපිත කළ අතර, වාර්ෂිකව සුදුසුකම් ලැබූ යුද්ධ හමුදා සෙබළුන් එම පාසල වෙත යොමු කොට කාර්මික ශිල්පීන් ලෙස පුහුණුව ලබාදී එම කාර්මිකාගාරයන්හි සේවය සඳහා යෙදවීම සිදු කරන ලදී.



නව ඍජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරය, රණවිරු සෙවණ - රාගම

පසුව වර්ෂ 2011 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින මෙම සේවාවන් තවදුරටත් පුළුල් කරමින් ගාලු පුරවරයෙහි පිහිටා තිබූ පෞද්ගලික ආයතනයක් වූ "දක්ෂිණ ආබාධිත මධ්‍යස්ථානය" එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත පරිත්‍යාග කිරීමෙන් පසු එය යුද්ධ හමුදාව වෙත ලබාදීමෙන් අනතුරුව යුද්ධ හමුදා ඍජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරය නැතහොත් "සැනසුම" නමින් ප්‍රතිස්ථාපනය කොට දකුණු පළාතේ සිටින සියලුම රණවිරුවන් සඳහා මුදල් අයකිරීමකින් තොරවත්



නව ඍජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරය, (සැනසුම) - ගාල්ල



උප කාර්මිකාගාරය - අනුරාධපුරය

දිවයිනේ නන් දෙසින් පැමිණෙන සිවිල් වැසියන් සඳහා ඉතා සහනදායි මිලකට ලබාගැනීම අවස්ථාව උදාකර දී ඇත.

එසේම පසුකාලීනව අත් හා පාද අහිමිව මෙන්ම වෙනත් ආබාධිත තත්වයන්ට පත්ව දිවයින පුරා විසිරී සිටින රණක්ෂිතයට පත් රණවිරුවන් සඳහා මෙම ක්ෂේත්‍රයෙහි සේවාවන් තවදුරටත් ඉතා පහසුවෙන් යුතුව ලබාගැනීම සඳහා අවස්ථාව සලසාදෙමින් ඍජුකාරක හා අංගාදේශක උප කාර්මිකාගාරයන් වර්ෂ 2020 ක්වූ සැප්තැම්බර් මස 15 වන දින සුවසහන මධ්‍යස්ථානය අභිමංසල 1 - අනුරාධපුර හා අභිමංසල 3 - කුරුණෑගලත්, පසුව වර්ෂ 2020 ක් වූ දෙසැම්බර් මස 01 වන දින වැල්ලවාය යන ස්ථානයන්හිදී ආරම්භ කිරීම සඳහා මේ වන විට ක්‍රියා කර ඇත.

තවත් එක් උපකාර්මිකාගාරයක් පල්ලේකැලේදී ආරම්භ කිරීම සඳහා ද මේ වනවිටත් සියලු කටයුතු සූදානම් කර ඇති බැවිද ඉතා සතුටින් යුතුව සටහන් තබමි.

සටහන-:
ඍජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරය "සැනසුම" - ගාල්ල



# තෘප්තිමත් හමුදා ජීවිතයක් සඳහා

# මනෝවිද්‍යාත්මක අත්වැලක්




සටහන -:
ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක ගරු,
(මනෝවිද්‍යා උපදේශක)


මෙම ලිපි මාලාවේ පළමු පියවර වශයෙන් පාඨක ඔබ අතට පත් කිරීමට අදහස් කරනු ලබන මෙම ලිපිය නිදහසේ කියවා ඔබේ හැඟීම් සහ අත්දැකීම් අප වෙත එවන්නේ නම් එමගින් තවත් එක් වීර සෙබලෙක් බිහිකළ හැකි බව මාගේ විශ්වාසයයි.

**"නිරෝගීමත් යහපත් මනසක්"** එය මාගේ අව්‍යාජ අදහසක්. එමෙන්ම මනෝවිද්‍යාවේ අර්ථ දැක්වීම අනුව මනෝවිද්‍යාව යනු සිතුවිලි සහ හැසිරීම යන දෙකෙහි විද්‍යාත්මක අර්ථ දැක්වීමකි. ඔබගේ සිතුවිලිවලට සමානව ඔබගේ හැසිරීම අන් අයට ප්‍රදර්ශනය වීමේදී යම් නොගැලපීමක් විද්‍යාමාන වන්නේනම් එය නිවැරදි කරගන්නේ කෙසේද ? ඒ සඳහා මනෝවිද්‍යාවේ කාර්යභාරය කවරේද ? යන්න මෙසේ සටහන් තබමි.

තෘප්තිමත්ව තම වෘත්තියේ යෙදීම සඳහා බලපානු ලබන ප්‍රධාන කාරණා අතර නිරෝගීමත් සෞඛ්‍ය තත්ත්වයක්, යහපත් රාජකාරී පරිසරයක් සහ ආදර්ශමත් පවුල් ජීවිතයක් තිබීම තුළින් ආතතියෙන් තොරව තම රාජකාරීන් කරගැනීමට හැකිවන බව ඔබ අප සියලුදෙනා පිළිගත යුතු සත්‍යයකි.

නිරෝගීමත් සෞඛ්‍ය තත්ත්වය පවත්වාගැනීම සඳහා ඔබ

විසින් දැනුවත් විය යුතුයි. යම් නිදන්ගත රෝග තිබේ නම්, ඒ සඳහා ප්‍රතිකාර ගැනීම, පවුල් පසුබිම තුළින් උරුම වේයැයි සැක සිතන ජානමය රෝග ඇත්නම් ඒ සඳහා සැලකිලිමත් වීම සහ ඔබ ඔබ ගැනම ධනාත්මකව සිතීම තුළින් නිරෝගීමත් කායික සහ මානසික තත්ත්වයක් ගොඩනගා ගැනීමට හැකිවන බව පෙන්වාදීමට කැමැත්තෙමි.

තවද, ඔබ ඔබ ගැන තෘප්තිමත් ද ? නොඑසේනම් අන්අය ඔබ ගැන තෘප්තිමත් ද ? එසේ තෘප්තිමත් නොවන්නේනම් එය කුමක් හේතු පාදක කරගෙන ද ? ඔබට අන් අය වෙනස් කළ නොහැකි නමුත් ඔබට ඔබව වෙනස් කළ හැකි බව තරයේ මතක තබාගන්න. දිනකට එක් වතාවක් හෝ ගෞරවාන්විතව ඔබ දෙස බලන්න. අන් අය ඔබ ගැන තෘප්තිමත් නොවන්නේ නම් ඒ කුමක් හෝ ඔබ සතු නොදත් හේතුවක් නිසාවෙනි. යම් දුර්වලතාවයක් ඔබ සතුනම් එය ක්‍රම ක්‍රමයෙන් ඔබගෙන් දුරස් කිරීම සඳහා අදිටන් කරගන්න. එසේ නොවේනම් ඔබ වෙත එන සියලුම ගැටළු සහ ප්‍රශ්න තාවකාලික බව යටි සිතින් සිතා සතුටු වන්න.

යහපත් රාජකාරි පරිසරයක් අනෙකාට උරුම කරදීමට ඔබට හැකි බව මතකයේ රඳවා තබා ගන්න. සෑම දිනකම ආරම්භයේම කුමක් හෝ කරුණක් අරඹයා රාජකාරියේදී තවකෙකුගේ යහපත වෙනුවෙන් කුමක් හෝ කරුණක් ඉටුකිරීමට සිතෙහි ධාරණය කරගන්න. වෘත්තීමය බැඳීම ප්‍රදර්ශනය වන ආකාරයට අනායයන්ව ආමන්ත්‍රණය කරන්න. අන් අයගේ ගරුත්වය ගැන සෑමවිටම සිතෙහි තබාගෙන රාජකාරියේ නියැලෙන්න. එවිට නිරාසයෙන්ම ඔබ අපේක්ෂා කරනු ලබන යහපත් රාජකාරි පරිසරයක් ඔබ වෙනුවෙන්ද ඉබේ ගොඩනැගෙන බව සිතෙහි තබාගන්න.

තෘප්තිමත් හමුදා ජීවිතයක් සඳහා ඔබගේ ආදර්ශමත් පවුල් ජීවිතයද උපකාරි වන බව ලිවිය යුතුම කරුණකි. ඔබට පැවරී ඇති රාජකාරි නොපිරිහෙලා ඉටුකිරීමට නම් ඔබගේ පවුල තුළින් ලැබිය යුතු සහයෝගය ලබාගැනීමට පෙරලා ඔබ විසින් තම බිරිඳ, දූවා දරුවන්, දෙමාපියන් ගැන හැකි සෑම අවස්ථාවකම සොයාබලා කටයුතු කිරීම, ඔවුන් පිළිබඳ තිබෙන අව්‍යාජ හැඟීම නිතර ප්‍රකාශ කිරීම ඔබගේ වෘත්තීමය ජීවිතයට ආශිර්වාදයක් වීම නොඅනුමානය. තවද, මේ සියල්ල පුරුදු පුහුණුවීම සඳහා එක්තරා කුඩා උපක්‍රමයක් ඔබට භාවිතා කළ හැකිය. කුඩා පොත් පිංචක් ගෙන දවසේ සියලු වැඩ රාජකාරි කිරීමේදී සිදුවූ අතපසුවීම් ලියා තබාගන්නටත් පසුදින එය කියවා බලා නැවත එය නොවන්නට ක්‍රියා කරන්නටත් සිතෙහි ධාරණය කරගන්නටත් උත්සාහ දරන්න.

අවසාන වශයෙන් ඔබේ ජීවිතයේ කැඩපත ඔබම විය යුතු බව දැඩි ලෙස සිතෙහි ධාරණය කරගන්න. අභිමානවත් ලෙස ඔබ ගැන සිතන්න. ප්‍රියමනාප ලෙස තම යුද හමුදා නිල ඇඳුම අඳින්න. එමෙන්ම අනායයන්ගේ ගෞරවය වෙනුවෙන් නිහතමානීව තම වගකීම ඉටු කරන්න.



## රාවණා

මියෙනු තුරු නොදැන සිටි
ඔබේ ඔය ප්‍රේමයම...
කියන්නෙම් මුළු ලොවට
හඬනගා වැළපෙමින්...
නුඹ තරම් කවුරුවත්
රැකගත්තේ නෑ මාව...
රාවනා ඇත්තමයි
නුඹ නියම පිරිමියෙක්...
මුළු ලොවම බය උනත්
ඔබේ ඔය තේජසට...
දැනුනේ නෑ මට බයක්
රැකගත් නිසා හැමවිටම...
රාමා ගැන සිත සිතා
හඬා වැටුනු කාලයම...
ඵලක් නැති දෙයක් බව
වැටහුනෙම් මෙමා හට...
ගිනි ගෙනම දැවෙන්නට
කළ ඒ ඇරයුමම...
ඇති මෙමට පෙම් බඳින්නට
ඔබේ ඔය ගුණකඳට...

ප්‍රේමයෙන් බැඳුනව සිටි රාමා සීතා ආදර අන්දරයේදී රාවණා විසින් සීතා පැහැරගෙන යාම සහ ඔහු විසින් සීතා කෙසේ රැකබලාගන්න ඇත්ද යන්න සහ සියලු දෙවීන් සහිපූජා කරන ලෙස බලකරන මොහොතේ රාමාගේ නිහැඬියාව නිසාවෙන් සීතාගේ සිත තුළ රාවණා පිළිබඳව කෙසේ නම් හැඟීමක් උත්පාදනය වන්නට ඇද්ද යන්න මෙසේ සටහන් තබනුයේ ඉතිහාසය වෙනස් කිරීමට නොව සත්‍ය වශයෙන් රාවණා පිළිබඳ මා සිත තුළ හටගත් ගෞරවාන්විත හැඟීම නිසාවෙනි.

- ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක




## අහිමි පිය සෙනෙහස...

මා පුංචි කල සුරතල් බැලූ ඔබ
සුළඟිල්ල අල්ලන් ඇවිද යන්න
දැන් මම ලොකුයි

ඔබ මගේ ලෝකයෙන්
සමු අරන් ගිය දිනේ පටන්
ලෝකයේ පියවරු දකින විට
හැගෙයි ඔබ මගේ හද මඩලට
මගේ හද ගැඹුරේ
නොනිවී දැල්වෙන පහන ඔබයි
පියාණනේ..

සෙ/284532 කෝප්‍රල් ආරියරත්න
එච්එච්පීපීඑස්ඩී
621 වන පාබල බලසේනාව

## නුඹ නමින් මා ලියූ...

නුඹ නමින් මා ලියූ
කවි පොතම කියවාලා
විඳුම් මම හැමදාක නුඹේ රුවම මවාලා
මට දුන්නු ආදරේ හදවතින් පෙරලා
රැකගනිම් පෙම්බරෝ
පණ උනත් පුදාලා..

හීනයක් වගේ මගේ හිතේ නුඹ
ඉන්නකොට ප්‍රේමයක් ලියැවුණා
සොහොයුරින් බැඳුනාකොට
මට අයිති නැති බවක් හිත නිතර කියනකොට
ගතින් දුර ගියා ඔබ ඇගේ හිත ගෙන ලඟට..

එක්වෙන්න බැරි උනත් මතු භවෙක කිසිදාක
මම විඳිමි හදවතේ ඉඩ ඇතොත් හැමදාක
නුඹ නමින් මා විඳූ ආදරේ විඳිදාක
ලය මැදින් තුරුළේ වී සුව විඳිමු හැම රෑක..

මධුමි ජයතුංග

## දෙවනි මව සහ පළමු දරුවා...

සෑම පිරිමියෙකුගෙම දෙවනි මව
තම බිරිඳයි
සෑම ගැහැණියකගෙම
තම පළමු දරුවා
තම ස්වාමි පුරුෂයායි..

සෙ/279935
කෝප්‍රල් ගුණසේකර පීඑම්එන්
1 ශ්‍රීලංසෙබ

## ඈ (සමස්ත කාන්තා පරපුර වෙනුවෙනි)

ලේ කැටියකි උපන් බිළිඳා කවුරුත් ද
ලෝ සත පවති වී ඒ අයුරින් නිබ ද
දියණිය පුතෙකු ලෙස නාමික විය ඉන්පසු ද
සිත ගොඩනැගෙයි දෙව්දියකට බෙදාගෙන

කරනා හැම දායකත් වැඩපළ අතරේ
ගැහැණිය දුවයි සුසුමක් හෙළනට කතරේ
දරුවන් වඩා හැඳූ මවට ද ඇඳ අඳුරේ
සොයුරිය බිරිඳ සොඳුරිය හැඳිනිඳ සොයුරේ

මග මග අඳුරු දුව්ලි දා බිඳු සමග
සටනකි නොපෙනෙනා සොඳුරු සපුව
වැගැරුණු දෙනෙන සව්කිරි බිඳු පුතු කුසට
ගිනි අවි අත දරාගෙව ඈ රට රකිනා ලෙසට

මල් ඉගිරුණු යාමේ අඩසඳ එළිය මැදින්
පැටවුන් නෙතු විහිදුවි නිරතුරු ඈගේ හඬින්
උණුසුම් බත සරිය ගෙන්වා ළිප ගිනි අතරින්
ඈ විය අම්මා පියවරු තරමට ද්‍රිරිදුන්

මධුෂා සපුමාලි

## මතක

කැලි කපන ගණඳුර ඒ අමාවක් රෑ
අප සිව්දෙස මුර තුවක්ක රාජකාරී රෑ
සද්ද බද්ද නොකර කිසිත් ගතකළ ඒ රෑ
බකුසු හිවල් නාද සතර වටින් ඇසුණු රෑ

එකවරටම ආ සද්දෙන් එළිය වුණා රෑ
වැලි කොට්ටවලට උණ්ඩ වැදී ඩිලුණා ඒ රෑ
බංකරයේ හැම තැනකම දෙදරුම් කෑ රෑ
ප්‍රති ප්‍රහාරවලට යමින් සටන් කෙරුව රෑ

අප අතරට වැටුණු යමක් පුපුරා ගිය රෑ
එකෙක් වැටුණි අනිකා හට තුවාල වුණු රෑ
අප දෙනා එකට සටන කරන් ගියා රෑ
අන්තිමේදි මා ඉතිරිව ඔහුද ගියා රෑ

අදත් අමාවක් දිගට නිවසෙ ඉන්න රෑ
එදා දවස සිහිවෙනවා මිතුරන් ගිය රෑ
අරන් ගියා මගෙ කතුලක් ඒ මුසල රෑ
උන් තියෙනා අරන් ගිහින් මා තනිකළ රෑ

ජනක මල්ලවආරච්චි
නියෝජ්‍ය විදුහල්පති
කිරිල්ලවල මධ්‍ය මහා විද්‍යාලය - කඩවත

## නුඹයි මගේ එකම ඔසුව...

ඉවසන්න බැරිවුණාම තනිකම
රිදුම් දෙන්නෙ නුඹත් ළඟ
නැති සාංකාව..
තදකරන් පපුවටම
උණුසුමින් සැනසෙන්න
හිත කොනිති ගසා
ඇදුම්කන හදවතට
මේ හැඟුම්බර වැඩී
මගබලන නෙත් අගට
ඇත්තමයි..
රිදුම් දෙන හදවතට
නුඹයි මගේ එකම ඔසුව..

සෙ/282134
කෝප්‍රල් මදුසංක ඩීජීඑන්
6 ශ්‍රීලංසෙබ

## අධිසීල උපසම්පදා ලද මොරොන්තුඩුවේ නන්ද හිමි

අම්මා තාත්තා හැරලා ආවේ මන් නිමට
පුංචි කාලෙ අම්මා මතක් වුණි සිතට
දන් වළඳනා විට අම්මා සිහිවිය සිතට
ලොකු සාදු ළඟට ආවා අම්මා විලසට

ඔවදන් දී හැදෙනා හැටි හරියට
පුංචි කාලෙ සිට හැදුවා හරියට
දෙමාපියන් නැති අඩුවක් දැනෙයි සිතට
නෙතට කඳුළු ආවත් පොඩි සාදුට

පුංචි බණක් දෙසුවා පුංචි සිතට
බණ ඇසුවා මී පැණි සේ දෙසවනට
අම්මා තාත්තා සේ සිටිනා ලොකු සාදුට
සතර වරම් දෙවි පිහිටයි ලොකු සාදුට

ලොකු සාදු කෙනෙක් වුණා පොඩි සාදු
තවත් හොඳට ඉගෙන ගන්න පොඩි සාදු
රටට දැයට වැඩ කරන්න පොඩි සාදු
ගමටම සෙත සාදන්න පොඩි සාදු

දුග වැඩි බැහැ මින් ඉදිරියට
වෙල් යායේ සෙල්ලම් බැහැ පොඩි සාදුට
සාමණේර කමෙන් මිදුන පොඩි සාදුට
බුදු සරණයි අපේ නන්ද පොඩි සාදු

සමාජයේ හරි හැටි ජීවත් වන්න
ගත දැවටෙයි කහ සිවුරක් මතක තියා ගන්න
ලොකු සාදුගෙ ඔවදන් සැමදින පිළි ගන්න
ශීලයේ අගතැන්පත් වුණා මතක තියා ගන්න

ගමේ කෙනෙක් කීව දෙයක් එපා මග හරින්න
ගමේ දෙයක් පොඩි සාදුගෙ වගේ කරල දෙන්න
මෙතනට ගෙන ආ සියල්ල එපා මග හරින්න
බුදුන් ලෙසම කළගුණ හොඳ හැටි සලකන්න

සීලයෙන් අගතැන්පත් වුණා පොඩි සාදු
කෝටියක් සීලයෙන් තැන්පත් වුණා සාදු
රෑ නිදි මරා පාඩම් කරලා පොඩි සාදු
උපසම්පදා වුවා අපේ නන්ද පොඩි සාදු

එම්වල් සුචිත්‍රා
නොමේරූ ළදරු ඒකකය
ශුද්ධ හමුදා රෝහල - නාරාහේන්පිට


## ඔබ යළිත් එනවාද...

දෙනුන් දිනයක් පුරා
ආකාශයෙන් වැටුණා
මහා රළු වරුසා
හීන් පිණි පොදක් සේ

මා සිතට දැනුණා ඔබ
මහ මායාවන් මෙහි දුටු
සොඳුරු සිහිනයක් ලෙස
ඔබ මැවිය අයුරු

නොහැක මා අදහන්න
සිත් අහස පුරා
ගෙලු කරුවල මැදින්
සොඳුරු මැදියාමෙහි
සිහිනයක් ලෙසින් හෝ
ඔබ යළිත් එනවාද

සෙ/277428
සංසෙ මිරිස් පීපීආර්
11 ශ්‍රීලංසෙබ




# මෙරට තිබූ යුද්ධය පසුබිම් කොට ගනිමින් ප්‍රශස්ත මට්ටමේ යුද චිත්‍රපටයක් නිර්මාණය කිරීමේ සිහිනයක් තවමත් මගේ සිත තුළ පවතිනවා...

– ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ උදයකාන්ත වර්ණසූරිය

රන්දිය දහර, රාජ්‍ය සේවය පිණිසයි, ගිනි අවි සහ ගිනි කෙලි, ආසයි මං පියාඹන්න, පායා එන්න හිරු සේ, හිරි පොද වැස්ස , යකඩ පිහාටු, රන් කෙවිට, බහු භාර්යා, රෝස වසන්තයේ, දිය යට ගින්දර, වැලෙන්ජස් යන ආදී මෙරට ජනප්‍රිය චිත්‍රපට රැසක අධ්‍යක්ෂකවරයා වන ප්‍රවීණ සිනමාවේදී උදයකාන්ත වර්ණසූරිය මෙරට වාණිජ සිනමා දහරාවේ අද්විතීය ස්ථානයක් හිමිකරගත් ප්‍රතිභාපූර්ණ සිනමා අධ්‍යක්ෂකවරයෙක්. මෙවර පුවත්පත් පිළිසඳරක් වෙනුවෙන් අප ඔහු සම්බන්ධ කර ගනු ලැබුවේ ඔහු විසින් අධ්‍යක්ෂණය කරන ලද යුද හමුදාවට සම්බන්ධ කතා පුවතක් රැගත් සිනමා පටයක් වන "රන්දිය දහර' සිනමා පටය පිළිබඳව සමාලෝචනයක නියැලීමටයි. එහිදී, විවිධ පැතිකඩයන් ඔස්සේ අප නගන ලද ප්‍රශ්න හා ඒ සම්බන්ධයෙන් ඔහු ලබා දුන් පිළිතුරු ඇසුරෙන් මෙන්ම "රණවිරුවා" පාඨක ඔබ සැමගේ රසාස්වාදය වෙනුවෙන් මෙම විශේෂාංග ලිපිය සකස් කෙරිණි.



සංවාද සටහන -:
ලුතිනන් දුමින්ද සෙනරත්
ශ්‍රීලයුපොදුසෙබ,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

**ප්‍රශ්නය :-** දෙවන ලෝක යුද්ධය නිමාවීමත් සමගම, ඒ හා බැඳුණු සිදුවීම් ප්‍රස්තුත කරගනිමින් අති විශාල වශයෙන් සිනමා නිර්මාණ බිහිවීම මුළු ලොව පුරාම සිදුවුණා. නමුත් පුරා තිස් වසරක යුද්ධයක් තිබූ ශ්‍රී ලංකාව තුළ යුද හෝ පශ්චාත් යුද සමය විදහා දැක්වෙන අන්දමේ නිර්මාණ බිහිවීම සිදුවී ඇත්තේ ඉතා අල්ප වශයෙන්. ඔබ දන්නා අන්දමට මේ තත්ත්වයට හේතුව කුමක් ද ?

**පිළිතුර :-** දෙවන මහා ලෝක යුද්ධය අලලා යුද චිත්‍රපට බොහොමයක් හැදුණත් තිස් වසරක් පුරා මෙරට පැවතුණු ඊළාම් යුද්ධයට සාපේක්ෂව ශ්‍රී ලංකාව තුළ නිර්මාණය වූ චිත්‍රපට සංඛ්‍යාව ඉතාමත් අල්ප බව මා පිළිගන්නවා. කෙසේ වුවත්, එලෙස ඉතාමත් අල්ප වශයෙන් චිත්‍රපට නිර්මාණය වීමට හේතු කිහිපයක් මා දකිනවා. මේ යුද්ධයට හේතු වූ කරුණු කාරණා සියල්ලම විමසීමට ලක් කිරීමේදී මෙම යුද්ධය අප පැහැදිලිවම දකින්නේ මෙරට වෙසෙන අපේම ජන කොට්ඨාස දෙකක් අතර සිදුවූ ගැටුමක් ලෙසයි. තවදුරටත් විස්තර කරනවා නම් එය ශ්‍රී ලාංකිකයන් අතර ඇති වූ ප්‍රශ්නයක්. එමෙන්ම මෙම යුද්ධයට මැදි වූ සියලු දෙනාම ශ්‍රී ලාංකිකයන් වන නිසාවෙන් මෙම කරුණු අලලා චිත්‍රපටයක් නිර්මාණය කිරීමේදී විවිධ සමාජයීය සහ සදාචාරාත්මක ගැටලු පැන නැගෙනවා. විශේෂයෙන් එකිනෙකා මුහුණට මුහුණලා සිදුකරන සටනකට වඩා කලා නිර්මාණයක් ලෙස චිත්‍රපටයක් බිහි කිරීමේදී මෙම මානුෂික ගැටළුවට මුහුණදීමට නිර්මාණකරුවන්ට සිදුවෙනවා. ඉන්පසු විවිධ වාරණ ගැටලුද පැන නගිනවා. මේ නිසා මේ සෑම කරුණක්ම නිවැරදිව තෝරා බේරාගනිමින් තිර රචනයක් නිර්මාණය කර චිත්‍රපටයක් තැනීම ඉතාමත් අභියෝගාත්මක කටයුත්තක් ලෙස මා දකිනවා. ඒ කාරණය කෙසේ ජය ගත්තත් තවත් අසීරු කාරණයක් වන්නේ යුද්මය චිත්‍රපටයක් නිර්මාණය කිරීමේදී විශාල බරපැනක් දරන්නට සිදුවීමයි. තවමත් අපට අපේ චිත්‍රපට සඳහා හරිහැටි ජාත්‍යන්තර වෙළෙඳ පොළක් නැහැ. එබැවින් එවැනි අති විශාල මූල්‍ය පිරිවැයක් දරමින් නිපදවන චිත්‍රපටයක් තුළින් එහි මූලික නිෂ්පාදන වියදම වුවත් පියවා ගත හැකිද යන අවිනිශ්චිත සැකයක් අපට තිබෙනවා. ඉතින් මෙරට ඇති වූ යුද්ධය තේමා කරගනිමින් චිත්‍රපට විශාල වශයෙන් නිර්මාණය නොවීමට ඔය සඳහන් කළ කරුණු කාරණා බොහෝ සෙයින් බලපාන්නට ඇති බවත් මට සිතෙනවා.

**ප්‍රශ්නය :-** ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම සිනමාකරුවකු වන ඔබ නිර්මාණය කළ සිනමා පට විශාල ප්‍රමාණයක් ප්‍රේක්ෂකයන් ඉතා ආදරයෙන් වැළඳ ගනු ලැබුවා. එමෙන්ම ශ්‍රී ලංකා යුද හමුදාව සබැඳිව කතා කෙරෙන සිනමා පටයක් වූ "රන් දිය දහර" සිනමාපටයේ අධ්‍යක්ෂකවරයාද ඔබයි. එවැනි කතා පුවතක් රැගත් චිත්‍රපටයක් නිර්මාණය කිරීමට ඔබ පෙලඹුණේ ඇයි ?

**පිළිතුර :-** "රන් දිය දහර" යනු මගේ සිනමා ජීවිතයේ මා ලද සුන්දරම සිහිවටන සහිත සොඳුරු අත්දැකීමක්. මෙම චිත්‍රපටය නිර්මාණය කිරීමට මූලික වශයෙන් හේතු වූයේ ඒ සඳහා හේතු පාදක වූ සත්‍ය සිදුවීම් කිහිපයක්. මෙම චිත්‍රපටය ඊළාම් යුද්ධයට ඍජුවම සම්බන්ධයක් ඇති හෝ එය විශ්ලේෂණය කරන චිත්‍රපටයක් ලෙසින් මා දකින්නේ නැහැ. එනමුත් පුරා දශක තුනකට නොඅඩු කාලයක් මෙරට පැවති එම යුද්ධයේ දී කුරිරු ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට හසුවී දැඩි අමානුෂික වධ බන්ධනවලට මුහුණදී සිහි විකල් තත්ත්වයට පත්වූ සිංහල හමුදා නිලධාරියකු කේන්ද්‍ර කරගත් චරිතයක් වටා මෙම චිත්‍රපටයේ කතා තේමාව ගොඩනැගී තිබුණා. මෙම චිත්‍රපටියේ එකී හමුදා නිලධාරියාගේ චරිතය

**යුද හමුදාවේ කීර්තිමත්භාවය විදහා දැක්වෙන මෙන්ම ධෛර්යවත් යුද සෙබළුන් පිළිබඳව ඇත්ත වශයෙන්ම යුද සිනමා නිර්මාණ බිහිවිය යුතුයි. නිදසුනක් ලෙස මෙරට තිස් වසරකට ආසන්න කාලයක් පුරා එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමඟ පැවැති මානුෂික මෙහෙයුමේ දී මව්බිම වෙනුවෙන් දිවි පිදූ හසලක ගාමිණී වැනි වීරෝදාර සෙබළුන් පිළිබඳව මොන තරම් විශිෂ්ට සිනමා නිර්මාණයක් සිදුකළ හැකිද, කෙසේ වුවත් චිත්‍රපට කතා රචකයන්ගේ නිර්මාණ හැකියාවත් මේ සඳහා අත්‍යවශ්‍ය සාධකයක්.**

නිරූපණය කරන ලද්දේ ප්‍රවීණ සිනමා රංගන ශිල්පියකු වන කමල් අද්දරආරච්චියි.

මෙම චිත්‍රපටය කිසියම් ආර්ථික පීඩනයක සිටින ගැහැණියක් එයින් ගැලවීම සඳහා අවශ්‍ය මුදල් සෙවීමට ගන්නා අවදානම්





උත්සාහයක් පිළිබඳව මැනවින් විවරණය කරන අනුවේදනීය හා ත්‍රාසජනක සිද්ධීන් ඇතුළත් කතාවක් සහිත චිත්‍රපටයක්. කෙසේ නමුත් චිත්‍රපටය අවසානයේ ඇයට ලැබෙන්නේ මුදල් නොව ආදරය සෙනෙහස හා ආරක්ෂාවයි. විශේෂයෙන් මෙම කතා පුවත සමාජයේ පැතිරී තිබෙන දූෂණ හා අක්‍රමිකතා හෙළි කරන්නක් මෙන්ම යුද්ධයේ ඇති කටුක යථාර්ථය පිළිබඳවද මැනවින් පිළිබිඹු කෙරෙනවා. එමෙන්ම මෙම චිත්‍රපටයේ කමල් අද්දරආරච්චි සමගින් ගීතා කුමාරසිංහ, ජැක්සන් ඇන්තනි, මහේන්ද්‍ර පෙරේරා, සනත් ගුණතිලක, ටෝනි රණසිංහ, ජීවන් කුමාරණතුංග, හෙන්රි ජයසේන, අනුලා කරුණාතිලක, උදුලා දාබරේ, බුද්ධික ජයරත්න, මිල්ටන් ජයවර්ධන වැනි ප්‍රවීණ නළු නිළියන් සිය රංගන දායකත්වය ලබා දුන්නා. එමෙන්ම එකළ පැවති විවිධ සිනමා සම්මාන උළෙලවල්වල දී ගීතා කුමාරසිංහ, ජැක්සන් ඇන්තනි, මහේන්ද්‍ර පෙරේරා හොඳම නළු නිළියන් සහ හොඳම සහය නළුවන් වශයෙන් සම්මානයට පවා පාත්‍ර වුණා.

කෙසේ වුවත් "රන් දිය දහර" චිත්‍රපටය මෙරට සිනමා ශාලාවල ප්‍රදර්ශනය වුණේ 2004 වසරේ දෙසැම්බර් මස 19 වන දිනයි. ඊට සතියකට පසු සුනාමි ව්‍යසනයට මේ රට මුහුණ දුන්නා. එබැවින් එකී කාලවකවානු තුළ මෙරට සිනමා ශාලා තුළ චිත්‍රපට ප්‍රදර්ශනය පිළිබඳව බරපතළ ගැටලුවලට මුහුණදීමට චිත්‍රපට නිෂ්පාදකයන්ට සිදුවුණා. ඒ නිසාවෙන් ම "රන්දිය දහර" චිත්‍රපටිය එකල ප්‍රේක්ෂක අවධානය තුළින් ගිලිහී ගියා. එය එහි අධ්‍යක්ෂකවරයා වශයෙන් මමත්, එහි නිෂ්පාදකවරයාත් ලැබූ ඉතා අමිහිරි අත්දැකීමක් වුනා. කෙසේ වුවත් "රන්දිය දහර" චිත්‍රපටය මගේ සිනමා ජීවිතයේ එක්තරා කඩඉමක් ලෙස මා දකිනවා. එමෙන්ම මම මෙතෙක් සිදුකළ සිනමා නිර්මාණ අතුරින් ප්‍රශස්තම නිර්මාණය ලෙස "රන්දිය දහර" චිත්‍රපටිය බොහෝ සිනමා විචාරකයන්ගේ ඇගයීමට ලක්ව තිබුණා .

**ප්‍රශ්නය :-** ශ්‍රී ලාංකික සිනමාකරුවන් බොහොමයක් යුද සාහිත්‍යය පිළිබඳව කතා කෙරෙන චිත්‍රපට නිර්මාණය කරනුයේ ඉතාමත් අවම වශයෙන්. එසේ චිත්‍රපටයක් නිර්මාණය කළත් ඇතැම් සිනමාකරුවන් ඔවුන්ගේ නිර්මාණයන් තුළින් ශ්‍රී ලංකා යුද හමුදාවේ කීර්ති නාමයට හානි කරන අන්දමේ නිර්මාණයන් කිරීමට කටයුතු කරනු දක්නට ලැබෙනවා. ශ්‍රී ලංකාවේ වාණිජ දහරාවේ ජනප්‍රියතම සිනමා අධ්‍යක්ෂකවරයකු වන ඔබ මේ තත්ත්වය දකින්නේ කෙසේ ද ?.

**පිළිතුර :-** පුරා දශක තුනක් මෙරට පැතිර ගිය ඊළාම් යුද්ධය සම්බන්ධයෙන් මෙරට නිර්මාණය වී ඇත්තේ ඉතාමත් අල්ප වූ චිත්‍රපට සංඛ්‍යාවක් ඒ බව මමත් පිළිගන්නා කරුණක්. එමෙන්ම එම චිත්‍රපටවලිනුත් බොහොමයක් චිත්‍රපට සාර්ථක ගණයේ සිනමා නිර්මාණයන් ලෙස සැලකිය නොහැකි බව බොහෝ දෙනකුගේ මතයයි. විශේෂයෙන්ම රටක ආරක්ෂාව උදෙසා හමුදාවක් පැවතීම සමාජීය හා මානුෂික අවශ්‍යතාවක් ලෙස සලකනු ලබනවා. හමුදා නිලධාරීන්ගේ කීර්ති නාමය ඔසවා තැබීම හෝ කෙලෙසීම නිර්මාණකරුවන්ගේ අවශ්‍යතාවයන් මත හෝ නිර්මාණ හැකියාව මත බොහෝ විට සිදුවිය හැකියි. එම නිසා ප්‍රශස්ත මට්ටමින් යුද සිනමා පටයක් නිපදවීම ඉතාමත් භාරදූර හා අවදානම් අභියෝග යක් බව මා මුලින්ම සඳහන් කළේ මෙන්න මේ කරුණු කාරණා නිසාවෙන් .

තවද, හොඳ යුධ චිත්‍රපටයක් නිර්මාණය කිරීම හරවත් කලා නිර්මාණයක් මිස ජනප්‍රිය ආකෘතියේ සිනමාපටයක් ලෙසින් සිදුකිරීම ඉතාමත් අසීරු කටයුත්තක්. එමෙන්ම හොඳ යුධ චිත්‍රපටයක් නිර්මාණය කළ හැක්කේ අතිශයින් මානුෂික බැඳීම් සහිත සංවේදී නිර්මාණ කටයුත්තක් ලෙසිනුයි. ඒ නිසා මෙරට මූලික ජන විඥාන ප්‍රවාහය අමතක කර යුද චිත්‍රපටයක් පමණක් නිර්මාණය කිරීමට ගියහොත් එම නිර්මාණකරුවා සිනමාකරුවෙක් ලෙසින් අසාර්ථකත්වයට පත් වෙනවා. ඒ නිසා එවැනි ව්‍යාජ ප්‍රබුද්ධ නිර්මාණ කිරීමට නිර්මාණකරුවකු වශයෙන් මගේ කිසිම කැමැත්තක් නැහැ. කෙසේ වුවත් මෙරට තිබූ යුද්ධය පසුබිම් කොට ගනිමින් ප්‍රශස්ත මට්ටමේ යුද චිත්‍රපටයක් නිර්මාණය කිරීමේ සිහිනයක් තවමත් මගේ සිත තුළ පවතිනවා. එහෙත් අද රට මුහුණපා තිබෙන දරුණු සමාජ හා ආර්ථික අර්බුදයන් මධ්‍යයේ එම සිහිනය කවදා සැබෑවේ දැයි දැන්ම අනාවැකි කීමට හැකියාවක් නැහැ.

**ප්‍රශ්නය :-** කමාන්ඩෝ (*Commando*), රැම්බෝ (*Rambo*), *The Delta Force*, *The Air Force One*, *Operation Daybreak*, *Tour of Duty* වැනි බොහෝ හොලිවුඩ් චිත්‍රපට තුළින් ඇමරිකා එක්සත් ජනපද යුද හමුදාවන්හි ප්‍රෞඩත්වය හා වීරත්වය පිළිබිඹු කෙරෙනවා. එමෙන්ම එවැනි නිර්මාණ සිදුකිරීමට එම රටවල පවත්නා රජයන් මගින්ම එම සිනමා කරුවන්ට අනේකවිධ පහසුකම් සලසා තිබෙනවා. නමුත් තිස් වසරක මානුෂික මෙහෙයුමක් විජයග්‍රහණය කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කීර්ති නාමය පිළිබිඹු කෙරෙන චිත්‍රපට ඉතා අතළොස්සක් පමණක් නිර්මාණය වීමට හේතුව ඒ වෙනුවෙන්, පවත්නා රජයන්හි හෝ යුද හමුදාවන්ගේ මැදිහත් වීම හා සහයෝගය නොලැබීම ද ? නැතහොත් ඒ සඳහා ප්‍රස්තුත කතා පුවත් හෝ නිමිත්තක් නොමැති වී යාම ද ?

**පිළිතුර :-** ඔබ කියන අන්දමේ යුද ප්‍රෞඩත්වය විදහා දැක්වෙන අන්දමේ චිත්‍රපට නිර්මාණයන් ඉන්දීය සිනමාව තුළ මා දකිනවා. නමුත් ඔවුන් ඒවා ඉදිරිපත් කරන්නේ ජනතාවට වඩාත් සමීප වූ ජනප්‍රිය ධාරාව තුළ සිටයි. එමෙන්ම බොහෝ විට එවැනි චිත්‍රපට තුළ දැකගත හැකි වන්නේ අතිශයෝක්තියෙන් වීරත්වය ආරෝපණය කරන ලද චරිතයි. නිදසුනක් වශයෙන් රැම්බෝ චිත්‍රපටිය ගෙන බැලුවහොත් රැම්බෝ යුද සෙබළකු වුවත් යුද්ධයේ අනිටු ප්‍රතිඵල නිසා දැඩි මානසික පීඩනයට පත් මිනිසකු සිදුකරන අරගලයක් පිළිබඳ අතිශය ත්‍රාසජනක මෙන්ම අනුවේදනීය කතා පුවතක්.

එමෙන්ම යුද්ධය හා සම්බන්ධ සංවේදී චිත්‍රපටයක් නිර්මාණය කිරීමේ දී ඊට රජයෙන් ලැබෙන අනුග්‍රහය පිළිබඳව සෑහීමකට පත් වන්නට බැහැ. විශේෂයෙන් යුද්ධයේ උත්කර්ෂවත් බව විදහා දැක්වෙන චිත්‍රපට නිර්මාණය කිරීම සඳහා ඇතැම් විට සැලකිය යුතු මට්ටමේ පහසුකම් ලැබෙනවා ඇති. එමෙන්ම යුද්ධ හමුදාවේ කීර්තිමත්භාවය විදහා දැක්වෙන මෙන්ම ධෛර්යවත් යුධ සෙබළුන් පිළිබඳව ඇත්ත වශයෙන්ම යුද සිනමා නිර්මාණ බිහිවිය යුතුයි. නිදසුනක් ලෙස මෙරට තිස් වසරකට ආසන්න කාලයක් පුරා එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමග පැවැති මානුෂික මෙහෙයුමේ දී මරබිම වෙනුවෙන් සිය දිවි පිදූ හසලක ගාමිණී වැනි වීරෝදාර සෙබළුන් පිළිබඳව මොන තරම් විශිෂ්ට සිනමා නිර්මාණයක් සිදුකළ හැකිද, කෙසේ වුවත් චිත්‍රපට කතා රචකයන්ගේ නිර්මාණ හැකියාවත් මේ සඳහා අත්‍යවශ්‍ය සාධකයක්.

**ප්‍රශ්නය :-** ඔබ දකින අයුරින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිමානය හා කීර්තිය ඔප් නැංවෙන අයුරින් චිත්‍රපට බිහි කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රජය මගින් හෝ යුද්ධ හමුදාව

මගින් සිනමා කරුවන්ට ලබා දිය හැකි පහසුකම් හා සේවාවන් මොනවාද ?

**පිළිතුර ː-** දැනට ඇති ක්‍රියා පටිපාටියට අනුව යුද්ධ චිත්‍රපටියක් කෙසේ වෙතත් වෙනත් චිත්‍රපටයක දර්ශනයක් රූ ගත කිරීම වෙනුවෙන් හෝ ගිනි අවියක් ලබාගැනීම පවා ඉතාමත් අසීරු කටයුත්තක්. විශේෂයෙන්ම ඒ සම්බන්ධයෙන් බොහෝ අත්දැකීම් මා ලබා තිබෙනවා. එවැනි ප්‍රාථමික පහසුකමක්වත් දැනට රජයෙන් ලැබෙන්නෙ නෑ. මේ නිසා යුද්ධය තේමා කරගනිමින් චිත්‍රපට නිෂ්පාදනය කරනවානම් ඒ සඳහා අවශ්‍ය වන යුද හමුදා නිල ඇඳුම් පැළඳුම් මෙන්ම ගිනි අවි සහ යුද මෙවලම් ආදිය ඉතා පහසු ක්‍රමවේදයක් තුළින් ලබාගැනීමට සිනමාකරුවන්ට ඉඩ ප්‍රස්ථා සලසා දිය යුතුයි. විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ සිනමාකරුවාට නිදහසේ තම චිත්‍රපටය නිර්මාණය කිරීම සඳහා එකී නිර්මාණ නිදහස ලබාදීම ඉතා වැදගත් කරුණක් බවයි. මා එසේ කියන්නේ යුද අවි සමග හමුදා සහාය ලබාගැනීම සඳහා චිත්‍රපට කතාවේ තිර පිටපත රජයෙන් අනුමත කරගැනීමේ ක්‍රියා පිළිවෙතක් ද ඇති නිසයි.

**ප්‍රශ්නය ː-** දශක තුනකට නොඅඩු කාලසීමාවක් පුරා මෙරට ජනතාව භීතියට පත්කළ කුරිරු එල්ටීටීඊ ත්‍රස්තවාදය පරාජය කරමින් මව්බිමේ ඒකීයභාවය උදාකළ ශ්‍රී ලංකා යුද හමුදාව මගින් සිදුකළ සේවාව කෘතහස්ත සිනමාකරුවකු ලෙස ඔබ දකින්නේ කෙසේ ද ?

**පිළිතුර ː-** මගේ ජීවිතයේ තරුණ කාලය ගෙවී ගියේ තිස් වසරක් තිස්සේ පැවති මෙම කුරිරු යුද්ධයේ අප්‍රසන්න සිදුවීම් සමගයි. ඇත්තෙන්ම මා ඇතුළු මෙරට ජනතාව යුද්ධය නිසා ලැබූ දැඩි මානසික පීඩනයකුත් සමගය. එකල ජීවිතය ගත කළේ, ඒ වගේම ලංකාව දෙකඩ කිරීමට උත්සහා කිරීමට තරම් වැරදි කරුණු කාරණා ඇතැම් ද්‍රවිඩ කණ්ඩායම්වලට තිබූ බවක් මා පිළිගන්නේ නැහැ. යම් කරුණු කාරණා සිදුවීම් තිබුණත් ද්‍රවිඩ ජනතාව තලාපෙලා දමන්නට තරම් සැහැසි වූ පිරිසක් නොවෙයි සිංහල ජනතාව. එබැවින් මෙම යුද්ධය ජාත්‍යන්තර කුමන්ත්‍රණ සමග පෙළගැසී සිටින ත්‍රස්තවාදී පිරිසකගේ ඕනෑ එපාකම් මත සිදුවූ අවස්ථාවාදී ක්‍රියාවක් ලෙසයි මා දකින්නේ. සත්‍ය වශයෙන්ම කුරිරු ත්‍රස්තවාදීන් ගේ පීඩනයෙන් මෙරට ජනතාව නිදහස් කොට දිවි පරදුවට තබා සටන් කළ යුද්ධ හමුදාව ඇතුළු ත්‍රිවිධ හමුදාවන්හි සියලුම නිලධාරීන් ඇතුළු සෙසු නිලයන් වෙත මාගේ අවංක ආදර ප්‍රණාමය පුද කිරීමට මා මෙය අවස්ථාවක් කොට ගන්නවා.

**ප්‍රශ්නය ː-** අවසන් වශයෙන් ඉදිරි කාලසීමාවන් තුළ ඔබ විසින් අධ්‍යක්ෂණය  කිරීමට නියමිත සිනමා නිර්මාණයන් පිළිබඳව යමක් සඳහන් කළොත් ?

**පිළිතුර ː-** මා මේ වන විට "ගින්දරී -3" සහ "රිදී සිනු" නමින් සිනමා පට දෙකක් නිර්මාණය කොට ප්‍රදර්ශනය වෙනුවෙන් පෙළ ගස්වා තිබෙනවා. එමෙන්ම මා විවිධ වූ මාතෘකාවන් ඔස්සේ  චිත්‍රපට තිර කතා රැසක් ද ලියා තිබෙනවා. එයිනුත් "ගිනි අවි" සහ "ගිනි කෙලි -2" යන තිර පිටපත් සුවිශේෂීයි. රටේ වත්මන් අර්බුදකාරී තත්ත්වය සමනය වී අස්වැසිල්ලක් ලැබූ පසු එම  තිර පිටපත් ආශ්‍රයෙන් චිත්‍රපට නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

# විරු දිරියෙන් සෙවණ සැදී වගයි



122 වන පාබල බලසේනා බලප්‍රදේශයට අයත් කාවන්තිස්සපුර පදිංචි අඩු ආදායම්ලාභී පවුලක් වන එස්එච් සුවඳරත්න මහතා හට නිවසක් ඉදිකර භාරදීමේ කටයුතු 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 19 වන දින සිදුකරන ලදී. මෙම සත්කාරය සඳහා ඓතිහාසික කතරගම දේවාලයේ බස්නායක නිලමෙ තුමන්ගේ අනුග්‍රාහකත්වය ලැබී තිබිණ. 122 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් පීකේඩබ්ලිව්ඩබ්ලිව්එම්ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භටපිරිස් විසින් එහි ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූහ.



හයවන උපන් දිනය සැමරූ
**විධූෂ ට්‍රිශේන්**
(සෙ/11සිහු01930 කෝප්‍රල් සේනාරත්න කේඩීජේ 11 ශ්‍රීලංජාආබමු)



පසුගියදා උපන් දිනය සැමරූ
**පැහැසර හා දිනෙත් ත්‍රිලක්ෂණ**
(සෙ/21ජ00241 කෝප්‍රල් රත්නසිරි ඒඑච්බීජේ 2 ගරෙ)



හත්වන උපන් දිනය සැමරූ
**විනුක ගවීෂ**
(මේජර් ආර්එම්ජ්බී රත්නායක පිපඅම)



පස්වන උපන් දිනය සැමරූ
**ඉමේෂ ශස්මිත**
(සෙ/21ජ00561 කෝප්‍රල් කුමාර ටීඑම්ජේපී 2(සෙව්) ගරෙ)



හතරවන උපන් දිනය සැමරූ
**ගෞරව රන්සිත**
(සෙ/752158 බහි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ)



දහවන උපන් දිනය සැමරූ
**සඳලි චේතනා**
හා තුන්වන උපන් දිනය සැමරූ
**දිනිත් ඉඳුසර**
(සෙ/2ඕ01710 කෝප්‍රල් කරුණාතිලක එච්ජ්එන්පී 2(සෙව්) ශ්‍රීලයුපොදුසේබ)



හත්වන උපන් දිනය සැමරූ
**උපේක් සෙන්හිරු**
(ලුතිනන් කර්නල් ජීඩී විමලසිරි ආර්එස්පී ලයා වේවිස් කල්කුඩා)





හතරවන උපන් දිනය සැමරූ
**ඩික්ෂිත්‍යා සුහස්නා**
(මේජර් එම්එස්එබ්‍යු මොරපිටිය සොසේඅජේකා)



දෙවන උපන් දිනය සැමරූ
**සවින්‍යා මෙත්සිළුනි**
(මේජර් ඩීඩීඑස් ලොකුකැටගොඩ පාපුමා මින්නේරිය)

# හිරු තරු සේ දිලෙන විරු දරු සැමරුම්

මල් කැකුළු වන් රණවිරු දූවා දරුවන්ට සුව සැපත, ජය සතුට පිරි වාසනාවන්ත උපන් දිනයකට "රණවිරුවා" මෙලෙස සුබ පැතුම් එක්කරයි.



# නළලත සිඹින්නද තිලකය වැළකෙන ලෙස...



සටහන:
ලුතිනන් කර්නල්
සුජීව් චමින්ද එදිරිසිංහ

"මරපාලම්" කඳවුර පිහිටියේ මඩකලපු දිස්ත්‍රික්කයේ "චෙංකල්අඩි" සිට "මහඔය" දක්වා දිවෙන A -5 ප්‍රධාන මාර්ග යට යාබදය. අතිශය දුෂ්කර පරිසරයක පිහිටි එම කඳවුරෙහි මා රාජකාරි නිරතව සිටි කාලවකවානුව 1993 තරම් ඈතට දිවෙන අතර, එවක මා 2/ ලුතිනන් නිලයේ පසුවිය. ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් බහුලව පැවති ප්‍රදේශයක පිහිටි එම කඳවුර අවට ලඳු කැලෑවලින් ගහන වූ අතර කැඩී බිඳී අතැර දැමූ නිවාස කිහිපයක් හැරුණු විට කඳවුරට යාබද කිසිවකු පදිංචිව නොසිටියේය. එහෙත් ප්ප්‍රන දුරින් ගම්මානයක් වූ අතර එහි සිට යනෙන ජනතාව කඳවුරට යාබද මාර්ගයේ නිරතුරු ගමන් කරනු දැකිය හැකි විය. එසේම කඳවුරට පිවිසෙන මාර්ගය අසලම ප්‍රදේශයේ ජනතාව සුලභව රැඳුණු කෝවිලක්ද පිහිටා තිබුණි.

බොහෝ දරිද්‍රතාවයෙන් පෙළුණු එම ප්‍රදේශයේ ජනතාව යුද්ධයේ අතරමැදි පාර්ශ්වකරුවන් ලෙස වැඩිපුරම පීඩාවිඳි කොටසකි. ගොවිතැන, ධීවර කර්මාන්තය, ගව පට්ටි පාලනය හා දර කැපීම එම ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වූ අතර ඉන් පරිබාහිර රැකියාවක නිරත වන අයෙකු සිටියේනම් ඒ ඉතාමත් කලාතුරකිනි. කෙසේ වුවද උත්සාහවන්තව ජීවිතයට මුහුණ දුන් එහි ජනතාව තුළ වූයේ අසීමිත ආගමික භක්තියකි. එනිසාම කඳවුරට යාබද කෝවිලේ කටයුතු සඳහා ඔවුනු සෑම අයකුගේම පැමිණීම අනිවාර්යයෙන් සිදුවිය. එසේම යුද හමුදාව කෙරෙහි එවක ප්‍රදේශයේ ජනතාව තුළ වූයේ දැඩි බියකි. අප එහි රාජකාරි කරනුයේ ඔවුනගේම ආරක්ෂාව සහ රැකවරණය පිණිස බැව් එහි බොහෝ දෙනකුට අවබෝධයක් නොවීය. ගිනි අවි අත රැඳි අප සමග කතා කිරීමට පවා ඇතැම්හු බිය වූහ. එම මානසික තත්ත්වයෙන් ඔවුන් මුදවාලීම පිණිස අප නිරන්තරව මහන්සි ගත්තද එය සාමාන්‍ය තත්ත්වයට පත්කරලීම ලෙහෙසි පහසු නොවීය.

"සෙල්වරාණි" එහි වූ විද්‍යාලයක ගුරුවරියක ලෙස සේවය කළාය. සෑම උදෑසනකම ඇ හොඳින් ඇඳපැළඳ පාපැදියක නැගී කඳවුර අසල මාර්ගයෙන් පාසල කරා යන අයුරු අතිශය ප්‍රිය උපදවන සුළුවිය. නිරතුරු එකී දර්ශනය දකින මා තුළ ඇ පිළිබඳ ඇති වූයේ උනන්දුවකි. කෙසේ වුවද, පැවති ක්‍රියාන්විත වටපිටාව තුළ එකී උනන්දුව හුදු බැල්මකට පමණක් සීමාවූ අතර ඇයගේ ප්‍රතිචාරයද එලෙසම විය. රාජකාරි අවශ්‍යතා මත හටපිරිස් සමග පාරේ යන එන මා හට නිරතුරු ඇ දක්නට ලැබුනු අතර ඒ සෑම විටකදීම ලැජ්ජාශීලීව පෑ මඳ සිනහවක් හැරෙන්නට අන් ප්‍රතිචාරයක් ඇ නොදුන්නාය. එවක නව යොවුන් වියේ සිටි මා හට ඇය දැකීමද ආස්වාදයක් වූ නමුදු එකී සියලු හැඟීම් මා තුළම සඟවා ගන්නට මම පරිස්සම් වූයෙමි.

දරිද්‍රතාවයත් යුධ බියත් අතර ගෙවූ එහි තරුණ ජීවිතවලට ප්‍රේමය යනු කිසිදා අත් නොවිඳි අත්දැකීමකි. සමස්තයක් ලෙස එම ප්‍රදේශයේ තරුණියන් බහුලව සිටියද තරුණයන් හිඟ බවක් පෙන්නුම් කළේය. යුද්ධය නිසාම මියගිය පිරිස්ද එල්ටීටීඊ සංවිධානය සමග ඒ වන විටද සබඳතා පවත්වමින් ප්‍රදේශය හැර ගොස් සිටි තරුණ කොටස් ද බහුල වූහ. කලාතුරකින් ඉතිරිව සිටි යොවනයකු වේ නම් ඔහුටද ජීවිතය සමග අරගල කිරීම හැර ප්‍රේම කරන්නට වේලාවක් හෝ ඉස්පාසුවක් නොවීය. යුද්ධයේ ඛේදනීය ඉරණම යුධමය පරිසරයේ සිටි තරුණ ප්‍රජාවට එලෙසින් අවාසනාවන්ත ලෙස බලපා තිබුණේ තාරුණ්‍යයේ මූලික හිමිකම් පවා අහිමි කරමිනි. ජීවිතයේ බොහෝ දුක්ඛ දෝමනස්සයන් හංගාගෙන තරුණ ජීවිතවලින් වන්දි ගෙවූ එවැනි අයවළුන් පිළිබඳ මා

තුළ හටගත්තේ අනුකම්පාවකි.

එම කාලවකවානුවේ පැවැති යුධමය පරිසරය නිසාම සැකය, අවිශ්වාසය, බිය රැඳි හදවත් නිරතුරුවම ගැහෙමින් පැවතිණ. එවක ත්‍රස්තවාදීන් හා යුද හමුදාව අතර "සෙල්වරාණි" පදිංචිව සිටි ප්‍රදේශය ආසන්නයේ යුධගැටුම් අවිලුණු වාර අපමණය. එකී සෑම අවස්ථාවකදීම බියෙන් සලිතව තම නිවෙස් තුළට ගුලිවන පිරිස් අතර ඇය ද වූවාය. යුද්ධයක ප්‍රධාන පාර්ශ්වකරුවන්ට සේම ඊට අතරමැදි වන අයවලුන්ට ද එහි බිහිසුණු කටුක බවට මුහුණ දීමට සිදුවීම සාමාන්‍ය දෙයකි. නැතිබැරිකමද, ජීවිත අවදානම ද සමගින් අවිනිශ්චිත හෙට දවසට මුහුණ දුන් ඇය තුලින් එම පරිසරයන්හි යුද්ධයෙන් බැටකන සමස්ත තරුණියන්ගේ පැතිකඩක් නියෝජනය වූවාසේය. යුද්ධයේ ආරම්භකයින් හෝ ඊට වගකිව යුත්තන් පිළිබඳ ඔවුන් තුළ කිසිදු අදහසක් නොවූවද, යුද්ධයේ උරුමකරුවන් ලෙස විසි හතර පැය පුරා අනේකවිධ දුක් විඳින්නන් බවට සෙල්වරාණි වැන්නවුන් පත්ව සිටින බව පමණක් පෙනෙන්නට තිබිණ.

මෙලෙස කලක් ගත වෙද්දී කඳවුර අසල ඇති කෝවිලෙහි වාර්ෂික මංගල්‍යය ඇරඹිණ. එහි සංස්කෘතික සංදර්ශනයක්ද තිබූ අතර එය දින කිහිපයක් පුරා පැවැත්විණ. සෑම දිනකම රාත්‍රී හතට පමණ ඇරඹෙන එම සංස්කෘතික සංදර්ශනය අලුයම තෙක් පැවතුණේය. එවක එහි විදුලි බල පහසුකම් කිසිත් නොවූ බැවින් උත්සවය සඳහා ජෙනරේටරයක් අධාරයෙන් අඛණ්ඩව විදුලිය සපයාගෙන තිබුණි. කෝවිල වටා ඉදිකළ කඩ සාප්පු බොහොමයක් වූ අතර ඒවායේ කැවිලි වර්ග විසිතුරු බඩු ආදිය දැකිය හැකිවිය. යුද හමුදාවට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම සඳහා ත්‍රස්තවාදීන් එවක නිරන්තර උත්සාහ ගත් බැවින් කෝවිලේ පැවති උත්සවය ඊට කදිම අවස්ථාවක් විය. එබැවින් අප හට පිරිස්වලට එහි ආරක්ෂාව වෙනුවෙන් නිදිවරාගෙන කටයුතු කරන්නට සිදුවූහ. ඒ අනුව සිවිල් ඇඳුමින් සැරසුණු සෙබළ පිරිසක් කෝවිලේ ආරක්ෂාව සඳහා යෙදවීමටද ප්‍රදේශයේ මාර්ග බාධක කිහිපයක් යොදා එම උත්සවයට පැමිණෙන අයවලුන් පරීක්ෂා කිරීමටද අප විසින් කටයුතු කරන ලදී.

දිනපතා පැවත්වුනු එම කෝවිල් උත්සවය නැරඹීම සඳහා සෑම රාත්‍රියකදීම තවත් සහෝදර නිලධාරියකු සමග මමද සහභාගී වුණෙමි. එහිදී ආරක්ෂාව පිළිබඳ වැඩිපුර සැලකිලිමත් වීමටද අපට සිදුවිය. එලෙස කෝවිලේ රැඳී සිටි අවස්ථාවක පෙර කී ගුරුවරිය මා හට අහම්බෙන් මුණගැසුණි. අප දෙදෙනාම එකිනෙකාට බොහෝ හුරු පුරුදු වුවද කිසිදින කතාබස් කොට නොතිබුණි. ඊට පෙර එයට අවස්ථාවක් නොවූවා සේම අප අතර වූ භාෂා ප්‍රශ්නයද ඊට හේතුවී තිබුණ. කෙසේ හෝ මා ඇය හා කතාබස් කිරීමට මග පාදාගත්තේය. එහිදී මා පුදුමයට පත්වූ කාරණය වූයේ ඇය හොඳින් සිංහල කතා කළ හැකිව තිබීමයි. වැඩිදුර තොරතුරු විමසීමේදී දැනගත්තේ ඇය කුඩා කළ නුවරඑළිය ප්‍රදේශයේ පාසලක කලක් අධ්‍යාපනය හදාරා ඇති බවකි. යුද හමුදාවට තිබූ බිය නිසාම ඇය මෙතෙක් ඒ බව නොපෙන්වා සිටින්නට උත්සාහ ගෙන තිබිණ. එහිදී

**තිස් වසක යුදබිමේ අත්දැකීම් ලැබූ බොහෝ දෙනකු තුළ මෙවන් මතක ඇතුවාට සැක නැත. රණබිම තුළ ප්‍රේමයක් වෙත්නම් එය අහඹුවක්මය. එය අති දුළබමය. සඳ එළියෙන් දෝතක් ගත්තාසේ එය සෞම්‍යය. ගිනිගත් බිමක උනුසුමක් රැඳුනේනම් ඒ මියගිය හෝ තුවාල ලැබුවෙකුගේ රුධිරයේ උනුසුම පමණි. එම පරිසරයේ හදවතක උණුසුම නිළ ඇඳුම් ලාගත් අයවලුන්ට සේම එහි සිටි ද්‍රවිඩ යෞවනයටද උගහට විය.**

අප අතර පැවතියේ ඉතා කෙටි පිළිසඳරක් වුවද, එමගින් බොහෝ තොරතුරු හුවමාරු කරගැනීමට මාහට හැකි විය. ඇයගේ සිතුම් පැතුම් සේම ඇය හමුදා සාමාජිකයන් පිළිබඳ දරණ යහපත් ආකල්පයද මා හට අවබෝධ කරගත හැකි විය. සැබවින්ම ඇගෙ හදවතෙහි සිංහල සෙබළුන් පිළිබඳ හටගෙන තිබුණේ බොහෝ ආදරණීය හැඟීමකි. යුදමය පරිසරයද, හමුදාවට තිබූ අනියත බියද, ත්‍රස්තවාදීන්ගෙන් එල්ල වූ බලපෑම්ද හමුවේ ඕ නිහඬව සිය හැඟීම් සිරකොට ගෙන තිබුණි. යුද්ධය හමුවේ බලහත්කාරයෙන් යටපත් කර ඇති මානව බැඳීම් කොතරම්දැයි එහිදී මා හට සිහිපත් විය.

එතැන් පටන් අප අතර ගොඩනැගුනේ සැලකිය යුතු හිතවත්කමකි. එහෙත් එම කාලසීමාව මුලුල්ලේ වුව දුරසිට පෑ සිනහවක්ද කලාතුරකින් අතරමගදී හමුවී දෙඩූ වචන දෙක තුනක්ද හැරෙන්නට අප අතර වැඩි යමක් නොවීය. එහෙත් හිත පිරෙන්නට කියාගත යුතුව තිබූ බොහෝ දෑ අප දෙදෙනාගේම සිත් තුළ සිරව තිබූ බව නම් පැහැදිලිය. මෙලෙස තවත් කලක් ගතවෙත්ම සුපුරුදු පරිදි ක්‍රියාන්විත රාජකාරී අවශ්‍යතාව මත මා හට ඊට බොහෝ එපිටින් වූ වෙනත් කඳවුරකට මාරුවීමට සිදුවිය. මඩකලපුව පොළොන්නරු ප්‍රධාන මාර්ගයට යාව "සිත්තණ්ඩි" ප්‍රදේශයේ වූ එම කඳවුර එතරම් දුෂ්කර නොවූ යටිතල පහසුකම් වලින්ද පරිපූර්ණ එකක් වූ නමුදු මාහට එහි යාමට සිදුවීම පිළිබඳ එතරම් සතුටක් නොවීය. "සෙල්වරාණි"



හා බැඳුණු සොඳුරු මතක පිරුණු පරිසරය දමා යාමට සිදුවීම ඊට හේතු වූවා විය හැක.

"මරපාලම්" හි එතෙක් සිටි සුපුරුදු කඳවුරෙන් බැහැරව යන දිනයේ මා ගමන් ගත් ට්‍රක් රථය සෙල්වරාණි උගන්වමින් සිටි පාසල් ගේට්ටුව අසල නතර කරන ලද්දේ අවසන් වතාවටද ඇයව සිනහවකින් හෝ සමුදීමටය. එහිදී පාසල් විවේක කාලය තෙක් රැඳී සිටි මාහට ඇ මුනගැසීමේ අවස්ථාව හිමිවිය. ළමුන් කිහිපදෙනකුද සමග ගේට්ටුව අසලට පැමිණි ඇ මා වෙත සමුදුන් අවස්ථාව බොහෝ හැඟුම්බර විය. අවසානයේ ඉන් නික්මෙන මොහොතේ මා ගමන්ගත් ට්‍රක් රථය දෙස පාසල් ගේට්ටුව අසලම රැඳී බලාසිටින සෙල්වරාණි ගේ රුව ට්‍රක් රථයේ වූ පැති කණ්ණාඩියෙන් තිතක් වී නොපෙනී යනතුරු මම දුටුවෙමි.

අසුරු සැනින් කාලය පියඹා ඇත. "සෙල්වරාණි" පිළිබඳ මතකයට මේ වන විට වසර 29 ක් ගෙවී අවසන්ය. 1994 වර්ෂයේ මා එම ප්‍රදේශයෙන් නික්ම ගිය මුල් වකවානුවේ යළිත් ඇව දැකීමේ නොතිත් ආසාවකින් පෙලුනද පැවති ක්‍රියාන්විත වාතාවරණය ඊට කිසිදු ඉඩක් නොදුන්නේය. එතැන් පටන් මේ මොහොත වන තෙක්ම මා එම ප්‍රදේශයේ පයගසා නොමැත. සෙල්වරාණි අද කොහේ සිටීදැයි මා නොදනී. ඇ එදා සිටි එම පරිසරය උඩුයටිකුරු ලෙස බොහෝ වෙනස්කම් වලට භාජනය වී ඇති බව නම් නිසැකය.

තිස් වසක යුදබිමේ අත්දැකීම් ලැබූ බොහෝ දෙනකු තුළ මෙවන් මතක ඇතුවාට සැක නැත. රණබිම තුළ ප්‍රේමයක් වෙන්නම් එය අහඹුවක්මය. එය අති දුලබමය. සඳළුලියෙන් දෝතක් ගත්තාසේ එය සොම්‍යය. ගිනිගත් බිමක උනුසුමක් රැඳුනේනම් ඒ මියගිය හෝ තුවාල ලැබූවෙකුගේ රුධිරයේ උණුසුම පමණි. එම පරිසරයේ හදවතක උණුසුම තිල ඇඳුම් ලාගත් අයවළුනට සේම එහි සිටි දුවිඩ යොවනයටද උගහටවිය.

ඇතැම් විට සෙල්වරාණි මේ වනවිට කිසිවකුගේ දයාබර බිරිඳක් වන්නට පුළුවන. නොඑසේ නම් යුද්ධයේ අවාසනාවන්ත බව කර පින්නාගෙන එම වකවානුවේදීම දිවියෙන් වන්දි ගෙවා ඇත්දැයි නොදනී. කෙසේ වුව ඇ පිළිබඳ වූ දයාබර මතක සදා මා සිත අවදි කරවයි. යුදබිමෙහි මතක මෙතරම් සොඳුරු බැව් දැනෙද්දී යුද්ධය එතරම් අමානුෂික වූයේ කෙසේදැයි අදටද මාහට ප්‍රෙහේළිකාවකි.

**සීතල දෑත හදවත උණුසුම රැඳුණ**
**පාවඩ නොමැති බිම පය අතුරා තිරිත**
**තල්ගස් සෙවණ යට ඉඳ ලෝකය බලන**
**තංගච්චියෙක් නුඹ තනිකම දුක දැනුණ**

**සුළඟින් පවා සිසිලස නොදැනෙන ලොවක**
**නුඹ සියපතක් රොන් පිරි සුසිනිඳු මෙළෙක**
**සුව විඳගන්න හිතුනත් ළඟ ඉඳ මලක**
**මම දුර වැඩියි නුඹ ගැන ඒ නිසයි දුක**

**සාමය පොඳි බැඳන් දැවැද්දක් වලස**
**නුඹ එනවාද පුරවන්නට මගෙ හිඩස**
**සිහිනෙන ඇවිත් නුඹ අඩියස සලා හිස**
**නළලත සිඹින්න ද තිලකය මැකෙන ලෙස**

# බුවැලිකඩ සංඥා පුහුණු පාසලේදී ''යුද සාහිත්‍යය'' දේශනයක්





තිස්වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ඓතිහාසික සටනට සෘජු ලෙස දායක වූ විරුවන් අගයමින් එකී මතක හා අත්දැකීම් පිළිබඳ නව පරපුර දැනුවත් කිරීම වෙනුවෙන් වූ "යුද සාහිත්‍යය" දේශනයක් පසුගිය ජූලි 30 වන දින බුවැලිකඩ සංඥා පුහුණු පාසලේ දී පැවැත්විණ. එහි සේනාවිධායක කර්නල් ඩිලන්ත ප්‍රනාන්දු යූඑස්පී පීඑස්සී හා එහි උපදේශක වරුන්ගේ ද සහභාගීත්වයෙන් පැවති එම දේශනයට 127 වන මූලික සංඥා පුහුණු පාඨමාලාවේ සෙසුනිලයින් 137 දෙනකු සහභාගී වූහ. මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ රණවිරුවා සඟරාවෙහි ප්‍රධාන සංස්කාරක ලෙස කටයුතු කරන ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් එම දේශනය මෙහෙයවන ලදී.

වර්තමානයේ රණවිරුවන්ට එරෙහිව සමාජ මාධ්‍ය හා වෙනත් ක්‍රමවේද ඔස්සේ අසත්‍ය තොරතුරු ප්‍රචාරය කරමින් හමුදාව අපකීර්තියට පත්කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් දියත් වනු පෙනේ. සිවිල් සමාජයේ තරුණ ප්‍රජාව ඒ සඳහා වැඩිපුර පෙළඹී ඇති අතර, යුද්ධ හමුදාව තුළ සිටින මෑතකාලීනව බැඳුණු ඇතැම් පිරිස්ද එවැනි ප්‍රතිචාරයන්ට අනුකූලතාවය දැක්වීමටද ඉඩ ඇත. ඉහත තත්වයන්ට ප්‍රධානතම හේතුව වී ඇත්තේ ඔවුන් කිසිවකු මෙරට තිස්වසරක් පුරා පැවති යුද්ධයේ බිහිසුණු බව හා ආදීනව අත්විඳ නොතිබීම හා රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් සිදුකළ කැපකිරීම පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැතිවීමය. විශේෂයෙන්ම ඔවුන් වැඩිදෙනකු යුද්ධය පැවති වකවානුවේ පාසල් අවධියේ පසුවූවන් බැවින් එවක රටතුළ පැවති යුද වාතාවරණය පිළිබඳ එතරම් හැඟීමක් ඔවුන් තුළ නොවීමය. කරුණු එසේහෙයින් සිවිල් සමාජයේ වත්මන් පරපුරටද, යුද්ධ හමුදාවේ මෑත පරම්පරාවටද එකී තත්ත්වය අවබෝධ කොටදීම අනිවාර්ය කාලීන අවශ්‍යතාවයකි. විෂයක් ලෙස "යුධ සාහිත්‍ය" සමාජය තුළ ප්‍රචලිත කිරීම වැදගත් වන්නේ එබැවිනි.



# බුදු දහම තුළින්

## රෝග සුවය හා මානසික සහනය



කර්නල් එම්ටීපී පෙරේරා
(විශ්‍රාමික)

ජීවිතයේ තනිවම ගන්නා තීරණ අසාර්ථක වූ විට හෝ යමෙක් තුළ පැවති ගැටලුව හෝ අර්බුධකාරී තත්වය තව තවත් උත්සන්න වෙමින් පවත්නා අවස්ථාවලදී එය සමනය කරගැනීම උදෙසා උපකාරී විය හැකි අයකු වෙත නැඹුරුවීම සාමාන්‍ය මිනිස් ස්වභාවයයි. එලෙස යම් අයකු වෙත උපදේශනය අවශ්‍ය වන්නේ ඔවුන් මුහුණපාන ගැටලු තනිව විසඳා ගැනීමට හැකියාවක්, ශක්තියක් නොමැති වෙනත් බාහිර පාර්ශවයකගේ උපකාරයන්ද නොමැති අවස්ථාවලය.

දෛනික ජීවිතයේ විවිධාකාර ගැටලු, අර්බුධයන්ට මුහුණ දෙමින් අසීමිත ලෙස චිත්ත පීඩාවන්ට ලක්වී සිටින මොහොතක නිසි මැදිහත්වීමක්, උපදේශනයක් නොලදහොත් එය විවිධ මානසික රෝගී තත්වයන් ඇති කරන අතර, අවසානයේ සියදිවි හානිකර ගැනීමටද පෙළඹේ. මන්ද, ඔහුට හෝ ඇයට පවතින අවසාන හා එකම විසඳුම ජීවිතය හානිකර ගැනීම යැයි එම අවස්ථාවේ සිතේ. එහෙත් මෙතරම් දියුණු සමාජයක එය සාධාරණ විසඳුමක් ලෙස කිසිසේත් අනුමත කළ නොහැකිය.

මෙවන් මානසික අසමතුලිතතාවයකට පත් වයස අවුරුදු 22 ක් පමණ වන නව යොවුන් තරුණයෙක් දිනක් ඔහුගේ මව විසින් මා වෙත රැගෙන එනු ලැබුවාය. ඒ වනවිටත් ඔහු සියදිවි හානිකර ගැනීමට වරක් උත්සහ කර තිබුණි. වාසනාවකට එය අනුනවයෙන් වැළකී ඇත්තේ ඔහුගේ මව සිය දරුවා ගැන නිරන්තරයෙන් අවධානයෙන් පසුවීම හේතුකොටගෙනයි. මෙම තරුණයා (උදිත) මා වෙත මව විසින් කැඳවාගෙන පැමිණියේ වැඩිහිටියකු ලෙස දරුවා වෙත අවවාදයක් කිරීම සඳහාය. අවවාදය වෙනුවට මම බොහෝ වෙලාවක් ඔහු සමඟ සුහදව කථා කළෙමි. ඒ සෑම විටම වැඩිහිටියකු ලෙස නොව ඔහුගේම සමකාලීන මිතුරකු ලෙස කථාබස් කිරීමටද මා අමතක නොකළේය.

උදිත නම් වූ මෙම තරුණයා බාහිර පන්තියට යන අතරතුර එම පන්තියේම සිටි තරුණියක් හා ප්‍රේම සම්බන්ධයක් ඇති කරගෙන තිබුණි. එම ප්‍රේම සම්බන්ධතාවය පැවතියේ මාස 11 ක් පමණි. ඇය ඔහු හැරගොස් සිටි අතර, මාස කිහිපයකට පසු වෙනත් තරුණයකු හා සම්බන්ධතාවයක් ආරම්භ කොට ඇත. ඇයගේ හැරයාමෙන් දැඩි අසහනකාරී චිත්ත පීඩාවකට පත්ව සිටි ඔහු ඇයගේ අළුත් සම්බන්ධතාවය දැනගත් දිනයේ ලිපියක් ලියා වස පානය කර දිවි තොරකර ගැනීමට තීරණය කර ඇත. කෙසේ හෝ ඔහු නොසිටි අවස්ථාවක ඔහුගේ කාමරය පරීක්‍ෂා කළ මවට මෙම වස බෝතලය හමුවී ඇත්තේ නිදන මෙට්ටය යට සඟවා තිබියදීය.

මා හමුවන විටද ඔහු තදබල ලෙස චිත්ත පීඩාවකට පත්වී සිටියේය. දැන් ඔහුගේ එකම අරමුණ ඇයට රිදෙන්නට ලිපියක් ලිවීමය. ඔහුගේ මානසික පීඩාව තරමක් දුරට මුදාහැරිය හැකි බැවින් මම එය හොඳ අදහසක් බව කීවෙමි. එහෙත් එම ලියන ලිපිය කැමති නම් මා හට බැලීමට දෙන ලෙසත්, ඒ අනුව මා හටද යම් අදහසක් එයට ඇතුළත් කිරීමට හැකි බවත් පැවසුවෙමි. ඔහු පසුදින මා හමුවට පැමිණියේ එදින රාත්‍රිය පුරාම ඔහු විසින් තම හැරගිය පෙම්වතිය වෙත ලියන ලද පිටු 16 ක් තරම් වූ ලිපියක්ද රැගෙනය.

මම සම්පූර්ණ ලිපිය කියවූයෙමි. එම ලිපිය පුරාම ලියා තිබුණේ ඔහුගේ දෝරේ ගලායන දුක පමණි. මම මේ ලිපියේ යම් යම් කරුණු සංශෝධනය කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියෙමි. මෙවැනි දුක පමණක් කීමෙන් ඇය තව තවත් ආඩම්බර වන සැටිත් ඔහුගෙන් ඈත්වී යන ආකාරයත්, පහදා දුනිමි. මෙවැනි ආකාරයට දුක ලිවීම වෙනුවට දැන් තමා සතුටින් සිටින ආකාරයත්, ජීවිතයේ එකම දරුවා වශයෙන් අනාගතයේ බලාපොරොත්තු ඉටුකළ යුතු ආකාරයත්, මෙන්ම මෙතෙක් ජීවිතයට ඇයගෙන් ඉගෙන ගත් බොහෝ දේවල් තමාගේ අනාගත විවාහ ජීවිතය සාර්ථක කර ගැනීමට වැඩදායක වන ආකාරයත්, එම ලිපියට ඇතුළත් කරන ලෙස පහදා දුනිමි. තවද ලිපිය මේ ආකාරයට සංශෝධනය කර තමාගේ

ගෞරවය ආරක්‍ෂා කරගන්නා ආකාරයත් හැකිතරම් කොළ ප්‍රමාණය අඩු කරන ලෙසත් ඉල්ලා සිටියෙමි.

මෙම සිදුවීමෙන් දින දෙකකට පසුව ඔහු නැවතත් එම සංශෝධිත ලිපිය සමග මා හමුවීමට පැමිණියේය. එහි පිටු ප්‍රමාණය 12 දක්වා අඩුවී තිබූ අතර, පෙර ලිපියේ සියයට සියයක් තරම් වූ දුක හා සන්තාපය බොහෝ සෙයින් අඩුවී තිබුණි. එසේම මා සඳහන් කළ යම් යම් කරුණුද ඊට ඇතුළත් වී තිබිණි. ඔහු තවමත් යම් ආකාරයක කේන්තියකින් හා කලකිරීමකින් පසුවූවද එම ලිපියේ යම් ස්ථිරසාර බවක්ද තිබුණි. මම ඔහු තවදුරටත් අගය කළෙමි. එසේම ඔහු සමග පැය දෙකක් පමණ කථාකරමින් සිටි අතර, අවසානයේ නැවතත් සුළු කරුණු කිහිපයක් පෙන්වා දී ඒවාද ඉවත් කරන ලෙසත්, කැමති නම් නැවතත් ලිපිය යැවීමට පෙර එක් වරක් බලන්නට දෙන ලෙසත් කීවේය.

සතියක් පමණ ගෙවී ගියද ඔහු නැවත මා හමුවීමට නොපැමිණියේය. එබැවින් දිනක් මම ඔහුගේ මවගෙන් මේ පිළිබඳව කරුණු විමසා සිටියෙමි. ඇය මා සමග පැවසුයේ ඔහු නිවසේ සිටින බවත්, උදෑසන ශාරීරික අභ්‍යාස සඳහා ජිම් එකට ගිය බවත්ය.

කෙසේ වුවද ඊට දින දෙකකට පසුව මට ඔහු මහමගදී මුණගැසුණි. ටික වෙලාවක් තොරතුරු කතා කිරීමෙන් අනතුරුව මම මෙලෙස ඇසුවෙමි.

"අර ලියුම හැදුවද? යැව්වද? මොකද වුණේ?"

"ලියුම දෙපාරක් විතර හැදුවා... ඒත් මම ඒක යැව්වේ නැහැ..." ඔහු පෙරලා කීවේය.

"ඇයි ඒ... මොකෝ..." මම විමසා සිටියෙමි.

"වැඩක් නැහැනෙ අංකල්... මොකටද...? ඒකිට ඕනෙ නැත්නම් මට ඇති වැඩේ... මම ආපහු ලියුම් අරින්නෑ..."

මීට දින දහයකට පමණ පෙර ඔහු සිටි අසීමිත පීඩාකාරී මානසික තත්වයෙන් බොහෝ දුරට මිදී ඇති බව මට වැටහුණි. ඔහු මෙම චිත්ත සන්තාපයෙන් මුදවා ගැනීම සඳහා මා යම් මනෝ චිකිත්සක ක්‍රමයක් භාවිත කළෙමි. ඔහුගේ මෙම වෙනසට එය බොහෝ සෙයින් උපකාරීවන්නට ඇතැයි මම සිතුවෙමි. එනම් ඔහු ලවා එම ලිපිය කිහිපවරක් ලිවීමට පෙළඹවීමයි. එසේම කාලය ගෙවෙන්නට ඉඩහැරීමයි. ඔහු තුළ තිබූ ඍණාත්මක සිතුවිලි වෙනුවට

> "නූතන මනෝ වෛද්‍යවරුන් තම සේවාලාභීන්ට ප්‍රතිකාර කිරීම උදෙසා විවිධාකාර දියුණු මනෝවිද්‍යාත්මක මූලධර්ම හෝ චිකිත්සා ක්‍රම ලෝකයාට හඳුන්වා දී තිබුණද මෙම සියලු මූලධර්මයන් වනාහි මෙයින් වසර 2550 කට පෙර විසූ මෙතෙක් මිහිතලයේ පහළ වූ ශ්‍රේෂ්ඨතම මනෝ වෛද්‍යවරයාණන් වූ බුදු පියාණන් වහන්සේ විසින් ලෝකයාගේ අනුකම්පාව උදෙසා දේශනය කළ ශ්‍රී සද්ධර්මයම බව කිසිදු සැකයකින් තොරව ප්‍රකාශ කළ හැකිය."

ධනාත්මක අදහස්, නව බලාපොරොත්තු ඇති කිරීමයි. මේ ආකාරයට විටින් විට ලිපිය සංශෝධනය තුළින්ම ඔහුට යථාර්ථය අවබෝධ වන්නට සැලසීය.

නූතන මනෝ වෛද්‍යවරුන් තම සේවාලාභීන්ට ප්‍රතිකාර කිරීම උදෙසා විවිධාකාර දියුණු මනෝවිද්‍යාත්මක මූලධර්ම හෝ චිකිත්සා ක්‍රම ලෝකයාට හඳුන්වා දී තිබුණද මෙම සියලු මූලධර්මයන් වනාහි මෙයින් වසර 2550 කට පෙර විසූ මෙතෙක් මිහිතලයේ පහළ වූ ශ්‍රේෂ්ඨතම මනෝ වෛද්‍යවරයාණන් වූ බුදු පියාණන් වහන්සේ විසින් ලෝකයාගේ අනුකම්පාව උදෙසා දේශනය කළ ශ්‍රී සද්ධර්මයම බව කිසිදු සැකයකින් තොරව ප්‍රකාශ කළ හැකිය.

මා ඉහත සඳහන් කළ තරුණයා විෂයෙහි අනුගමනය කළ පිළිවෙතද එදා බුදු පියාණන් කිසාගෝතමිය උදෙසා ක්‍රියාකළ ආකාරයට බෙහෙවින් සමානය. උන්වහන්සේ කිසිවිටෙකත් දැඩි මානසික චිත්ත පීඩාවකට ලක්ව සිටි කිසාගෝතමියගෙන් දරුවා පිළිබඳ තොරතුරු විමසා නොසිටියේය. එසේම තම දරුවාට යළි පණ ලබාදිය නොහැකියැයිද නොපැවසීය. ඒ වෙනුවට බුදුන් පවසා සිටියේ දරුවාට පණ ලබාදීම සඳහා කිසිවෙක් නොමළ ගෙදරකින් අබ මිටක් රැගෙන එන ලෙසයි. එම නගරයේ ගෙයක් ගෙයක් ගානේ අබ මිටක් සොයා ගිය ඇය අවසානයේ ලෝකයේ යථාතත්වය පිළිබඳව ස්වයං අවබෝධයක් ලබාගත්තාය. එම අවබෝධය ඇය විසින්ම තේරුම් ගෙන පසක් කරගත් තත්වයකි. මෙවැනි දැඩි මානසික රෝගවලින් පෙළෙන පුද්ගලයින් හමුවේ ක්‍රියාකළ යුතු නිවැරදි පිළිවෙතද එයයි. එසේම ඔවුන් දෙස කරුණාවෙන් බලා සහකම්පනයෙන් යුතුව මනා ලෙස ක්‍රියා කිරීම ඉතා වැදගත්ය. මෙවැනි පුද්ගලයින් උදෙසා යොදා ගතහැකි මනෝ චිකිත්සක පිළිවෙත් රාශියක් බුදු දහමෙහි ද අන්තර්ගත වේ.

මෙම සංකීර්ණ සමාජයේ ගතකරන අපගේ දෛනික ජීවිතයේදී විවිධාකාර පුද්ගලයින් මුණගැසෙන අතර, විවිධ මානසික ගැටලු වලින් පීඩාවිඳින ඔවුන් උදෙසා මෙම මූලධර්ම මනාලෙස යොදා ගතහොත්, ඒ තුළින් යම් අයකුගේ දැඩි මානසික ව්‍යාකූල තත්වය සමතුලිත කිරීම උදෙසා ඕනෑම අයකුට උපකාරී වීමට හැකියාව තිබේ. බුදු දහමේ අන්තර්ගත එවැනි ක්‍රමෝපායන් කිහිපයක් පහත සඳහන් පරිදි පෙන්වා දිය හැකිය.

## ආරෝචනය

එනම් තමාගේ සිතෙහි තමා එකඟ නොවන ප්‍රතිවිරෝධී හැඟීමක් පහළ වූ විට හැකි ඉක්මනින් ඊට සුදුසු පුද්ගලයකුට ප්‍රකාශ කර සහනයක් ලබාගැනීම, එය ප්‍රකාශ කිරීමෙන් යම් පහසුවක් තමන්ට දැනේ. එමෙන්ම එය තදබල මානසික ගැටලුවක් බවට පත් වීමට ඉඩකඩ නැතිවේ. සුහද සාකච්ඡාවක් ආකාරයෙන් මුහුණපා සිටින ගැටලුව අවබෝධකර ගත හැකිය.

## අනුකූලතා ප්‍රදර්ශනය

මෙම ක්‍රමය තුළින් අංගුලිමාල, ආලවක, ආදීන් දමනය කිරීමේදීත් කිසාගෝතමී, පටාචාරා ආදීන් සුවපත් කිරීමේදීත් ඔවුන්ගේ අදහස්වලට මුලින් අවනත වී ක්‍රමයෙන් යථා තත්වයට ගැනීම සිදුකොට ඇත. මානසික ගැටලුවකට මුහුණ පා ඇති අයකුට සෘජුවම ඊට විරුද්ධව උපදෙස් දීමෙන් එම ගැටලුව නිරාකරණය නොවේ. ප්‍රථමයෙන්ම සානුකම්පිතව ඊට සවන්දී ඊට එකඟත්වය පලකොට ක්‍රමයෙන් ඔහු යථා තත්වයට පත්කළ හැකිය.

## සාධාරණීකරණය

යම් මානසික ගැටලුවකට මුහුණ පා සිටින අයකුට එවැනි ගැටලු ඔහුට පමණක් නොව තවත් දහස් ගණනකට මෙන්ම, ඔහුට වඩා උසස් අයටද එබඳු ගැටලු ඇති බව පෙන්වා දී ඒ පිළිබඳව

ඔහු තුළ පවතින දැඩි ආකල්පය ලිහිල් කිරීම මින් අදහස් වේ. කිසියම් ගැටලුවක් තමාට පමණක්ය යන හැඟීම නිසා ඔහු සමාජයෙන් දුරස්ථ වේ. හුදකලා වේ. එය නැති කිරීම මෙහි අරමුණයි. කිසාගෝතමියට සෑම ගෙදරකම මරණයට පත්වූ අය සිටින බවට වැටහීමක් ලබාදීම මීට ප්‍රකට නිදසුනක් වේ. එසේම සිය ගණනක් වූ ජාතක කථාවල බෝධි සත්වයන් පෙර භවයන්හි දී විවිධ ගැටලු වලට මුහුණ පා තිබෙන බව සඳහන් කිරීමෙන්, බෝධි සත්වයින්ට පවා මෙබඳු ගැටලු ඇතිවී නම් අප ගැන කියනු කවරේදැයි ඒත්තු ගැන්වීමෙන් මානසික රෝගියා සැනසීමක් ලබයි.

## උත්තරෝපණය

කෙනෙක් යම් අරමුණක් ලඟා කරගැනීමට නොහැකිව, ඉච්ඡාභංගත්වයට පැමිණ එය මානසික ගැටලුවක් වී තිබේනම් ඔහුට ඊට වඩා වැදගත් අපේක්ෂාවක් ලබාදීමෙන් නැතහොත්, ඒ සඳහා යොමු කරවීමෙන් සහනයක් ලබාදීම මින් අදහස් වේ. ජනපද කල්‍යාණී දිව්‍යාංගනාවක් පෙන්වා එම ගැටලුව නිරාකරණය කිරීමත්, ඒ තුළින් ඊටත් වඩා වැදගත් වූ රහත් බව නැමති අපේක්ෂාව කරා යොමු කිරීමත් ක්‍රමානුකූලව සිදුවිය. දැඩි චිත්ත පීඩාවට පත්වූ පුද්ගලයා එක්වරම අරමුණක් කරා යොමු නොකොට, ගැටලුවට ආසන්නතම අරමුණ පෙන්වා පිළිවෙලින් අවශ්‍ය ස්ථානයට ගෙන ඒම සාර්ථක වේ.

## මනෝ විශ්ලේෂණය

මානසික ගැටලුවට පදනම් වූ චිත්ත තත්වයන් හේතුඵල ධර්මානුකූලව යම් පුද්ගලයකුට අවබෝධ කරවීම මෙයින් අදහස් කෙරේ. එය හටගත් ආකාරය පිළිබඳව විශ්ලේෂණාත්මකව කරුණු පහදා දෙනු ලැබේ. එසේ වුවද, මෙම පහදාදීම කළයුත්තේ ගැටලු රහිත පරිපූර්ණ මානසික තත්වයකට පත් වූ තැනැත්තකු මගිනි. මන්ද මඩෙහි ගිලුණු පුද්ගලයකුට තවත් එබඳු පුද්ගලයකු ගොඩගත නොහැකිය.

# නව නේවාසිකාරයකට මුල්ගල තැබේ



11 වන පාබල සේනාංකයේ සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම ඉකුත් ජූනි 22 වන දින එම පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑස්කේ සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සුරතින් ආගමික වතාවත් මධ්‍යයේ සිදුකෙරිණ.

# ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලාව අංක - 57





යුද්ධ හමුදාවෙහි සාමාන්‍ය සෙබළ, ලාන්ස් කෝප්‍රල් සහ කෝප්‍රල් නිලයේ අයවලුන්ගේ උපදේශන හැකියාව වර්ධනය කිරීම සඳහා සටන් පුහුණු පාසල - අම්පාර වෙතින් ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලාව අංක - 57 ඉකුත් ජූනි 27 වන දින සාර්ථකව අවසන් කරන ලදී. එම පාඨමාලාව යුද්ධ හමුදාවේ සියලුම රෙජිමේන්තු යටතේ ඇති නිත්‍ය හා ස්වේච්ඡා ඒකකයන් වෙතින් සහ යුද්ධ හමුදා පුහුණු පාසල් වෙතින් සිසු සිසුවියන් 250 දෙනකු සහභාගී වූ අතර, එයින් විශිෂ්ට සාමාර්ථ ලබාගෙන පාඨමාලාවේ ප්‍රථම ස්ථානය දිනාගැනීමට 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ සෙ/704426 ලා/කෝ කරුණාරත්න කේපීඑන්වී සමත්විය. මෙම පාඨමාලාවේ අවසන් දේශනය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සටන් පුහුණු පාසලෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ජේඑම්ආර්එන්කේ ජයමාන්න ආර්ඩබ්ලිව්පී සහභාගී විය.

# විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලාව අංක 73 සාර්ථකව අවසන් වේ







විශේෂ පාබල ක්‍රියාන්විත කණ්ඩායම් පාඨමාලා අංක - 76 සාර්ථකව හැදෑරූ යුද්ධ හමුදා සාමාජිකයින් වෙත සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවයක් පසුගිය ජුනි මස 19 වන දින මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් එස්ඒඑන්ඩී එදිරිසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී සහභාගී විය. 58 වන සේනාංකයේ නිලධාරීන් 6 දෙනකු සහ සෙසුනිලයන් 189 දෙනකුගේ සහභාගීත්වයෙන් අප්‍රේල් මස 27 දින ආරම්භ වූ මෙම විශේෂ පාබල ක්‍රියාන්විත කණ්ඩායම් පාඨමාලාව දින 91 ක කාල සීමාවක් පුරාවට පැවැත්විණි. මෙම පාඨමාලාව ඉංජිනේරු අදියර, ප්‍රථමාධාර අදියර, සංඥා අදියර, ගුවන් හමුදා අදියර, ප්‍රගුණ වෙඩික්කරු අදියර, කාලතුවක්කු අදියර සහ යුද උපක්‍රම අදියර වශයෙන් ප්‍රධාන අදියරයන් 7 ක් යටතේ පැවැත්විණි. සතුරා හමුවේ යුද උපක්‍රම භාවිතා කරමින් නිර්භීතව කටයුතු කළයුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාදීමේ අරමුණින් මෙම විශේෂ පාබල ක්‍රියාන්විත කණ්ඩායම් පාඨමාලාව පවත්වනු ලබයි.

පාඨමාලාවේ සියලු බාධක පරයා, රණ නිපුණත්වයෙන් පරිපූර්ණ වූ දක්ෂයින් අතුරින් අති දක්ෂ නිලධාරියාට හිමි සම්මානය 1 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් නි/71484 කපිතාන් ඒඑම්ආර්කේකේ මුල්ලේගම ද, සෑම අතින් අතිගුර සෙබළාට හිමි සම්මානය 1 ගැමුණු හේවා බළඇණියට අයත් සෙ/417922 සැරයන් රණසිංහ ආර්ඒජීසී ආර්එස්පී ද, දක්ෂතම වෙඩික්කරුවාට හිමි සම්මානය 6 වන විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් සෙ/533384 පාසෙ බංඩාර ආර්ජීඩීඑන් සහ හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් යුත් සිසුවාට හිමි සම්මානය 1 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් සෙ/382429 ලා/කෝ කීර්තිකුමාර එම්ජීබීයූ විසින් හිමිකරගනු ලැබූහ.

# අභිමානවත් සංවත්සර දිනය සමරමින්



1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ අභිමානවත් 63 වන සංවත්සරය ඉකුත් ජූලි 05 වන දින එහි අණදෙන නිලධාරී මේජර් යූඑම්පී උඩුකුමාරගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහිදී, අණදෙන නිලධාරී වෙනුවෙන් පැවති කඳවුරු සම්මාන මුරය, හටපිරිස් ඇමතීම, සියලු නිල දිවා භෝජනය ඇතුළු වැඩසටහන් රැසක් සංවත්සර උත්සව කටයුතු අතර විය.

# ENGLISH VISION

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Something to

යම්කිසි දෙයක් පිළිබඳ විස්තර කිරීමේදී **"එය ප්‍රසිද්ධයි"** යන අර්ථය හඟවමින් ප්‍රකාශ කිරීම සඳහා මෙම වාක්‍ය රටාව භාවිතා වේ.

***Fomular*** :- සූත්‍රය

**It is known that + Sentence.**
ඉට් ඊස් නොවුන් දැට් + සෙන්ටෙන්ස්.
එය ප්‍රසිද්ධයි + වාක්‍යය.

***Ex*** / *උදා* :-

1. It is known that he is very rich.
   ඉට් ඊස් නොවුන් දැට් හි ඉස් වෙරි රිච්.
   ඔහු ධනවත් බව ප්‍රසිද්ධයි.

2. It is known that she is knowledgeable.
   ඉට් ඊස් නොවුන් දැට් ෂී නොලේජබල්.
   ඇය බුද්ධිමත් බව ප්‍රසිද්ධයි.

3. It is known that they are powerful in the world.
   ඉට් ඊස් නොවුන් දැට් දේ ආ පවර්ෆුල් ඉන් ද වර්ල්ඩ්.
   ඔවුන් ලෝකයේ බලවත් බව ප්‍රසිද්ධයි.

4. It is known that we are moderate.
   ඉට් ඊස් නොවුන් දැට් වී ආ මොඩරේට්.
   අපි මධ්‍යස්ථ බව ප්‍රසිද්ධයි.

***Nota Bene*** / සැ.යු :-

ඉහත වාක්‍යන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැළකීමේදී කාල අර්ථයෙන් එම වාක්‍යය භාවිතා වී ඇති බව වටහාගත හැක. මෙම වාක්‍යය රටාව භාවිතා කිරීමේදී.

- **It is known that :-** "ප්‍රසිද්ධයි" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.

- **Sentence:-** සරල වාක්‍යය මෙහිදී භාවිතා වේ.

**Analysis of the sentence formation -** වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය.

**It is known that + Sentence.**
ඉට් ඊස් නොවුන් දැට් + සෙන්ටෙන්ස්.
එය ප්‍රසිද්ධයි + වාක්‍යය.

It is known that he is very rich.
ඉට් ඊස් නොවුන් දැට් හි ඉස් වෙරි රිච්.
ඔහු ධනවත් බව ප්‍රසිද්ධයි.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද, ඔබට මගහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



මේජර් චමින්ද ලියනගේ
ශ්‍රීලයුපෙහුසේ
ජනමාධ්‍ය අධි - ප්‍රහමු
*www.englishvision.lk*



# ක්‍රීඩා විත්ති

## අන්තර් සමාජ ක්‍රිකට් තරගාවලියේ ශූරතාවය යුද්ධ හමුදාවට





ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 17 වන දින සන්ධ්‍යාවේ "පී සරා ඕවල්" පිටියේදී පැවැති අන්තර් සමාජ පළමු පෙළ 20 - 20 ක්‍රිකට් තරගාවලියේ ශූරතාව දිනාගැනීමට යුද්ධ හමුදා ක්‍රීඩකයින් සමත් වූහ. කොළඹදී පැවති මෙම තරගාවලියේදී යුද්ධ හමුදාව ශූරතාවය සතු කරගන්නා ලද්දේ වසර 6 කට පසුව වීම විශේෂත්වයකි. එහිදී, තරගයේ වීරයා ලෙස බලලත් නිලධාරි 1 සික්කුගේ ප්‍රසන්න සම්මාන දිනාගත් අතර, තරගාවලියේ වීරයා ලෙස කෝප්‍රල් අශාන් රන්දික සම්මාන දිනාගනු ලැබීය.

## රෝදපුටු ටෙනිස් ශූරතාවය ගැමුණු හේවා බලකායට





"යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ටෙනිස් තරගාවලිය - 2022" ඉකුත් ජූලි මස 11 සහ 12 දෙදින තුළ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මූලස්ථානයේදී පැවැත්විණ. ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, ගැමුණු හේවා බලකාය, ගජබා රෙජිමේන්තුව, විජයබාහු පාබල රෙජිමේන්තුව සහ කමාන්ඩෝ රෙජිමේන්තුව නියෝජනය කරමින් රෝදපුටු ටෙනිස් ක්‍රීඩකයින් රැසක් සහභාගී වූහ. එහිදී, එම තරගාවලියේ ශූරතාවය දිනාගැනීමට ගැමුණු හේවා බලකා ක්‍රීඩකයින් සමත් වූ අතර, තරගාවලියේ අනුශූරතාවය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ක්‍රීඩකයින් ද එහි තෙවන ස්ථානය ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෝදපුටු ටෙනිස් ක්‍රීඩකයින් විසින්ද දිනාගන්නා ලදී. තරගාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්එච්කේඑස්එස් හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහභාගී විය.

# ඔරු පැදීමේ ශූරයෝ යුද්ධ හමුදාවෙන්






ශ්‍රී ලංකා ඔරු පැදීමේ ජාතික සංගමය විසින් සංවිධානය කරනු ලැබූ "ජාතික ඔරු පැදීමේ තරඟාවලිය - 2022" ඉකුත් ජූනි මස 3 සිට 5 දින දක්වා දියවන්නාව වැව් පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම තරඟාවලියේදී සුවිශේෂී දක්ෂතා දක්වමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩකයින් සමස්ත ශූරතාවය හිමිකර ගැනීමට සමත්වූයේ රන් පදක්කම් 10 ක්, රිදී පදක්කම් 8 ක් සහ ලෝකඩ පදක්කම් 4 ක් දිනාගනිමිනි. මේ අතර, රන් පදක්කම් 8 ක්, රිදී පදක්කම් 2 ක් සහ ලෝකඩ පදක්කමක් සතුකරගෙන එම තරඟාවලියේ කාන්තා ශූරතාවය දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා ක්‍රීඩිකාවෝ ද සමත් වූහ.

# යුද්ධ හමුදා පැරා - ක්‍රීඩා මේසපන්දු තරඟාවලිය






ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ මූලස්ථාන බලඇණිය විසින් සංවිධානය කරන ලද යුද්ධ හමුදා පැරා - ක්‍රීඩා මේසපන්දු තරඟාවලිය ඉකුත් ජූලි මස 12 දින පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාගාරයේ දී පවත්වන ලදී. මෙවර තරඟාවලිය සඳහා යුද්ධ හමුදා රෙජිමේන්තු හයක් නියෝජනය කරමින් තරඟකරුවන් සහභාගී වූ අතර, තියුණු තරඟයකින් අනතුරුව, විජයබාහු පාබල රෙජිමේන්තුවේ මූලස්ථාන බලඇණිය නියෝජනය කරමින් සහභාගී වූ ක්‍රීඩකයෝ තරඟාවලියේ ශූරතාව දිනාගත්හ. එම බලඇණියේ සැරයන් රුවන්තිලක දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය දිනාගැනීමට සමත්විය. තවද, ගජබා රෙජිමේන්තු මූලස්ථාන බලඇණිය අනුශූරතාවයද, ශ්‍රී ලංකා පාබල හමුදාවේ මූලස්ථාන බලඇණිය 2 වන අනුශූරතාවයද දිනාගැනීමට සමත්විය.

# යුද්ධ හමුදා පිහිනුම් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් තවත් පදක්කම් රැසක්



කොළඹ සුගතදාස ගෘහස්ථ පිහිනුම් තටාකයේදී ඉකුත් ජූනි මස 8 වන දින සිට 11 වන දින දක්වා පවත්වන ලද "46 වන ජාතික වයස් කාණ්ඩ පිහිනුම් ශූරතාවලිය 2022" තරඟාවලියේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිහිනුම් කණ්ඩායමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් රන්, රිදී සහ ලෝකඩ පදක්කම් රැසක් දිනාගැනීමට සමත් වූහ. මෙම තරඟාවලියේදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගජබා රෙජිමේන්තුවේ 2/ලුතිනන් එච්ඩීඒ පීරිස් මීටර් 50 පසුපස ආර තරඟ ඉසව්ව තත්පර 26.24 කින් නිමාකර ජාතික වාර්තාවක් ද පිහිටුවන ලදී. තවද, විවෘත පිරිමි අංශයේ හොඳම පිහිනුම් ක්‍රීඩකයා ලෙස රන් පදක්කම් 5 ක් සහ රිදී පදක්කම් 2 ක් හිමිකරගනිමින් 2 (ස්වෙච්ඡා) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සාමාන්‍ය සෙබළ ආර්පීඒ කරුණානායක දක්ෂතා දැක්වීය.

**වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ**
**ඔබ සියලු දෙනාට දිරිය, විරිය,රැකවරණය ලැබේවායි**
**"රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.**



යුද්ධ හමුදා මූලස්ථානයේ
යුධ සේවා ලේකම් ලෙස

**මේජර් ජෙනරාල්**
**ටීබීඑස්එන් බෝතොට**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**යූඑස්පී පීඑස්සී**

**2022 ජුලි මස 18 වන දින සිට**



65 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**ජේඩීබී එදිරිසිංහ පීඑස්සී**

**2022 ජුලි මස 01 වන දින සිට**



52 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**කේපීඑස්පී ප්‍රනාන්දු**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2022 ජුනි මස 20 වන දින සිට**



යුද්ධ හමුදා මූලස්ථානයේ
විධායක ජෙනරාල් ලෙස

**මේජර් ජෙනරාල්**
**එම්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී**
**වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී එන්ඩියූ පීඑස්සී**

**2022 ජුලි මස 20 වන දින සිට**



53 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එච්එම්යූ හේරත් ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**එච්ඩීඑම්සී**


**2022 ජුනි මස 17 වන දින සිට**



66 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**එස්ජේ ප්‍රියදර්ශණ ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී**

**2022 ජුනි මස 20 වන දින සිට**



පර්යේෂණ සංකල්ප හා මූලධර්ම
අධ්‍යක්ෂ මණ්ඩලයේ
අධ්‍යක්ෂක ලෙස

**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව්ඒ සෙනෙවිරත්න**
**යූඑස්පී පීඑස්සී**

**2022 ජුලි මස 19 වන දින සිට**



යුද්ධ හමුදා යුද විද්‍යාලයේ
සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**වයිඒබීඑම් යහම්පත්**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**

**2022 ජුලි මස 18 වන දින සිට**



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ
මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**එම්පීඑන්ජී මුතුමාල**
**යූඑස්පී පීඑස්සී**

**2022 ජුනි මස 15 වන දින සිට**



සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ
මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස

**බ්‍රිගේඩියර්**
**ටීඑම්ජී අඹන්පොල**

**2022 ජුනි මස 28 වන දින සිට**



122 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**කේඑම්එන් කුලසේකර**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**


**2022 ජුනි මස 28 වන දින සිට**



ආරක්ෂක සේනා (මුලතිව්)
බ්‍රිගේඩියර්
සම්බන්ධීකරණ (සෙවි) ලෙස

**බ්‍රිගේඩියර්**
**අයිඩීඩී ප්‍රනාන්දු**

**2022 ජුනි මස 15 වන දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ (සෙව්) ලෙස

**බ්‍රිගේඩියර්**
**එච්එම්එල්කේ අමුණුගම**

**2022 ජූලි මස 01 වන දින සිට**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස

**කර්නල්**
**එච්ඒඑම් ප්‍රේමරත්න පීඑස්සී එල්එස්සී**

**2022 ජූනි මස 29 වන දින සිට**



523 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**

**කේඒඑස්කේ සිරිවර්ධන**

**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

**2022 ජූනි මස 01 වන දින සිට**



572 වන පාබල බලසේනාධිපති ලෙස

**කර්නල්**
**එම්පීකේඑල් අමරසිංහ**
**ඩබ්ලිව්ඩබ්ලිව්වී**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 ජූනි මස 10 වන දින සිට**



58 වන පාබල සේනාංකයේ කර්නල් (ප්‍රමා) ලෙස

**කර්නල්**

**වයිඑම්එස්සීබී ජයතිලක**
**ආර්එස්පී යූඑස්පී**

**2022 ජූලි මස 02 වන දින සිට**



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස

**කර්නල්**
**යූවීඩබ්ලිව්එස් අමරසිරි**

**2022 ජූනි මස 13 වන දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ප්‍රධාන ශාඛාවේ කර්නල් ප්‍රධාන මාණ්ඩලික ලෙස

**කර්නල්**
**ජඩබ්ලිව්එම්ඩබ්ලිව්යේබී**
**අබේරත්න ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2022 ජූලි මස 11 වන දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) කර්නල් (පාලන/ගතාස) ලෙස

**කර්නල්**
**සී වඩුසිංහආරච්චි යූඑස්පී**

**2022 ජූලි මස 11 වන දින සිට**



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ලෙස

**කර්නල්**

**එල්ඒආර් ගුණරත්න**

**ආර්එස්පී යූඑස්පී අයිජී**

**2022 ජූලි මස 01 වන දින සිට**



ස්වාධීන ප්‍රවාහන බලගණයේ සේනාවිධායක ලෙස

**කර්නල්**

**ඩීඑස්එන් ජයවර්ධන පීඑස්සී**

**2022 ජූලි මස 11 වන දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) කර්නල් සම්බන්ධීකරණ (සෙව්) ලෙස

**කර්නල්**

**පීඒඑම් වික්‍රමසිංහ**

**2022 ජූනි මස 09 වන දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලෙස

**කර්නල්**

**ටීඑස්බීආර් ප්‍රනාන්දු**

**2022 ජූනි මස 19 වන දින සිට**



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමානි I ලෙස

**ලුතිනන් කර්නල් ආර්එම්එච්පීකේ රත්නායක**

**2022 ජූලි මස 11 වන දින සිට**



4(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂි හා පශු සම්පත් බලකායේ අණදෙන නිලධාරි ලෙස

**ලුතිනන් කර්නල් එම්එම්ඩීඑස්කේ බණ්ඩාර පීඑස්සී**

**2022 ජූනි මස 02 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ප්‍රමා 1 (සම්බන්ධීකරණ) ලෙස

**ලුතිනන් කර්නල් පීආර්ආර්කේඑස් ජයරත්න ආර්එස්පී පීඑස්සී අයිජී**

**2022 ජූලි මස 05 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) මාහි 1 (ගකාස) ලෙස

**ලුතිනන් කර්නල් ඩබ්ලිව්ඩීසීබී දිසානායක**

**2022 ජූලි මස 12 වන දින සිට**



6 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලෙස

**මේජර් කේඊඑච් වික්‍රමනායක ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2022 මැයි මස 31 වන දින සිට**



8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලෙස

**මේජර් ඊඊ ඒකනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී එල්එස්සී**

**2022 මැයි මස 27 වන දින සිට**



17 වන ගැමුණු හේවා බළඇණියේ අණදෙන නිලධාරි ලෙස

**මේජර් එම්එස්ඒ විජයදාස ආර්එස්පී පීඑස්සී**

**2022 ජූනි මස 02 වන දින සිට**



4 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ අණදෙන නිලධාරි ලෙස

**මේජර් කේඑන් ඉන්ද්‍රජිත් යූඑස්පී එල්එස්සී**

**2022 ජූලි මස 09 වන දින සිට**

# නිසට සෙවණක්



211 වන පාබල බලසේනාවේ හටපිරිස් විසින් මැදවච්චිය අගුනොච්චිය ප්‍රදේශයේ පදිංචි දෙදරු මවක් වන පී කුමුදුනී ශ්‍රියානි රත්නපාල මහත්මිය වෙනුවෙන් අභිනවයෙන් ඉදිකළ නිවසක් ඉකුත් ජූනි 20 වන දින 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්ඩබ්ලිව්කේඑන් ඊරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ 211 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්සීආර් විජයරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් භාරදෙනු ලැබුහ. මෙම නිවස ඉදිකිරීම සඳහා 2(සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ හටපිරිස් සහ 2 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තු හටපිරිස් ශ්‍රම දායකත්වය ලබාදුන් අතර, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පරිත්‍යාගශීලීන්ගේ මාර්ගයෙන් ඊට අවශ්‍ය ගෘහභාණ්ඩ ද්‍රව්‍ය සපයන ලැබුහ.

# හිතන්න වෙනවනෙ...

අළුත් විදුලි උපකරණයක් නිවසට රැගෙන ආ මහාචාර්යවරයා විස්තර පත්‍රිකාව කියවමින් එය සවි කිරීමට උත්සාහ කළ මුත් නිසි පරිදි සවි කිරීමට ඔහු සමත් වූයේ නැත. එහෙත් නිමේෂයක් ඇතුළත එය සවි කොට දැමීමට ඔහුගේ මෙහෙකරුවා සමත්විය.

"ඈ සිරිපාල... තමුසෙ කොහොමද මේ හපන්කම කළේ..." යි මහාචාර්යවරයා ඔහුගෙන් ප්‍රශ්න කළේය.

"ඇයි සර් මට කියන්න කරන්න බැනෙ... ඉතින් කියන්න බැරි වුණාම හිතන්න වෙනවනෙ"



# අළුත් ගෙදර...

ගැබිණි මව, පියා සහ තම එකම පුතු සමග කතා කරමින් සිටියේ පවුලට අළුතින් එකතු වීමට යන සාමාජිකයා ගැනය. "මම හිතන්නෙ අපි මීට වඩා ලොකු වෙන ගේකට ගියොත් හොඳයි කියල" යි මව යෝජනා කළාය.

ඊට පිළිතුරු දුන්නේ මඳ වේලාවක් කල්පනාවේ නිමග්නව සිටි කුඩා පුතුය. "ඒක හරියන්නෙ නෑ. එයා අපේ පස්සෙන් ඒවි"





# විවාහ සංවත්සරය...

සිය 10 වන විවාහ සංවත්සරයේදී එක් සැමියෙක් තම බිරිඳට මෙසේ කීවේය.

"ඔයා වඩාත්ම කැමති මින්ක් කබායක් ගන්නද එහෙම නැත්නම් විනෝද සවාරියකට ස්විඩනයට යන්නද?"

"අපි යමු ස්විඩනයට. ස්විඩනයෙ මින්ක් කබා බොහොම ලාබලු" යැයි බිරිඳ පිළිතුරු දුන්නාය.



# ගැලවීම...

**සුසන්ත** - මොකද බං උඹ ඔය ඇඹරි ඇඹරි ඉන්නෙ? මොකක්හරි ප්‍රශ්ණයක්ද?

**කමල්** - නෑ බං... මං අද උදේ ඔෆිස් එන්ඩ ෂර්ට් එකේ බොත්තං දානකොට එක බොත්තමක් කැඩුණ, බෑග් එක අතට ගන්නකොට බෑග් එකේ පටියක් කැඩුණා, දොර අරින්ඩ හදනකොට දොරේ ලොක් එක කැඩුණා, කාර් එකේ දොර අරිනකොට හැඬල් එක ගැලවිලා අතට ආව බං.

**සුසන්ත** - ඉතිං...

**කමල්** - ඉතිං බං... මං මේ මුත්‍රා කරන්ඩ බයේ ඉන්නේ.



# මරණය...

මධ්‍යසාර කම්හලේ සේවකයා විශාල බීර බැරලයකට වැටී ගිලී මියගියෙන් ඒ බව ඔහුගේ බිරිඳට දැන්වීම සඳහා එහි කළමණාකරුවා පිටත්විය. එම ශෝකී පුවත කන වැකීමත් සමග සේවකයාගේ බිරිඳ ඉකි ගසමින් හඬන්නට වූවාය.

"එයා ගොඩක් දුක් විඳලද මැරුණේ?" යැයි ඇය කළමණාකරුවාගෙන් අසා සිටියාය.

"එහෙමත් කියන්න බෑ... මොකද වැසිකිලි යන්න ඕන කමට එයා දෙපාරක්ම බැරල් එකෙන් එළියට ආව."

# දරු දැරියන් වෙනුවෙන් ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක්






55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්කේජ්‍යුපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ අදහසකට අනුව එම පාබල සේනාංක බලප්‍රදේශයේ දරු දැරියන් හට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීම වෙනුවෙන් වූ ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක් ඉකුත් ජූලි 16 වන දින එම පාබල සේනාංක මූලස්ථානයේදී ආරම්භ කෙරිණ.

55 වන පාබල සේනාංක බලප්‍රදේශයට අයත් කෙවිල් සහ කද්දෙයිකාඩු යන ගම්මානවල 6 වසරේ සිට 9 වසර දක්වා වූ ශ්‍රේණිවල අධ්‍යාපනය හදාරන දූ දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතාවයන් වර්ධනය කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව ආරම්භ කර ඇත. ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ඉංග්‍රීසි භාෂා උපදේශක කපිතාන් සුනෙත් රත්නායක විසින් මෙම පාඨමාලාව මෙහෙයවනු ලබයි.


# රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම
සෙ/752158 බනි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**ගුහ දිගුව**

51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය






**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
ජේපීපී ද සිල්වා ආර්එස්පී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආර්ඩබ්ලිව්පීජේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්එල්යූ ලක්මිකා

# අන්තර් රෙජිමේන්තු දැල්පන්දු කණ්ඩායම් ශූරතාවලිය - 2022

ඉකුත් ජූනි මස 22 සිට ජූනි මස 30 දක්වා කණ්ඩායම් හතක සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු අන්තර් රෙජිමේන්තු දැල්පන්දු කණ්ඩායම් ශූරතාවලිය - 2022 අවසන් මහා තරඟය ඉකුත් ජූනි 30 වන දින පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී පැවත්විණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගි විය.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ "ඒ" කණ්ඩායම සහ "බී" කණ්ඩායම අවසන් මහා තරඟයට සුදුසුකම් ලැබූ අතර, එහිදී කණ්ඩායම් දෙක අතර පැවති ඉතා උණුසුම් තරඟයකින් පසුව 21/15 ක් ලෙස ලකුණු ලබාගනිමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ "ඒ" කණ්ඩායම එහි ශූරතාවයට හිමිකම් කියූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ "බී" කණ්ඩායම එහි අනුශූරතාවයත් ශ්‍රී ලංකා සංඥා බලකා කණ්ඩායම දෙවන අනුශූරතාවයත් දිනාගත්හ.



සමස්ත තරඟාවලියේ දක්ෂතා දැක්වූ සියලුම අංශවල ක්‍රීඩිකාවන් වෙත කුසලාන ප්‍රදානය කිරීමේ අවස්ථාවට යුද්ධ හමුදාධිපති සමගින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියද එක්වූහ.



අවසන් මහා තරඟාවලිය නැරඹීම සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක, ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති, යුද්ධ හමුදා දැල්පන්දු කමිටුවේ සභාපති බ්‍රිගේඩියර් සීඑස් තිබ්බොටුගේ ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද සහභාගී වූහ.






# ඔබ වෙනුවෙන්, රට වෙනුවෙන් මේ දුෂ්කර මොහොතේ අතැර නොයන හිතවත්කම...

හමුදාවට අභියෝග එන්නෙ පෙර දැනුම්දීම් කරල නෙවෙයි. ඒ කුමන අවස්ථාවකදීවත් පස්ස ගහන්න, කල්ගන්න වෙලාවක් නැහැ. රට සහ ජනතාව වෙනුවෙන් ක්ෂණිකව වුනත් නිවැරදි ක්‍රියාමාර්ග ගන්න වෙනව. වර්තමානයේ හමුදාව නිරතවෙලා ඉන්නෙ එහෙම මෙහෙවරක. රණවිරුවන්ගේ මේ අප්‍රමාණ කැපවීම ජනතාවගේ හා රටේ අසීමිත ආරක්ෂාව සඳහාමයි.